# හැත්තෑ එකේ කැරැල්ල

විද්‍යා ප්‍රබන්ධ



සඳරුවන් පනාකඩුව

# වර්තමාන විස්තරය

ගොම්මන් හිරු ලා රතු පාටින් ඈත කඳු අතර ගිලී යමින් පැවතුණි. බැස යන හිරුගේ චණ්ඩ බව මේ වන විට බොහෝ සෙයින් අඩු වී තිබූ අතර අවට තිබූ වලාකුලුද හිරුගේ ලා රත් පැහැය තමන්ගේ කර ගැනීමට උත්සාහ කළෝය.

මලානික හිරු කිරණ ගොම මැටි ගෑ එළිපත්තට වැටී සංකීර්ණ රටා මැවීය. පාසල් යන වයසේ පසුවූ අවුරුදු අටක් පමණ විය හැකියයි සිතුණු කුඩා පිරිමි දරුවකු එළිපත්ත මත බිම හිඳගෙන ගල්කුරකින් අකුරු ලියනු දක්නට ලැබිණ. ඔහුගේ වටිනා කියන සෙල්ලම් බඩු, එනම් රබර් ඇට, කුරුලු පිහාටු මෙන්ම කුරුම්බැට්ටි මැසිම හා කැටපෝල පසෙකට වී තමන්ගේ වාරය එලඹෙන තුරු නිසොල්මනේ බලා සිටියහ.

එහෙත් කුඩා දරුවා සිටියේ අකුරු ඉලක්කම් ගැන සිහියෙනි. ගල්ලැල්ල මත ලියවුණු වැරදුණු ඉලක්කම් තම අත්ලෙන් මකා දමූ ඔහු තමන් හැඳ සිටි සායම් ගිය කලිසමේම අත පිසදා දැමුවේය. බැස යන හිරු ක්ෂිතිජයට ආසන්නව කන්ද මුදුනේ සිට කුඩා දරුවා දෙස මඳ සිනාමුසුව බැලීය. කෙලින්ම මුහුණට වැටුණු හිරු කිරණ නිසා අපහසුවට පත්වුණු ඔහු අතපය හිරි ඇර ගනිමින් හුන් තැනින් නැගිට්ටේ ය.

''අනේ සීයේ, මම දැන් ගොඩක් පාඩම් වැඩ කළානේ. දැන් ඇති''

ඔහු පැවසුවේ පිල මත වාඩි වී බුලත් විටක් කොටමින් සිටි තම සීයා දෙස බලමිනි. සීයා දුඹුරු පැහැති බතික් සරමක් හැඳ උඩුකය මේස් බැනියමකින් වසාගෙන සිටියේ ය. දින කිහිපයකින් නොකැපූ ඔහුගේ සම්පූර්ණයෙන් ම පාහේ සුදු වූ රැවුල හිසේ ඉතිරි වී තිබූ සීමිත කෙස් ප්‍රමාණය හා එක්ව නියම සීයා කෙනෙකුගේ පෙනුම ගෙන ආවේ ය. කුකුල් සායම් යොදා රටා මවා තිබූ පත් පැදුර පිල මතට වී සීයාගේ සිරුරට සුවපහසුව සැලසුවේ ය. වසර කිහිපයකට පෙර මෙලොවින් සමුගත් සිය ඇඹේනිය සිහි කිරීමට ඔහුට ඉතිරි වී තිබුණේ එම සිහිවටනය පමණි.

හුණු, දුම්කොල, පුවක් හා බුලත් කොල සියල්ල කුඩා බුලත් වංගෙඩිය තුලට ගොස් කහට පැහැති පල්පයක් බවට පත්විය. සීයාගේ දත් කිහිපයක් හැලී ගොස් තිබූ බැවින් බුලත් විට කෑම සඳහා වංගෙඩිය නැතිවම බැරි උපකරණයකි.

මුණුබුරාගේ වදන් සවනට වැටුණු ඔහු හිස ඔසවා මුණුබුරා දෙස විමර්ශනාත්මක බැල්මක් හෙලුවේ ය. අනතුරුව යලි හිස නවා පුරුදු ලෙසින් ම බුලත් විට කෙටීමට පටන් ගත්තේ ය.

''කමක් නෑ පුතා. දැන් ගොඩක් වෙලා ඉස්කෝලෙ වැඩ කළානේ ''

සීයා බුලත් හපය කටේ ලාගෙන වංගෙඩිය පසෙකින් තබමින් පැවසුවේය. මේ අතර කඩුල්ල දෙසින් පැමිණෙමින් සිටි කිසිවෙක් දෙසට දෙදෙනාගේම අවධානය යොමු විය.

''අන්න තාත්තා එනවා.''

කියමින් කුඩා දරුවා එළිපත්තෙන් මිදුලට පැන කඩුල්ල තෙක් දිව ගියෝ කුඹුරු වැඩ අවසන් කර නිවසට පැමිණෙන සිය පියා පිළිගැනීමටය. පියා පැමිණ තිබුණේ හිස් අතින් නොවේ. ඔහු මල්ලක් පිරෙන්නට හිඹුටු, මාදං හා වෙරළු රැගෙන විත් තිබුණි. එයින් මහත් ප්‍රීතියට පත් කුඩා දරුවා සිය පියාගේ අතේ එල්ලීගෙනම නිවසට ගොඩ වැදුණේය.

''මේ පාර නම් අහසේ වතුර ගැන විස්වාසයක් තියල ගොවිතැන් කරන්න බෑ තාත්තේ. පොඩි හරි වැහි රැල්ලක් වැටුනෙ නැත්නම් ඊළඟ කන්නෙ අල බතල තමයි කන්න වෙන්නේ ''

ඩිංගි පැවසුවේ කරේ තිබුණ උදැල්ල පසෙකින් තබා එළිපත්තේ තිබූ බංකුවක වාඩිවෙමිනි. ඩිංගි යනු කුඩා දරුවාගේ පියා ය. නැතහොත් සීයාගේ පුතා ය.

''හන්දියේ මිනිස්සු කතා වෙනව මං අහගෙන හිටියා මේ පාර ආණ්ඩුවෙන් මුද්දර කාඩ් එකක් දෙන්න යනවලු හාල්, පොල්, සිල්ලර ටික සමූපකාරෙන් ගන්න.''

සීයා පිළිතුරු දුන්නේ ය. ඔහු සෑම දිනකම උදෑසනට කඩ මණ්ඩියට ගොස් රටේ තොටේ විස්තර බලා සොයාගෙන එයි. ප්‍රවෘත්ති දැන ගැනීමට ඔවුන්ට ඒ හැර වෙනත් ක්‍රමයක් නොතිබුණි.

''ඔය ආණ්ඩුව දෙනවයි කියන සහනාධාර ගැන ඉස්තිරේටම විස්වාසයක් තියන්න බෑ තාත්තෙ. ගිය පාරත් මතක ද පෝර ටික නොමිලෙ දෙනවයි කිව්වට අන්තිමට සල්ලි දීල ගන්නවත් පෝර නැති වුණානේ. මගේ අතේ පයේ හයිහත්තිය ගැන විතරයි මං විශ්වාස කොරන්නේ''

ඩිංගි පිළිතුරු දුන්නේ ඒ වන විට අඳුරු රත් පැහැයට හැරී තිබූ බැස යන හිරු මඬල දෙස බලා සිටිමිනි. එළිපත්තේ සිදුවූ කතා බහ කන වැටුණු සුදු හාමිනේ, එනම් ඩිංගිගේ බිරිඳ කුස්සියේ සිට පැමිණ උලුවස්සට හේත්තු වී ඔවුන් දෙස බැලුවාය. ඇය හැඳ සිටි සායේ දූලි තැවරීම වළක්වාලීම සඳහා ඊට උඩින් චීත්ත රෙද්දක් පටලවාගෙන සිටියාය.

''පුතාගේ තාත්ත අද වේලාසනින් ම ඇවිත් තියෙන්නේ.'' ඇය විමසුවේ සතුටු සිනාවක් මුවගට නගා ගනිමිනි. ඩිංගි හිස ඔසවා ඇය දෙස බලා මඳ සිනහවක් පළ කළේය.

''අද මම කෙලින්ම ගෙදරමයි ආවෙ. පහල ලියැද්දෙ මහතුන් කතා කොළා කිතුල පැත්තෙ ගෙහුං එන්න. මට කම්මැලි හිතුන බං'' ඩිංගි පැවසුවේ ය.

''එහෙනම් ඉරටත් හැමදාම නැගෙනහිරින් පායන්න කම්මැලි හිතේවි. මෙයාට කවදාවත් නැතිව කිතුලට යන්න කම්මැලි හිතිලා'' සුදූ හාමිනේ පැවසුවේ ඩිංගි දෙස බලා ඉඟි කරමිනි.

''ඔය බුලත් තට්ටුව අරන් දීපල්ලකො'' ඩිංගි සුදූ හාමිනේට කියා බුලත් තට්ටුව ගෙන විඩක් කෑමට කල්පනා කලේය.

''පොඩ්ඩක් බුලත්විට නොකා හිටපල්ල. බෙලිමල් ටිකක් තම්බල තියෙන්නෙ. මම හකුරු කෑල්ලකුත් ඒකක අරං එන්නම්'' ඇය වහා ගෙතුලට ගියේ බෙලිමල් රැගෙන ඒමට ය. කුඩා දරුවා පිල මතට නැග සීයාගේ පසෙකින් වාඩි විය.

''සීයේ, මට කතාවක් කියලා දෙන්නකෝ'' ඔහු සීයාට ඇවිටිලි කළේය.

''හැමදාම කියන ඉබ්බගෙයි හාවගෙයි කතා නම් එපා. අද අලුත්ම කතාවක් කියන්න.'' ඔහු නැවතත් පැවසුවේ ය.

''එහෙනම් මම රජකාලෙ කතාවක් කියන්න ද?'' සීයා යෝජනා කළේය.

''අන්දරේගෙ කතාවක් පුතා අහල තියෙනව ද? අන්දරේ රජ මාලිගාවේ සීනි කාපු හැටි ? '' කුඩා දරුවා මුහුණ ඇඹුල් කර ගත්තේය.

''අනේ සීයේ, ඔය රජ කතා මට හරියන්නේ නෑ. අද අපේ ටීචර් කිව්වා මොකක් හරි විප්ලවයක් ගැන, ඒකෙන් ලොකු විනාශයක් වුණා කිව්වා. ඒ මොකක්ද සීයේ විප්ලවය කියන්නේ ?'' කුඩා දරුවා සීයාගේ මුහුණ දෙස බලා විමසුවේය.

''අන්න හරි තාත්තේ. අපිට නම් ඔය විප්ලවය ගැන මතකයක් නෑනේ. අපිටත් දැන ගන්නත් එක්ක විප්ලවය ගැන ටිකක් කියා දෙන්නකෝ'' ඩිංගි ද මෙහිදී හඬ අවදි කළේය. සුදූ හාමිනේ මේ වන විට බෙලිමල් වක්කර ගෙන ඇවිදින් තිබුණාය.

''නෑ නෑ, ඔය විප්ලව ගැනයි මිනී මරපුව ගැනයි ඒව මේව නම් පොඩි එකාගෙ ඔලුවට දාන්න ඕනි නෑ.'' මේ වන විට සියලුදෙනාටම බෙලි මල් රැගෙන පැමිණ තිබුණු සුදුහාමිනේ පැවසුවාය.

''ඔය ඕනතරම් කතන්දර තියෙන්නෙ පුංචි එවුන්ගෙ ඔලුවට ගැළපෙන'' ඇය වැඩිදුරටත් කීවාය.

''එහෙන්ම ඉතින් මේ රටේ ඉතිහාසයක් මේ දරුවට කියල දෙන්න බැරි වෙනවා. මොකද අපේ ඉතිහාසයේ ම තියෙන්නේ යුද්ධ කරපුවයි මරා ගැනිල්ලයි නේ.'' ඩිංගි ද මෙහි දී අදහසක් එකතු කළේය.

''මෙහෙමයි, මේ දරුවට දූන් යන්තමට දෙයක් තේරෙනවනේ. අනාගතේ ඒ වගේ විපතක් නොවෙන තැනට වැඩ කටයුතු සිද්ධ කර ගන්න නම් දූන් ඉඳලම දරුවන්ට ඒ දේවල් වල බරපතලකම කියල දෙන්න ඕනි. මොකද මේ කාලේ දී තමයි මෙයාලගේ මනස හරි විදියට හැඩගස්වන්න පුළුවන්. ඉදිරියේ දී ආපසු ඒ වගේ මහා විනාශ නොවෙන්න අපි දූන් ඉඳලම හරි වැරැද්ද මොකක් ද කියල දෙන්න ඕනි.'' සීයා මෙහි දී පැහැදිලි කළේය.

''කෝ ඉතින් ඔයාලා මෙතන වාද විවාද කර කර ඉන්නව විතරයිනේ'' කුඩා දරුවා සීයාගේ අතින් අල්ලා අදිමින් පැවසුවේය.

''ඒ භයානක දවස්වල වෙච්ච දේවල් මට අද වගේ මතකයි. ඒ කාලෙ මම හොඳ තරුණ කොල්ලා. මම ජීවිතේ බේරගත්තෙත් බොහොම අමාරුවෙන්'' සීයා මුල පිරුවේය.

''පුතාට මම කියලා දෙන්නම් ඉස්සෙල්ලම විප්ලවයක් කියන්නේ මොනවගේ දෙයක් ද කියලා. විප්ලවයක් කියන්නේ වෙනසක්. සාමාන්‍යයෙන් පවතින විදිය ලොකුවට වෙනස් කරනවා. මේකට සමහර අය අකමැති වෙන්න පුළුවන්, කැමති අයත් ඉන්න පුළුවන්''

''ඒ කියන්නෙ සීයේ, විප්ලවයකට හැමෝම එකතු වෙන්නෙ නැද්ද?'' කුඩා දරුවා විමසුවේය.

''විප්ලවයකට හැමෝම එකතු වෙන්නෙ නෑ. දූනට පවතින ක්‍රමයට කැමති පිරිසක් ඉන්නවා. ඒකට අකමැති පිරිසක් එයාලට ඕනි විදියට බලෙන් තියන තත්ත්වය වෙනස් කරනවා. අන්න ඒක විප්ලවයක් කියලා කියන්න පුළුවන්.''

''පුතා ඉතිහාසය ඉගෙන ගත්ත දවසක දූන ගන්න ලැබේවි, රුසියාවේ ලෙනින් කියල කෙනෙක් විප්ලවයක් කරල ආණ්ඩු පෙරලියක් කලා. කියුබාවෙ පිදෙස් කැස්ත්‍රෝ. මේ වගේ විප්ලව රාශියක් ඉස්සරත් වෙලා තියෙනවා.''

''ඒ වගේ විප්ලව ගොඩක් ඒවායින් මිනිස්සු ගොඩක් මැරුනත් අන්තිමේ දී ඒ රටවලට යහපතක් වුණා සමාජවාදී දේශපාලනයක් එක්ක. ඒත් එය හැත්ත එකේ සහ අසූ නවයේ විප්ලව වලින් නම් විනාසයක් විතරයි වුණේ. ඒව එකක්වත් සාර්ථක වුණේ නෑ. සාර්ථක වුණා නම් මොන වගේ විනාශයක් වෙයි ද කියලා හිතාගන්නවත් බෑ. කොහොම හරි ඒ කාලෙ තිබුණු ආණ්ඩුවලට පුළුවන් වුනා ඒ විප්ලව වාදියෝ පරාද කරල දාන්න.

වැඩිම විනාශයක් වුනේ අසූ නවයේ කැරැල්ලෙ දී. ඒකෙන් වෙච්ච හානිය අදටත් ගණනය කරන්න බෑ. එතකොට මගේ තරුණ කාලෙ අපි මෙහෙම නෙවෙයි හිටියෙ. ලොකු ගෙදරක, යාන වාහන තියාගෙන බොහොම සුපිරි පැලැන්තියෙ ජීවිතයක් තමයි ගත කලේ. ඒ හැමදේම නැති වුනා. එදා කරගෙන ආපු සංවර්ධනය මුළුමනින් ම අඩාල වෙලා රටේ ලෝකෙ දියුණුවට එකතු වෙන්න තිබුණු තරුණ ජීවිත සෑහෙන ගානක් මේ කාලකන්නි විප්ලවයක් නිසා අපට අහිමි වුණා. එයාල හැදුවෙ ආණ්ඩු බලය අල්ලගෙන එයාලට ඕනි විදියෙ පාලනයක් අරන් යන්න. ඒත් අපේ වීරයෝ ජීවිත පූජාවෙන් විප්ලවය පරාජය කළා.

හැත්ත එකේ දී පළමුවැනි විප්ලවය අසාර්ථක වුණු වෙලාවේ. ඒ කාලෙ හිටපු උගත් බුද්ධිමත් අය කියල තියෙනවා ඔය විප්ලවය කරපු අය ගැන හොයලා ආයෙ ඔලුව උස්සන්න බැරි වෙන්න මර්දනය කරන්න කියලා. ඒත් ඒ කාලෙ පාලකයො ඒ විප්ලවකාරයන්ව බොහොම සුළුවට තමයි ගණන් අරන් තියෙන්නෙ. අන්තිමට උන් සේරම හොර රහසෙ සංවිධානය වෙලා අසූ නවයෙදී මදි නොකියන්න පහර දුන්නා.

අද අපි මේ පත්වෙලා ඉන්න නොදියුණු තත්ත්වයට ඔය විප්ලවාදියො තමයි වගකින්න ඕනි. උන් හිතක් පපුවක් තියන අපි වාගේ මිනිස්සු නෙවෙයි. මහා අමනුස්සයො රැලක්. හැබැයි ආණ්ඩුවෙත් වැරැද්දක් තියෙනවා. මොකද ඔය විප්ලවය ගැන මුලින්ම දැන ගත්ත හැත්ත එකේදීම මේ ගැන හොයල බලල ඕකුන්ව ඉවරයක් කළා නම් අද තියෙන්න තිබුණ සංවර්ධනය ගැන පුතාට හිතාගන්නවත් බැරි වෙයි.'' සීයා පැවසුවේය.

# වසර 2070 දී

උදෑසන එලාම් නාදයට අවදිවූ කෙවින් සයනය මත වාඩිවී කම්මැලිකමින් නිදි ගැට කඩා දෑස් කෙවෙනි පිසදැමුවේය. මොහොතකින් කාමරය වර්ණවත් ආලෝකයකින් ආලෝකමත් විය.

''ගුඩ් මෝනින් කුකී'' කෙවින් කුකීට සුභපැතුවේ නිදිමතින්මය.

''ගුඩ් මෝනින් කෙවින්, ඊයෙ ය වෙනකම් ෆිල්ම් බලපු නිසා තාමත් නිදිමතයි වගේ'' ඇය විමසුවාය. එහෙත් ඊට පිළිතුරක් නොදුන් කෙවින් ඇඳෙන් බැස ගත්තේ කිසියම් කල්පනාවක නිරත වෙමිනි. එහෙත් මෙහිදී කුකී නැවත ඔහු බාධා කලාය.

''කෙවින් මොනවද බොන්නේ ? තේ, කෝපි, කැපුචිනෝ, නැත්නම් ඔයාගෙ ආසම කිරිතේ ?'' ඇය විමසුවාය.

''එහෙනම් කිරි තේ එකක් හදන්නකෝ. තව විනාඩි දහයකින් විතර මම මූණ සෝදගෙන ආවට පස්සේ.'' පවසමින් කෙවින් තුවායද ඇඟලාගෙන නාන කාමරය තුලට පිය මැන්නේය. ඇඳුම් උනා පසෙක තැබූ ඔහු කොමඩ් එක මත හිඳ ගත්තේ ය.

''කුකී මොනවද මට අද තියෙන ඇපොයින්මන්ට්ස් ?'' ඔහු විමසුවේය. කුකී යනු කෙවින්ගේ පරිගණක පෞද්ගලික සහායිකාවය. ඇය ඉතා හොඳින් වැඩසටහන් ගත කර ඇති අතර රාමුව තුල ඕනෑම දෙයක් සොයා බලා කිරීමට ඇය සමත්ය. එහෙත් ඇය සිත් පිත් නැති හුදු පරිගණක යෙදවුමක්ම පමණි.

''කෙවින් ඔයාට හවස දෙකට මිසිස් ජෙනිෆර්ගෙ ලෙක්චර් එකක් තියෙනවා නෙට්වර්කිං ගැන. ඒක හවස පහට ඉවරයි.'' කුකී මතක් කළාය.

''හරි මම ඒක කන්ෆර්ම් කරනවා. තව මොනව ද තියෙන්නේ ?''

''මිස් ක්ලෝඩියා ඔයාට එයාගෙ බර්ත් ඩේ පාර්ටි එකට ඉන්වයිට් කරල තියෙනවා. හවස පහයි තිහට යුනිවර්සිටි එකේ ස්ටාර්බක්ස් කොෆී එකේ තමයි තියෙන්නේ'' ඇය වැඩිදුරටත් කීවා ය.

''ඕකේ, ඒකත් මම කන්ෆර්ම් කරනවා. කුකී, මට රිමයින්ඩර් එකක් දෙන්න දවල් දොලහ හමාරට, ෆැන්සි ෂොප් එකෙන් ක්ලෝඩියාට ප්‍රසන්ට් එකක් ගන්න.'' කෙවින් කුකීට දැන්විය.

''ඕකේ කෙවින්, මම හරියට ම දොලහයි තිහට ඔයාට මතක් කරන්නම්. අද දවසෙ ඔයාගෙ යාලුවො හය දෙනෙකුගේ උපන්දින යෙදිල තියෙනවා. මම එකින් එක කියන්නද? '' කුකී නැවතත් විමසුවාය. කෙවින් ඒ වන විට නාන කාමරයේ කන්ණාඩිය

ඉදිරිපිටට පැමිණ දත් මැදීමට පටන් ගෙන තිබුණි. ඔහු දත් මදින විට ඔහුගේ දත් ක්‍රම ක්‍රමයෙන් පිරිසිදු වන ආකාරය කණ්නාඩිය මත ඇති තිරයකින් පෙන්වීය.

''උපන්දින බලන්න වෙලාව මදි. ඔයා මම වෙනුවෙන් එයාලට විෂ් කරලා මැසේජස් දාන්න. ආ .... මට අමතක වුනා. මට මොනව හරි අලුත් මැසේජස් තියනව ද?'' කෙවින් විමසුවේ දත් මැදීමේ ප්‍රමාණය තිරය මතින් නරඹමිනි.

''නෑ කෙවින්, අලුත් මැසේජස් නෑ. ඔයාගෙ යාලුවන්ට මම ඔයා වෙනුවෙන් සුභ පතන්නම්'' කුකී පැවසුවාය.

''කෙවින් ඔයාගෙ හෙල්ත් රිපෝට් එක පෙන්වන්න ද?'' ඇය නැවතත් විමසුවාය.

''ඕ කේ.''

''කොමඩ් එකේ යූරින් සෙන්සර් එකට අනුව පසුගිය මාස හය ඇතුලත ඔයාගෙ මූත්‍ර වල සීනි ඒකක හතරක විතර සාමාන්‍යයකින් වැඩිවෙලා තියෙනවා. මේ විදියට ගියොත් තව අවුරුද්දක් යන කොට ඔයාගෙ රුධිරගත සීනි අනවශ්‍ය ප්‍රමාණයට ඉහල යන්න පුළුවන්. සීනි කෑම ටිකක් අඩු කලොත් හොඳයි. ''

ඔයාගෙ හදවත ගැහෙන වේගය, රුධිර පීඩනය, ප්‍රාශ්වාස වාතය, මලපහ මේ ඔක්කොම සාමාන්‍ය මට්ටම්වල තියනවා. දන්ත සෞඛ්‍යයත් හොඳයි. හැබැයි සාමාන්‍ය ශරීර බර නම් ග්‍රෑම් පන්සීයක් විතර පසුගිය අවුරුද්දට වැඩි වෙලා තියෙනවා. ඒක එච්චර ප්‍රශ්නයක් නෑ.'' කුකී දිගටම විස්තර කළාය.

''මට ආයෙ කවද්ද ඕවරෝල් හෙල්ත් ටෙස්ට් එක තියෙන්නේ ?'' කෙවින් නැවත විමසුවේය.

''ලබන මාසෙ දහ වෙනිදා ඔයාට ඕවරෝල් හෙල්ත් ටෙස්ට් එක යෙදිල තියෙනවා. ගිය සැරේ ඔයා වෙලාව මදි කියලා කැන්සර් ටෙස්ට් එක කරගෙන නෑ. මේ සැරේ මතක් කරලා ඒක කරගන්න.'' කුකී උපදෙස් දුන්නා ය.

''අද දවසෙ අලුත් නිවුස් මොනවාද කුකී ?'' කෙවින් විමසීය. එවිට නාන කාමරයේ කණ්නාඩිය තැනෙකින් දීප්තිමත් තිරයක් බවට පත් විය. රටේ තොරතුරු පුවත් මෙන් ම ක්‍රීඩා තොරතුරු ඕපාදූප ඇය ඔහු වෙනුවෙන් ඉදිරිපත් කළාය.

''ඕකේ කුකී, මම නාගෙන එනකොට තේ එක හදල තියන්න. '' කියමින් කෙවින් ෂවර් එක වෙතට ගියේ ය. ඔහුගේ මල්ටි බෙවරේජ් මේකර් යන්ත්‍රය වැඩ පටන් ගෙන තිබුණේ කෙවින්ට රසවත් කිරි තේ එකක් සාදා දීම සඳහාය. තේ පානයෙන් අනතුරුව මනාව හැඳ පැලඳ ගත් කෙවින් ඔහුගේ ක්ලිප් එක අතට ගෙන දිග හැරියේය.

ක්ලිප් එක යනු අතීතයේ පැවති ස්මාර්ට් ජංගම දූරකථනයේ හා ටැබ් එකේ වර්තමාන පරිනාමන අදියර වේ. ජංගම දූකරථනයෙන් ස්මාර්ට් දූරකථනයටත් ඉන් ටැබ් එකටත් ව ු පරිනාමණය දූන් ක්ලිප් එකක් බවට පත්වී තිබේ.

ක්ලිප් එක දිග හැර ඇති විට සාමාන්‍ය ටැබ් එකකි. එය දිග අතට හැකිලිය හැකිය. එවිට එය අඟල් එක හමාරක් පමණ පළල අඟල් හයක් පමණ දිග හීනි පටියක් බවට පත්වේ. මෙම පටිය දෙකට නැවිය හැකිය. එවිට එය කුඩා ජංගම දූරකථනයක් ලෙස භාවිතා කල හැකි අතර කලිසම් සාක්කුවේ ඉන පටියේ හෝ කමිස සාක්කුවේ පැලදිය හැක. මෙසේ එය ක්ලිප් එකක ස්වරූපයක් ගත් බැවින් එය පොදුවේ ක්ලිප් එක යනුවෙන් හැඳින්වුව ද කෙවින් භාවිතා කරන එහි නූතනම සංස්කරණය ඊට අමතරව රෝල් කර අත් පලඳනාවක් ලෙස මැණික් කටුවේ පැලඳිය හැක. එමෙන් ම එහි තිරය ඇස් කණ්නාඩියට ලබා ගත හැකි ය.

ක්ලිප් එකේ තිරය ක්‍රියාත්මක කල කෙවින් ඔහුගේ බැංකු ගිණුම වෙත පිවිස එහි වූ ගනුදෙනු පිරික්සා බැලුවේ ය. ඔහුගේ අර්ධ කාලීන රැකියාවෙන් ලද මුදල සිය වියහියදම් සඳහා ප්‍රමාණවත් නොවූ බැවින් කෙවින්ගේ මව සෑම මසකම ඔහුට මුදලක් එවීම පුරුද්දක්ව තිබුණි. මෙවර ද ඇය කෙවින්ගේ ගිණුමට මුදල් බැර කර තිබුණි. මේ වන විට භෞතික මුදල් භාවිතයක් නොතිබුණු අතර සියලුම ගණදෙනු අන්තර්ජාල ගතව පැවතුනි.

අනතුරුව කෙවින් සිය අපාර්ට්මන්ට් එකෙන් පිට විය. නිව්යෝක් නගරයේ අති විශාල තට්ටු නිවාස පද්ධතියක විසිවන තට්ටුවේ කුඩා අපාර්ට්මන්ට් එකක ජීවත් වූ කෙවින් වාසය සඳහා එතැන තෝරා ගත්තේ එතැන් සිට ඔහුගේ විශ්ව විද්‍යාලයට පහසුවෙන් යා හැකි වීම නිසා ය.

කෙවින් අපාර්ට්මන්ට් එකෙන් පිට වෙනවාත් සමඟ ම නිවසේ සියලුම දොර ජනෙල් වැසී ගිය අතර විදුලි ආලෝකය මෙන් ම අනවශ්‍ය විදුලි උපකරණ ද සියල්ල ක්‍රියාවිරහිත විය.

විදුලි සෝපානය දිගේ කෙවින් කෙලින්ම ගියේ රථ ගාලටය. එම රථ ගාලේ මෝටර් රථ ගාල් වන තට්ටු පිහිටියේ රථවාහන ඇතුල් වන හා පිටවන බිම් මහලේ සිට පොළව යටට වන්නට ය. එම පොළව යට පිහිටි රථවාහන ගාල් කරන තට්ටු වලට මිනිසුන්ට හා නොහැකි වූ අතර අදාල රථ ගාලට ඇතුළු වී අප රථයෙන් බැස ගිය පසු රථය ස්වයංක්‍රීයව ගොස් රථ ගාලේ ඇති ස්වයංක්‍රීය යාන්ත්‍රණයක් මගින් පොළව යට ගබඩාවක තැන්පත් වේ. අපහට නැවත රථය අවශ්‍ය වූ විට අප රථ ගාලට පැමිණ ඇනවුම් කළ පසු ස්වයංක්‍රීයව රථය අප අසලට පැමිණේ.

බොහෝ දෙනා කාර්යාල වලට යාම සඳහා පැමිණෙන බැවින් මෙම වේලාවට මඳ තදබදයක් තිබේ. රථ පෙළින් පෙළට පැමිණෙන විට තම රථය පැමිණෙන තෙක් විනාඩි තුන හතරක් පෝලිමේ රැඳී සිටීමට සිදුවේ. සිය රථයට ගොඩවූ කෙවින්ට කුකී සුභ පැතුවාය.

''ආයෙමත් සැරයක් සුභ දවසක් ප්‍රාර්ථනා කරනවා කෙවින්. අපි වෙනදා වගේ ම යුනිවර්සිටි එකට නේද යන්නේ ?'' ඇය විමසුවා ය.

''ඔව් කුකී, අපි බර්ගර් හට් එකට ගිහින් උදේ කෑම එකකුත් අරගෙන යුනිවර්සිටි එකට යමු.'' රථය රථ ගාලෙන් එලියට පැමිණ පිවිසුම් මාර්ගය ඔස්සේ ගොස් අධිවේගී මාර්ගයට ඇතුළු විය. මේ වන විට මෝටර් රථ සියල්ලම ධාවනය වූයේ විදුලියෙනි.

එමෙන්ම ඒවාට රියදුරෙක් අවශ්‍ය නොවීය. මධ්‍යගත සමාජ ජාල පද්ධතිය හා චන්ද්‍රිකා තාක්‍ෂණය මෙන්ම රේඩාර් තාක්‍ෂණය වැනි සංකීර්ණ තාක්‍ෂණික පසුබිමක් මගින් සියලුම වාහන එකිනෙක අතර අන්තර් සන්නිවේදනයෙන් ධාවනය වූ අතර සාමාන්‍ය අතුරු මාර්ගයක පවා පැයට කිලෝමීටර් අසූවක සීයක පමණ වේගයකින් රථවාහන ධාවනය වූයේ ය.

සියලුම මාර්ග වැටවල් ගසා වෙන් කොට තිබූ අතර එම පාරවල් වල මිනිසුන්ට ගමන් කිරීම තහනම් වූයේ වැටට මෙපිටින් දිගට ම පදික වේදිකා තිබූ බැවිනි. පිවිසුම් මාර්ග හා අධිවේගී මාර්ග වලට ඇතුළු වීමට හා පිටවීමට විශේෂ ස්වයංක්‍රීය ගේට්ටු තිබුණි. එමෙන් ම නගරාන්තර අධිවේගී මාර්ග වල රථවාහන ධාවනය වූයේ පැයට කිලෝමීටර් දෙසිය පනහක තුන්සියයක පමණ අධික වේගයකිනි.

සියලුම වාහන එකම පද්ධතියක් මගින් ධාවනය වීම නිසා අතිශය අවම මාර්ග අනතුරු ප්‍රමාණයක් වාර්තා වූ අතර රථවාහන වලට ද ඉතා අධික වේගයකින් ගමන් කිරීමට හැකි වී තිබුණි.

කෙවින් රථයෙන් යන අතරතුර ම බර්ගර් හට් එකෙන් උදෑසන ආහාර වේලක් සහ සිසිල් බීම එකක් ඇනවුම් කලේ ය. බර්ගර් හට් ඩ්‍රයිව් ත්‍රෲ එක හරහා යන අතරතුර කෙවින්ගේ වාහනයට ඔහු ඇනවුම් කල ආහාර පාර්සලය ලබා දෙන ලදී.

මේ වන විට ලෝකයේ ගෝලීයකරණය එහි උපරිමයට ලඟා වී තිබුණි. ගෝලීය විශ්ව ගම්මානය යන සංකල්පය විශ්ව කාමරයක් නැතහොත් විශ්වීය රවුම් මේසයක් බවට පත් වී තිබුණි. මෙයට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ මුළු ලෝකයේම සියලුම පරිගණක පද්ධතීන් එකම මව් මෙහෙයුම් පද්ධතියක් හා සම්බන්ධ වීමයි. එම මව් මෙහෙයුම් පද්ධතියවී තිබුණේ සමාජ ජාල වෙබ් අඩවියය.

සමාජ ජාල වෙබ් අඩවිය රජයට පවරා ගැනීමෙන් නැතහොත් මිල දී ගැනීමෙන් අනතුරුව මුළු ලෝකයේම රටවල් විසින් සිය රාජ්‍ය පාලන කටයුතු සඳහා ප්‍රධාන මෙහෙයුම් පද්ධතිය ලෙස සමාජ ජාල වෙබ් අඩවිය යොදා ගත්හ. සෑම පුද්ගලයෙකුටම සෑම ආයතනයකට ම, ස්ථානයකට හෝ ලියාපදිංචි කල හැකි ඕනෑම දෙයකට එහි පිටුවක් වෙන්වුණු අතර සියල්ල නිල ගිණුම් වූ අතර ඒවා ලියාපදිංචි වීම සිදු කෙරුණේ පූර්ණ රාජ්‍ය මැදිහත්වීම යටතේය. උපත්, මරණ, විවාහ මෙන්ම රථවාහන ඉඩ කඩම් වැනි ඕනෑම රජයේ ලියාපදිංචි කල යුතු දේ සිදුවූයේ මෙමම සමාජ ජාලය හරහාය.

මුළු ලෝකයම එකම පරිගණක මෙහෙයුම් පද්ධතියක් මගින් පාලනය වීම තොරතුරු තාක්‍ෂණය පිළිබඳ දියුණුව මනාවට කියා පෑවේ ය. මෙය රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශයේ ද කාර්යාලීය හා ව්‍යාපාරික කටයුතු සඳහා මහඟු පිටුවහලක් විය. කලකට ඉහත දී දින ගණන් මාස ගණන් ගත වුණු කාර්යාල කටයුතු මේ වන විට විනාඩි ගණනකින් සිදුකිරීමට හැකියාව තිබුණි.

එමෙන් ම රාජ්‍ය හා පෞද්ගලික අංශයේ කටයුතු පූර්ණ විනිවිද භාවයකින් යුක්තව සිදු කිරීමට හැකිවීම නිසා වංචා දූෂණ අක්‍රමිකතා සහමුලින් ම පාහේ තුරන් විය. ඒ සඳහා සියලුම පද්ධති එක් කිරීමට සමාජ ජාල මව් මෙහෙයුම් පද්ධතියට හැකි වී තිබුණි.

ආයතනික වශයෙන් ඇති වූ මෙම පූර්ණ විනිවිද භාවය නිසා සුළු හෝ වංචාවක් නොමග යැවීමක් සිදු වුවහොත් ඒවා රහසේ සිදුකල නොහැකි වීම නිසා ලොව පුරාම සුළු මොහොතකින් ප්‍රබල ජනමතයක් නිර්මාණය වීම නොවැලැක්විය හැකි විය. එමෙන් ම ඕනෑම පොදු ස්ථාන අරභයා කැමරා සහ මයික්‍රෆෝන මෙන්ම චන්ද්‍රිකා හා සම්බන්ධ විමසුම් පද්ධති ක්‍රියාත්මක වීම තුලින් ඕනෑම ස්ථානයක සිදුවන සිදුවීමක් ඒ මොහෝතේ නිසි බලධාරියෙකුට නැරඹිය හැකි විය. එබැවින් සැකකරුවෙකු නීතිය ඉදිරියේ වරදකරුවෙකු කිරීම ඉතා පහසු කරුණක් වූවා මෙන්ම නිරපරාදේ අහිංසක තැනැත්තෙකු වෙත සැකය යොමු වීමද අවම විය.

මේ තත්ත්වය තුල දෙදහස් හැත්තෑවේ දී ලෝකය නීතිය උපරිමයෙන් ක්‍රියාත්මකවූ එමෙන්ම ජනතාව ද උපරිම වශයෙන් නීතියට අනුව සදාචාරාත්මක ලෙස ජීවත්වූ යුගයක් ලෙස නම් කල හැකි ය. නීති විරෝධී ක්‍රියාවක් වාර්තා වූයේ කලාතුරකිනි. පොලීසියට, අල්ලස් කොමිසමට හෝ බන්ධනාගාර උසාවිය වැනි ආයතනවලට රාජකාරි ඉතා අල්ප විය.

ආරක්‍ෂක අංශ තාක්‍ෂණය උපරිම අයුරින් භාවිතා කිරීම නීතිගරුක සමාජයක් බිහිවීමට තවත් ප්‍රබල හේතුවක් විය. නියමුවන් රහිත සන්නද්ධ ඩ්‍රෝන යාත්‍රා වලට ප්‍රධාන වශයෙන් සිවිල් ආරක්‍ෂාව භාර වී තිබුණි. එවැනි යානා මධ්‍යගත පාලන කුටියක සිට මෙහෙය වුණු අතර නිතරම අහසේ එහා මෙහා පියඹුවෝය. කැමරා, මයික්‍රෆෝන හෝ වෙනත් විමර්ශන පද්ධතිවලට හෝ කිසියම් පැමිණිල්ලකදී ඒවා වහාම ක්‍රියාත්මකවී තත්පර ගණනක් තුල අදාල සිද්ධිය සිදුවන ස්ථානයට පැමිණෙති. පුද්ගලයින් කලහකාරීව හැසිරුණහොත් නිර්වින්දන බෙහෙත් විදීම මගින් ඔවුන් අඩපණ කරනු ලැබේ. නැතහොත් ක්‍ෂණයකින් ස්ඵටික බවට පත්වන පෙණ විදීමක් සිදුකොට ඔවුන් සිර කිරීමට එම ඩෝන යාත්‍රා සමත් විය.

මේ ආකාර වලින් පාලනය කරනු ලැබූ ගැටුමක් වෙත මිනිස් නිලධාරීන් පැමිණෙන තෙක් තත්ත්වය පාලනය කර ගැනිමට එම ඩ්‍රෝන යාත්‍රාවලට හැකි වී ඇත. කුඩා ඩ්‍රෝන යාත්‍රාවලට අමතර විශාල යුධ ටැංකිමය යානාද පැවතුණි.

කෙවින් විශ්ව විද්‍යාල භූමියට ඇතුළු වූ පසු රථය ස්වයංක්‍රීයව රථ ගාල බලා නික්ම ගියේය. ඔහු කෙලින්ම පුස්තකාලයට ගියේ ඔහුගේ මිතුරන් කිහිප දෙනෙක් කෙවින් එනතුරු පුස්තකාලයටවී මග බලාසිටි නිසාවෙනි.

මුද්‍රිත පොත්පත් භාවිතයෙන් ඉවත් වී දශක කිහිපයක් ම ගත වී තිබුණි. එම ගොඩනැගිල්ල පුස්තකාලය ලෙස හැඳින්වීමට හේතු වූයේ පැරණි මුද්‍රිත පොත්පත් එහි සංරක්ෂණය කර තිබීම හේතුවෙනි. අතීතයේ සාමාන්‍ය පුස්තකාලයක් වශයෙන් පැවති එය එදා මෙන් සිසුන් නිශ්ශබ්දව පාඩම් කිරීම හෝ පොත් කියවීම වෙනුවට කණ්ඩායම් වශයෙන් එක් වී සාකච්ඡා කිරීම සිදුවිය.

''හෙලෝ කෙවින්, ගුඩ් මෝනින්, මම ඔයා එනකම් මග බලාගෙන හිටියේ'' ඩේසි කෙවින්ව පෙරමගට පැමිණෙමින්ම පිළිගත්තා ය.

''ෂා නියමයි, ගෑනු ළමයෙක් මම එනකම් මග බලාගෙන ඉන්නවා කියන්නේ ගොඩක් සතුටු වෙන්න පුළුවන් කාරණයක්.'' කෙවින් සිනාවෙන්ම පිළිතුරු දුන්නේ ය.

''අනේ කෙවින්, ''අනාගත රොබෝ යන්ත්‍ර'' කියන මාතෘකාව යටතේ මට නිබන්ධනයක් කරන්න වෙලා තියෙනවා. මට මේක ටිකක් අමාරුයි. ඔයා මට උදව් කරනවා නේද ?'' ඩේසි විමසුවා ය.

''ආ... මෙයා මේ මට ආදරේකට නෙමෙයි මම එනකම් බලං ඉඳල තියෙන්නේ.'' කෙවින් පැවසුවේ අසුනක් ලං කරගෙන හිඳ ගනිමිනි.

''හරි හරි, නිබන්ධන පස්සෙ කරන්න පුළුවන්. මේ සැරේ අපි මොන පක්ෂෙටද ඡන්දෙ දෙන්නේ ?'' ටර්න්බුල් විමසුවේ ය.

''කවුරු වුනත් විදුලි බිල අඩු කරන කෙනෙකුට තමයි මම නම් ඡන්දෙ දෙන්නෙ'' ඩේසි පැවසුවාය.

''ඇයි ඩේසි එහෙම කියන්නෙ ? දැනටමත් විදුලියට කොච්චර අඩු වියදමක්ද යන්නෙ ? මීට අවුරුදු තිහ හතලිහකට කලින් සුපර් බැටරි තාක්ෂණය සොයාගත්තට පස්සෙ විදුලි මිල කොච්චර අඩු වුණා ද? පෙට්‍රල් ඩීසල් වගේ පොසිල ඉන්ධන භාවිතය ඒත් එක්කම සම්පූර්ණයෙන් ම නැති වුණානේ. මම අහල තියන විදියට ඒ කාලවල්වලදි බලශක්තියට ගියපු වියදම අපට නම් හිතාගන්නවත් බෑ.'' කෙවින් පැවසුවේ ය.

''සුපර් බැටරි තාක්ෂණය සොයාගත්තෙ නැත්නම් අද මේ අපි අත්දකින දියුණුව හිතාගන්නවත් බැරි වෙයි. ඒ දවස්වල කාර් එකක පෙට්‍රල් ඩීසල් එන්ජින් එකක් ස්ටාට් කරන බැටරිය කිලෝ දහයක් පහලවක් බරයිලු. අද ඒ ප්‍රමාණයේ බැටරියකින් කෝච්චියක් දුවන්න පුළුවන්'' ටර්න්බුල් සඳහන් කළේය. වැදගත්ම පැනය ඇසුවේ ඩේසි විසිනි.

''පෙට්‍රල් ඩීසල් කියන්නේ මොනවා ද?''

''ඩේසි, පෙට්‍රල් ඩීසල් කියන්නෙ පොලවෙන් ගත්ත ඉන්ධන. ඒවා පත්තු කරල ඇතිවන තාප බලයෙන් තමයි ඉස්සර වාහන දුවල තියෙන්නෙ. ඒ විතරක් නෙවෙයි. ඉස්සර

විදුලිය නිපදවල තියෙන්නෙත් ඔය පෙට්‍රල් ඩීසල් වගේ දේවල් වලින්'' ටර්න්බුල් වැඩිදුරටත් පැහැදිලි කළේය.

''අම්මෝ, මොනතරම් පරිසර දූෂණයක් ද? නේ ද?'' ඩේසි කම්මුලේ අත තබාගෙන විමතියට පත්වූවාය.

''ඒක ඇත්ත. අවුරුදු තිහ හතලිහකට කලින් ඔය ඛනිජ තෙල් භාවිතය නැවතුනේ නැත්නම් අද අපිට ජීවත් වෙන්න ලෝකයක් ඉතුරු වෙන්නෙ නෑ. එහෙනම් පරිසරය අද වෙන කොට අපට ජීවත් වෙන්න බැරි තරමට ම දූෂණය වෙලා තියේවි.'' කෙවින්ද කතාවට දායක වූයේය.

''ඒත් අදටත් ඛනිජ තෙල් භාවිතා වෙනව නේද?'' ටර්න්බුල් විමසීය.

''ඔව්, සමහර රසායනික විද්‍යාත්මක දේවල් වලට භාවිතා වෙනවා. ඒත් ඒකෙන් පරිසරයට හානිදායක මට්ටමක් නෑ. දූන් හැමදේම වගේ ප්‍රතිචක්‍රීකරණය කරනවනේ. කිසිදෙයක් නිකම්ම පරිසරයට මුදා හැරෙන්නෙ නෑ.'' කෙවින් පැහැදිලි කළේය.

''දූන් බලන්න, ලෝකෙ සියලුම විදුලිය නිපදවෙන්නෙ සූර්ය ශක්තියෙන්. නිපදවෙන විදුලිය සුපර් බැටරි වල ගබඩා වෙනවා. තෙල් කර්මාන්තයෙ යෙදිල හිටපු අරාබි රටවල් ඛනිජ තෙල් භාවිතය නැවැත්තුවට පස්සෙ එයාලගෙ කාන්තාරවලයි සාගර වලයි ඇති කරපු සූර්ය බලාගාර වලින් විදුලිය නිපදවන්න පටන් ගත්ත එක පරිසරයට වගේම ලෝකයටම ඉතාම හිතකර වුණා. මම දන්න විදියට දූනට අපි ගබඩා කරගෙන තියෙන විදුලියෙන් තව අවුරුදු පහක් මේ ලෝකය මේ විදියට දුවවන්න පුළුවන්'' ටර්න්බුල් නැවත කීවේය.

''ඒකනේ ඉතින් මම මෙච්චර වෙලා කිව්වෙ, මෙච්චර අඩුවට නොමිලෙම විදුලිය දෙන්න පුළුවන්කම තියෙද්දී ඇයි බලශක්තිය නොමිලෙ දෙන්නෙ නැත්තෙ ? රජයට ආදායම් ගන්න ඕනි තරම් තියනවනේ'' ඩේසි පෙන්වා දුන්නාය.

''මෙහෙම දේකුත් තියනවා. මම උදේ කෑමට ගත්ත බර්ගර් එකට තරම්වත් මුදලක් මට මාසෙම විදුලි බිලට වියදම් වෙන්නෙ නෑ. ඉතින් ඒක නොමිලෙ දුන්න කියල අපට ඒක එච්චර දූනෙන එකක් නෑ. රජයටත් ආදායමක් තියෙන්න ඕනිනේ.''

''හොඳයි බලන්න අපේ රටේ දේශපාලන ඉතිහාසය. දූන් තියන දේශපාලනය කොච්චර පිරිසිදුද? රටේ සම්පත් කිසිම නාස්තියක් නැතිව රටේම යහපතට පාවිච්චි වෙනවනේ. අපේ රට විතරක් නෙවේ. ලෝකෙ හැම රටක්ම එහෙමයිනේ. මොන පක්ෂෙ වුණත් හැම දේශපාලඥයෙක්ම එකම ප්‍රතිපත්තියක ඉඳගෙන රට සංවර්ධනය කරන්න කටයුතු කරනවනේ. මට නම් මොන පක්ෂෙ ආවත් එකයි'' කෙවින් පැහැදිලි කලේ ය.

කාලය කෙමෙන් කෙමෙන් ගත වී ගොස් දහවල් දොලහයි තිහ ළඟා විය. ක්ලෝඩියාට උපන්දින ත්‍යාගයක් මිල දී ගත යුතු බව කුකී මතක් කළාය. විශ්ව විද්‍යාලයෙන් එළියට ගමන් කළ කෙවින් මොනෝ රේල් ට්‍රෑම් රථයට ගොඩ විය.

මහා මාර්ගයට සමාන්තරව කණු උඩ සවි කල තනි පීල්ලක් මත ධාවනය වූ මෙම කුඩා කෝච්චි නගරයේ සෑම අස්සක් මුල්ලක් නෑරම යාකරමින් ගමන් කළෝය. මාර්ගයට සමාන්තර ඒට ඉහලින් තනා තිබූ බැවින් ඒවා ගොඩනැගිලි හෝ මාර්ග වලට කිසිදු බලපෑමක් නොකළේය.

සුපිරි වෙළඳ හල අසලින් ට්‍රැම් රථයෙන් බැසගත් කෙවින් රෝද දෙකේ විදුලි කරත්තයකට ගොඩ විය. අතීතයේ සිටම මෙවැනි රෝද දෙකේ රථ නරගවල එහා මෙහා යාමට ජනතාව භාවිතා කළෝය. කුඩා එහෙත් පළල් රෝද දෙකක් තිබූ මෙම බයික් වලට නැග එහි හැඬලය අල්ලා ගත් විට පහසුවෙන් එහා මෙහා යාහැකි විය. සාමාන්‍යයෙන් බොහෝ සුපිරි වෙළඳසැල් හා උයන්වල මෙවැනි බයිසිකල් නොමිලේ ලබාදෙන ලදී.

කෙවින් කාන්තා අංශයට ගියේ ක්ලෝඩියාට ගැළපෙන ගවුමක් තෝරා ගැනීමට ය. ඇයට ගැළපෙතැයි සිතූ ගවුමක් තෝරාගත් ඔහු එහි ෆිට් ඔන් පරිගණකය වෙත ගෙන ගොස් ක්ලෝඩියාගේ ප්‍රොෆයිල් එක තෝරා ඇගලුමේ තිබූ ටැග් එක යන්ත්‍රයට ලං කළේය. එවිට එම ඇඟලුම ක්ලෝඩියා ඇන්ද විට දිස් වන ආකාරය තිරයෙන් දැක ගත හැකි විය. ඇඳුමේ ප්‍රමාණය හා හැඩය ගැන ඔහු සතුටට පත් වුව ද වර්ණ තෝරා බැලීමේ දී ලා නිල් වර්ණය ඇයට වඩාත් ගැළපේ යැයි කෙවින්ට සිතුණි. ඔහු ලා නිල් පැහැය තෝරා ගත්විට සේවිකාවක් එම ගවුමෙහි ලා නිල් පැහැති එකක් ගෙනවිත් දුන්නාය. ඔහු එයද රැගෙන පිටවීමේ කවුන්ටරය වෙත පියමං කළේය.

කෙවින් අදාල ගවුම කවුන්ටරය මත තැබූ විට ස්වයංක්‍රීය කැෂියර් යන්ත්‍රය මිලෙහි සඳහන් මුදල තිරයෙන් දැක්විය. අනතුරුව කෙවින් ඉදිරිපස තිබූ *TRC* කැමරාව දෙස බලා ''ගෙවන්න'' යැයි පැවසූ විට ගෙවීම තහවුරු වූ අතර ඇඟලුම ස්වයංක්‍රීයව කවුන්ටරයෙන් ඉවත පිටවීමේ කවුලුව වෙත සංසරණය වූයේ මනාව ඇසුරුම් වීමෙන් අනතුරුව ය.

*TRC* යනු *Total Recognition Confirmation* යන්නෙහි කෙටි වදනයි. මෙම ක්‍රමය යොදා ගනු ලැබුවේ මුදල් ගෙවීමේ දී පමණක් නොවේ. ඕනෑම නීත්‍යානුකූල තහවුරු කිරීමක් අත්සන් කිරීමක් රහස් පදයක් හෝ යතුරක් වෙනුවට මෙම *TRC* ක්‍රමය භාවිත කල හැකි විය.

දේපලක් විකිණීමට, ගිවිසුමකට එළඹීම වැනි නෛතික කරුණු සඳහා *TRC* අනිවාර්යයෙන්ම භාවිතා විය. එහෙත් නිවසක් අගුල් දැමීම මෝටර් රථයක් පණ ගැන්වීම වැනි කරුණු වලදී එය අනිවාර්ය නොවූයේ සමහර විටෙක රහස් පදයක් හෝ යතුරක් භාවිතා කිරීම ප්‍රායෝගිකව පහසුවීම නිසා ය.

*TRC* ක්‍රමයේ දී පැතිකඩ කිහිපයක් ඔස්සේ තහවුරුවන් ලබාගැනීම සිදුවේ. එනම් මුහුණ හා මුහුණේ ඉරියව්, ඇසේ කලු ඉංගිරියාව, මනසින් නිකුත් වන තරංග හා *DNA* කේත වැනි කරුණු රාශියක් මෙහි දී සැලකිල්ලට ගැනීම සිදුවේ.

මෙම ක්‍රමයේ දී අප කිසියම් තහවුරුවක් ලබාදීමේ දී අපගෙන් පළමුව අදාල කරුණ තහවුරු කරන මෙන් ඉල්ලා සිටිනු ලැබේ. එවිට අප ඒ ගැන සිතින් සිතිය යුතුය. අප තහවුරුව ලබා දුන්නේ අව්‍යාජ කැමැත්තකින් දැයි $TRC$ පද්ධතිය සොයාබලනු ලැබේ. බල කිරීමෙන් හෝ තර්ජනය කිරීමෙන් හෝ තහවුරුවක් ලබා ගැනීම මෙම ක්‍රමයේ දී නුපුළුවන් වන අතර යතුරක් හෝ රහස් පදයක් මෙන් තහවුරු කිරීමේ හැකියාව තවකෙකුට උදුරා ගත නොහැක. එමෙන්ම ව්‍යාජ අනන්‍යතා සැකසීම ද කළ හැකි නොවේ.

කෙවින් නැවත විශ්ව විද්‍යාලයට පැමිණියේය. සවස පැවති දේශනයට සහභාගී වූ ඔහු අනතුරුව ක්ලෝඩියාගේ උපන්දින සංග්‍රහයට ද සහභාගී වී නැවත සිය නවාතැනට පැමිණියේ මදක් රෑ බෝ වීමෙන් පසුවය.

# හැත්තෑ එකේ කැරැල්ල

ඒ වන විට කෙවින් සිටියේ පරිගණක පරීක්ෂණාගාරයේ කිසියම් කටයුත්තක නිරත වෙමිනි. එක්වරම තිරයේ පසෙකින් දර්ශනය වූ හදිසි ප්‍රවෘත්තිය දුටු කෙවින් කම්පාවෙන් කැළඹී ගියේ ය. ඔහු ඉතාමත්ම ආදරය කල ඔහු ඉතාම ගෞරව කල තම ඉටු දෙවියා ලෙස ඇදහූ පුද්ගලයෙකු දූයෙන් සමුගෙන තිබුණි. එම තැනැත්තා අන් කවරකුවත් නොව සමාජ ජාල වෙබ් අඩවියේ නිර්මාතෘවරයා වූ මැක් කාල්ස්බර්ග් මහතාය.

මෙලොව උපදින සියලුම සත්ත්වයින් කෙදිනක හෝ මිය යා යුතුය. එය ලෝක ධර්මයයි. විද්‍යාව හා තාක්ෂණය කොතරම් දියුණු වුවද වයසට යාම, ලෙඩ වීම හා මරණයට පත්වීම කාටනම් වැළැක්විය හැකිද?

ඒ මහා ප්‍රාඥයා ඔහුට පසුගිය දිනවල නිතරම පාහේ මුණගැසුනේ ඔහු කෙවින්ගේ ගුරුතුමා වූ මහාචාර්ය රයන්ගේ ළඟම හිතවතකු වූ නිසාවෙනි. කෙවින් පුහුණු වීම් ලැබූ විශ්ව විද්‍යාලීය පරිගණක අංශයේ ප්‍රධානියා වූයේද මහාචාර්ය රයන් ය. ඔහු තම සියලුම රාජකාරි ගමන් සඳහා එක් කර ගත්තේ කෙවින්ය. එබැවින් මහාචාර්ය රයන්, මැක් කාල්ස්බර්ග් මුණ ගැසුණු සෑම අවස්ථාවකදීම කෙවින්ටද ඔහුව මුණ ගැසීමට හැකි විය.

මැක් කාල්ස්බර්ග් රෝගාතුරව රෝහල් ගත කළේ මීට මාසයකට පමණ පෙරාතුව වන අතර එවිට ඔහුට වයස අසූ හයක් විය. කාල්ස්බර්ග් බැලීමට රෝහලට පවා දෙතුන් වතාවක් කෙවින් මහාචාර්ය රයන් සමග ගියේය.

අවසාන කටයුතු පූර්ණ රාජ්‍ය ගෞරව සහිතව සිදුවූ අතර සියලු දෙනාම තම ප්‍රොෆයිල් පින්තූර වලට සුදු ධජයක් යොදා ශෝකය පළ කළහ. රජය විසින් ද සමාජ ජාල මව් පද්ධතියේ පසුබිම නිල් පැහැය වෙනුවට කලු පැහැය යොදා ශෝකය පළ කර තිබුණි. ලෝකයම පාලනය කිරීමට පරිගණක පද්ධතියක් නිපදවා එමගින් ලෝකයම වඩා යහපත් තැනක් බවට පත් කිරීමට පුරෝගාමී වූ එතුමාගේ අභාවය ගැන සියල්ලෝම කම්පා වූහ. සිය විශ්ව විද්‍යාල ජීවිතයේ මිතුරන් එකතු කිරීමට සමාජ ජාල වෙබ් අඩවිය ලෝකය පාලනය කරන තැනට ගෙන ඒමට ඔහු මහඟු කාර්යභාරයක් ඉටු කොට තිබුණි.

දින කිහිපයක් ගත වී ගියේ ලෝකයම එතුමාගේ අභාවය ගැන කම්පා වෙමිනි. එහෙත් ඔහුගේ අභාවයෙන් හත්වන දින උදෑසන සිදුවූ සිදුවීමක් සියලුදෙනාගේ ම අවධානය යොමු කරගැනීමට සමත් විය.

''ඔබව හඳුනා ගන්න'' යනුවෙන් පණිවුඩයක් මැක් කාල්ස්බර්ග් ගේ පිටුවට ලයික් යොදා තිබූ සියලුම අයගේ සමාජ ජාල පිටුවලට ලැබී තිබුණි. එය ෂෙයා කොට තිබුණේ මැක් කාල්ස්බර්ග්ගේම නිල පිටුවෙන් වීම අවධානය යොමු වූ කරුණ විය. මෙහි විශේෂත්වය වූයේ මැක් කාල්ස්බර්ග්ගේ පිටුව මිය ගිය අයෙකුගේ පිටුවක් ලෙස සකස් කොට තිබීමත් එවැනි පිටුවලින් කිසිදු ක්‍රියාකාරකමක් බලාපොරොත්තු විය නොහැකි වීමත් නිසා ය. මිය ගිය තැනැත්තෙක් සිය සමාජ ජාල පිටුවට ඇතුළුවී පණිවුඩ යැවීම කවර නම් විහිළුවක් ද?

මෙම සිදුවීමෙන් කෙවින් මෙන්ම ලොව පුරා වූ මැක් කාර්ල්ස්බර්ග්ගේ රසිකයන් කම්පනයටත් කුතුහලයටත් පත් විය. එක්කෝ මෙය සමාජ ජාලයේ පරිපාලක පරිගණක ඉංජිනේරුවන් පිරිසකගේ විහිලුවක් විය යුතුය. එහෙත් එය කිසිවකුට තනිව කල හැක්කක් නොවන අතර එවැන්නකින් ඔවුන්ට ලැබෙන ලාභය කුමක් ද?

තවත් පිරිසකගේ මතය වූයේ මෙය පරිගණක වයිරසයක ක්‍රියාවක් බවය. එහෙත් මුළු මහත් ලෝකයම එකම තලයකට ගෙන ආ මෙවැනි ප්‍රබල සමාජ ජාල පරිගණක පද්ධතියකට වයිරසයක් ඇතුළුවීම කොහෙත් ම සිදුවිය නොහැක්කක් වන අතර අතීතය පුරාම එවැන්නක් වාර්තා වන පළමු අවස්ථාව ද මෙය වේ.

''මේක අනිවාර්යයෙන් ම වෛරසයක්. ඒ ගැන කිසිම සැකයක් නෑ. ඒත් මට තියන ප්‍රශ්නෙ මෙච්චර ආරක්ෂාව දාල තියෙද්දී කොහොම ද මේ වගේ ගෝලීය පද්ධතියකට වෛරස් එකක් ඇතුළු වෙන්නේ කියන එක'' මහාචාර්ය රයන් පැවසුවේ අවිශ්වාස කටයුතු හැඟීමකිනි.

''රජයෙන් කමිටුවක් පත් කරල තියෙනවා මේ ගැන වහාම කටයුතු කරන්න. මාව තමයි ඒකෙ අමෙරිකානු ප්‍රධානියා විදියට දාල තියෙන්නෙ. මට ඔයාල දෙන්නගේ උදව් අවශ්‍යයි. මහාචාර්යවරයා පැවසුවේ කෙවින් සහ රාම් දෙස මාරුවෙන් මාරුවට බලමිනි.

''මමත් සිස්ටම් එකේ ගැඹුරට ම ගිහින් බැලුවා ප්‍රොෆෙසර්, ඒත් වෛරසයක කිසිම ලක්ෂණයක් හොයා ගන්න බෑනේ. මම මැක් කාර්ල්ස්බර්ග්ගේ ප්‍රොෆයිල් එකත් හොඳට ම චෙක් කරලා බැලුවා. කිසිම වැරැද්දක් පේනන නෑ'' රාම් පැවසුවේය.

''මේ දේ මොකක් වුණත් අපි පුළුවන් උපරිමයෙන් උත්සාහ කරලා වෙලා තියන දේ සොයාගෙන ඒකට පිළියමක් කරන්න ඕනි. නැතිනම් මේ වගේ ප්‍රබල ලෝක ව්‍යාප්ත පද්ධතියක් අපේ පාලනයෙන් බැහැර වෙලා වෛරස් එකකට යටත් වෙනවා කියන දේ භයානක කම අපට හිතාගන්නවත් බැරි වෙයි'' කෙවින් ද කතාවට දායක විය.

''එහෙනම් ඔයාල දෙන්නත් එකතු වෙලා කොමිටි එකේ අනිත් අයත් එක්කත් සාකච්ඡා කරල මේ වෛරස් එක හඳුන ගන්න බලන්න. සමහරවිට අපි හිතනවට වඩා බොහොම සුළු දෙයක් වෙන්නත් පුළුවන්. මම අනිත් රටවල් වල පරිගණක පරිපාලන කණ්ඩායම් වලටත් පණිවුඩ යැව්වා. අපි හෙට උදේ හම්බවෙමු. දැන් මට ජනාධිපතිතුමා හමුවෙන්න ධවල මන්දිරයට යන්න තියනවා. මේ වෛරස් එක ගැන එතුමටත් ආරංචි වෙලා.'' මහාචාර්ය රයන් පිටත්ව ගියේ ය. කෙවින් හා රාම් එක් වී හැකි තරම් පිරික්සා බැලුවේ වෛරසය කෙබඳු එකක් දැයි සැකහැර දැනගෙන ඊට පිළියම් යෙදීමේ අටියෙනි.

''මට නම් හිතෙන්නෙ මෙතන මොකක් හරි ආධ්‍යාත්මික දෙයක් තියනවා කියලා. දැන් බලන්න හැම ආගමකම වගේ මනුස්සයෙක් මැරිලා දවස් හතකින් ආපසු එනවා වගේ කතන්දර තියනවනේ. මැක් කාර්ල්ස්බර්ග් අන්තිම කාලෙ ආධ්‍යාත්මික පැත්තට ගොඩක්

නැඹුරු වෙලා හිටියනේ. එයා ගොඩක් ආගම් සහ විශ්වාස ගැන හැදෑරුවා කියල මම අහල තියෙනවා. සමහරවිට මේක ඒ වගේ දෙයක් වෙන්න බැරිද?'' රාම් පැවසුවේ ය.

''ඒ වගේ දෙයක් කිව්වෙ මොන වගේ දෙයක් ද?'' කෙවින් ප්‍රශ්න කළේය.

''නෑ මම කිව්වෙ, මළ ගිය ප්‍රාණකාරයෙක් පරිගණක පද්ධතියකට ආරූඪ වීමක් වගේ. ඔය කතා තියෙන්නෙ මිනිස්සු මැරුණට පස්සේ තමන් ජීවත්වෙලා හිටපු කාලෙ ආසා කරපු දේවල් වලට ආරූඪ වෙනවා කියලා. උදාහරණයක් විදියට කෙනෙක් මැරුනම තමන් ජීවත් වුණු ගෙදරට ආසාවෙන් ආපසු එන්න පුළුවන්. ඒ වගේ මැක් කාර්ල්ස්බර්ග් තමන් හදපු පරිගණක පද්ධතියට ආශාවෙන් ඒකට ආරූඪ වුණා වෙන්න බැරිද?''

රාම් පැවසූ විට කෙවින් බඩ අල්ලාගෙන සිනහ වීමට පටන් ගත්තේ ය. එහෙත් රාම් ඉන් සතුටට පත් වූයේ නැත. ඔහු නොරිස්සුම් ලීලාවෙන් කෙවින් දෙස නෙත් හෙලුවේය.

''එහෙම වෙන්න බැරිද? හරි ඔයා මේ ගැන මොකද හිතන්නෙ ?'' ඔහු වැඩිදුරටත් විමසුවේය.

''වෙච්ච දේ හරියටම සොයා ගන්නකම් කිසිම දෙයක් නැහැයි කියල කියන්න බෑ. ඒත් රාම් මට නම් හිතෙන්නෙ එක්කො මේක අපට තාම අඳුර ගන්න බැරි වුණු වයිරස් එකක්. නැත්නම් මේ සිද්ධිය පිටුපස්සේ කවුරුහරි පරිගණක ක්ෂේත්‍රයේ ප්‍රබල හැකර් කෙනෙක් ඉන්නවා.'' කෙවින් පැවසුවේ ස්ථිර සාර බවකින් යුක්තවය.

''සිස්ටම් එක කොච්චර ආරක්ෂාකාරී ද කියන එක මම ඔයාට අමුතුවෙන් කියල දෙන්න ඕනි නෑනේ. හරි, ඔයා කියන්න මේ පරිගණක ක්ෂේත්‍රයේ මෙච්චර දැනුමක් තියන අපි දෙන්නයි අපේ ප්‍රොෆෙසර් රයනුයි එකතු වුණත් ඔය වැඩේ අපිට කරන්න පුළුවන් ද? මම කිව්වෙ මැරිච්ච කෙනෙකුගේ ප්‍රොෆයිල් එකකින් මැසේජස් යවන එක ?'' රාම් විමසා සිටියේය.

''මම පිළිගන්නව රාම්, අපේ යුනිවර්සිටි එකේ පරිගණක විද්‍යා අංශයෙම අය එකතු වුනත් ඒක කරන්න බෑ.'' කෙවින් පිළිගත්තේය.

''අනික බලන්න ඒ යවපු මැසේජ් එකේ මොකක්ද තියෙන්නෙ කියලා. ''ඔබව හඳුනා ගන්න'' කාටද ප්‍රයෝජනයක් තියෙන්නෙ ඒවගේ මැසේජ් එකකින් ?''

''මම කියන්නෙ කෙවින්, මැක් කාර්ල්ස්බර්ග් ජීවත් වෙලා ඉන්න කාලෙම සැලසුම් කරපු දෙයක් මේක එයා බලාපොරොත්තු වෙන්න ඇති අමරණීය වෙන්න. ඒත් ශරීරය වයසට යන එක නවත්වන්න බෑනේ. ඒක නිසා මැරුණට පස්සෙ එයා යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් ක්‍රමවලින් පරිගණක පද්ධතියට ආරූඪ වෙන්න පුළුවන් ක්‍රමයක් හොයාගන්න ඇති.'' රාම් සිය අදහස අත් හැරීමට කැමති නැත. එහෙත් එහි දී කෙවින්ට ද පොඩි ඉඟියක් ලැබුණි.

''යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් කොහොම වුණත් ඒක වගේ දෙයක් විද්‍යාත්මක පැත්තෙනුත් පැහැදිලි කරන්න පුළුවන්.'' ඔහු පැවසුවේ ය.

''ඒ කොහොම ද කෙවින් ?'' රාම් විමසීය.

''මෙහෙමනේ, මැක් කාල්ස්බර්ග් ගේ ශරීරය මිය ගියාට පස්සේ විද්‍යාත්මක ක්‍රමයකින් එයාගේ මනෝ කාය ඉවත් කරල පරිගණක පද්ධතියකට ඇතුළු කරන එක.'' කෙවින් සිය මතය පැවසීය.

''ඒක වෙන්න බෑ කෙවින්. ඒ වගේ දෙයක් නම් මැක්ට හොර රහසේ කරන්න ඕනි නැනේ. කවුද අකමැති මැක් කාර්ල්ස්බර්ග් මැරුණට පස්සෙ එහා පරිගණක පද්ධතියක් ඇතුලේ හරි ජීවත් කරන්න.? එහෙම තාක්‍ෂණයක් තියනව නම් මැරෙන හැම දෙනාටම ඒ විදියට පරිගණකයක ජීවත් කරවන්න පුළුවන්'' රාම් පැවසුවේ ය. එහෙත් රාම් අවසානයට පැවසූ දේ කෙවින්ගේ මනසට නොගියේ ඔහු ඒ වන විට වෙනත් තදබල අවධානයක හිටි බැවිනි.

''රාම්, මේ බලන්න.'' කෙවින් පැවසුවේ සිය පරිගණක තිරය පෙන්වමිනි.

''මේ බලන්න, මේ මැසේජ් එකත් ඒකමයි. ''ඔබව හඳුනා ගන්න'' හැබැයි මේ මැසේජ් එක එවල තියෙන්නෙ මැක් කාර්ල්ස්බර්ග්ගේ ප්‍රොෆයිල් එකෙන් නෙවෙයි'' කෙවින් පෙන්වා දුන්නේය.

''මේ මැසේජ් එක එවල තියෙන්නෙ පීටර් ආම්ස්ට්‍රොන්ග් කියල කෙනෙකුගේ ප්‍රොෆයිල් එකකින්. හැබැයි මෙයත් මිය ගිය පරිගණක විද්‍යාඥයෙක්'' හෙතෙම වැඩිදුරටත් පැවසුවේය.

''මෙතන අපිට නොතේරෙන විදියේ මොකක්හරි දෙයක් තියනවා රාම්''

''සමහරවිට ඔයා කියන දේ ගැනත් මොනවහරි සම්බන්ධයක් තියෙන්න පුළුවන්?''

කෙවින් ඌණ පූර්ණය කලේ ය. දින දෙක තුනක් ගත වී ගිය ද මහාචාර්ය රයන්, කෙවින් හා රාම් ඇතුළු කණ්ඩායමට කිසිවක් හොයා ගැනීමට හැකි වූයේ නැත. සිදුවූ එකම දෙය තත්ත්වය තව තවත් නරක අතට හැරීම පමණකි.

''ප්‍රොෆෙසර් !'' කෙවින්ගේ ඇමතුමෙන් බර කල්පනාවක සිටි මහාචාර්ය රයන් හිස ඔසවා ඔහු දෙස නෙත් හෙලුවේය.

''පසුගිය දවස් දෙක තුනේ දිගින් දිගටම තව තවත් මැරිච්ච අයගේ ප්‍රොෆයිල් වලින් එකම මැසේජ් එක නිකුත් වෙන්න ගත්තනේ. තත්ත්වය එන්න එන්නම දරුණු වේගෙන එන්නෙ. මුලින් මුලින් මිය ගියපු පරිගණක විද්‍යාඥයින්ගේ ප්‍රොෆයිල් වලින් විතරයි මැසේජ්

එක නිකුත් වුනේ. ඒත් දැන් එහෙම එකක් නෑ. එක එක මැරුණු පුද්ගලයින්ගේ ප්‍රොෆයිල් වලින් මැසේජස් එනවා. මම හිතන්නෙ ලබන සතිය වෙනකොට සිස්ටම් එකේ තියන ඔක්කොම මැරිච්ච අයගෙ ප්‍රොෆයිල් ඇක්ටිව් වේවි.'' කෙවින් පැහැදිලි කළේය.

''ජනාධිපතිතුමා මට උදේ හවස වද දෙනවා මේ ප්‍රශ්නෙ නිසා. මමත් ඉතින් එක එක බොරු කිය කියා ලිස්සල යනවා. වෙන මොනවා කරන්න ද?'' මහාචාර්යතුමා හිසේ අත් දෙකම තබාගෙන පිළිතුරු දුන්නේය.

''මේ සිද්ධ වෙන දේ මොන වගේ දෙයක් ද කියලවත් අපිට හිතාගන්න බැරි හැටි?'' රාම් ද කතාවට එකතු විය.

''අපි විතරක් නම් මොක ද? අපි වගේම මෘදුකාංග තාක්‍ෂණයේ ඉදිරියෙන්ම ඉන්න රාම්ගේ රටේ ඒ කිව්වෙ ඉන්දියාවෙ විද්‍යාඥයින්ටවත් තාම මේ ගැන අදහසක් නෑනේ'' කෙවින් පැවසුවේය.

''මේකනේ, කරුමෙට මේ ප්‍රශ්නෙ පටන් ගත්තෙ අමෙරිකාවෙමනේ. ඒ මදිවට සමාජ ජාල පරිගණක පද්ධතිය හදපු මැක් කාර්ල්ස්බර්ග්ගෙ පිටුවෙන්මනේ ඔය මැසේජ් එක ඉස්සෙල්ලම නිකුත් වුණේ. ඉතින් හැම රටක්ම අපි දිහා ඇඟිල්ල දික් කරගෙන ඉන්නේ'' මහාචාර්යතුමා පෙන්වා දුන්නේය.

''මේක පිටසක්වල ජීවී ආක්‍රමණයක් වෙන්න බැරිද ප්‍රොෆෙසර් ? අපි අපේ චන්ද්‍රිකා වල සංවේදන වැඩි දියුණු කරලා වෙනම ටීම් එකක් දාමු මොනවහරි අමුතු සංඥා ලැබෙනවද කියල හොයල බලන්න ?'' කෙවින් යෝජනා කළේය.

''ඔයා කින දේත් පොයින්ට් එකක් තියනව කෙවින්. අපි මේ වෙලාවෙ මේ ප්‍රශ්නෙන් ගොඩ එන්න කරන්න පුළුවන් හැමදේම කරන්න ඕනි. මම දැන්ම ඒ ගැන නාසා එකට දැනුම් දෙන්නම්.''

''මම ඊයේ මීඩියා කොන්ෆරන්ස් එකක් කළා, ඔයාලා දැක්ක ද?'' මහාචාර්යතුමා විමසුවේය.

''අනේ නෑ සර්, මේ වැඩ අස්සෙ ප්‍රවෘත්ති බලන්නත් බැරි වුණානේ.''

''මම දැනට අපේ මධ්‍යගත මෙහෙයුම් පද්ධතිය ඇතිවෙලා තියන තත්ත්වය සහ ඒකෙ අවදානම ජනතාවට පැහැදිලි කළා. මම හැමදෙනාගෙන් ම උදව් ඉල්ලුවා මේ වෙලාවෙ අපට උදව් කරන්න කියලා'' මහාචාර්යතුමා සඳහන් කළේය.

''ඒ කියන්නෙ සර්, අපි මේ දක්වා අසාර්ථකයි කියල ජනතාව දැන ගන්න ඇති නේද?'' රාම් කතාබහට හවුල් විය.

''ආත්ම ගරුත්වය ගැන හිත හිතා ඉඳල බෑ. මේ වෙලාවෙ අපි උදව් ගන්න පුළුවන් හැම කෙනාගෙන්ම උදව් ගන්න ඕනි. මොකද අපට තියන තර්ජනයේ බලපෑම කොච්චරද කියලවත් අපි දන්නෙ නෑ'' මහාචාර්ය රයන් පිළිතුරු දුන්නේය.

''හොඳයි, මට දූන් කොන්ෆරන්ස් එකක් තියනවා අන්තර්ජාතික පරිගණක විද්‍යාඥයින් එක්ක. පෙන්ටගන් එකයි ධවල මන්දිරයයි පවතින තත්ත්වෙ ගැන ගොඩක් බය වෙලා ඉන්නෙ. ලෝක නායකයො හැමෝම වගේ සමුළුවට සහභාගි වේවි. මේ වෙලාවෙ අපි ගන්න පියවර ගැන සමුළුවේදි තීරණයක් ගනීවි.'' පැවසූ මහාචාර්ය රයන් සමුළුව සඳහා පිටත්ව ගියේය. කෙවින් හා රාම් එක්ව තව දුරටත් වෛරසය ගැන නැතහොත් ඔවුන් වෛරසයක් ගැන විශ්වාස කල දේ ගැන පරීක්ෂණ කටයුතු සිදු කළහ.

තවත් දවසක් ගෙවී ගියෝය. මොහොතින් මොහොත වෛරසය තව තවත් පැතිරුණා මිස අඩුවක් නම් වූයේ නැත. එහෙත් මෙම වෛරසය පද්ධතියට කිසිඳු හානිදායක බලපෑමක් මේ වනතෙක් සිදුකර නොතිබුණි. ඇති වූ එකම සිදුවීම ''ඔබ හඳුනා ගන්න'' යන පණිවුඩය පරිගණක තිර මත දිස්වීම පමණකි. පණිවුඩය තිරය මත දර්ශනය වූ පසු එය අවලංගු කොට සාමාන්‍ය පරිදි කටයුතු කරගෙන යාහැකි විය.

''කෙවින් මේ බලන්න. මම ඉදිරිපත් කරපු අදහස තවත් ගොඩක් අයට ඇති වෙලා වගේ'' රාම් සිය පරිගණක තිරයෙන් ප්‍රවෘත්ති පිටුවක් කෙවින්ට පෙන්වමින් සඳහන් කළේය.

''ආසියාවෙ, අරාබියෙ විතරක් නෙමෙයි, යුරෝපයේ අප්‍රිකාවෙ පවා ආගමික සංවිධාන මේ වෛරසය මැඩ පවත්වන්න විවිධ ආගමික වැඩසටහන් ක්‍රියාත්මක කරල තියනවා. මේක මැරිච්ච අයගෙ පරිගණක පිටු වලින් ආපු වෛරස් එකක් නිසා ගොඩක් ආගමික නායකයො විශ්වාස කරනව මේක මළගිය ආත්ම වල නැවත පිබිදීමක් වෙන්න පුළුවන් කියලා'' රාම් පැවසුවේය.

''කතාව ඇත්ත වුණත් බොරු වුණත් හැම ආගමකින්ම ඒ වගේ ශාන්තිකර්ම කරන එක හොඳයි. ලෝකෙ කිසිම පරිගණක විද්‍යාඥයෙකුට වෙලා තියන දේ හොයාගන්න බැරි වෙලා තියන තත්ත්වයක ආගමික පැත්තෙනුත් යමක් කරන එක ගොඩක් වැදගත්'' කෙවින් මෙවර රාම් හා එකඟ විය. මහාචාර්ය රයන්ද ඒ වන විට විද්‍යාගාරයට පැමිණ සිටියේ ය.

''මොනවද ළමයි අලුත් තොරතුරු'' ඔහු විමසුවේය.

''චන්ද්‍රිකා වලට නම් කිසිම විශේෂ සංඥාවක් ලැබිල නෑ කියල තමයි නාසා එකෙන් කියන්නෙ.'' කෙවින් පැවසුවේය.

''හැබැයි අපට පද්ධතියෙ පොඩි අසාමාන්‍ය වෙනසක් දකින්න ලැබුණා'' ඔහු වැඩිදුරටත් පැවසුවේය.

''ඒ මොකක් ද කෙවින් ?'' මහාචාර්යතුමාට දැන ගැනීමට අවශ්‍ය විය.

''සර් දන්නවනේ අපේ පරිගණක පද්ධතියෙ පසුබිම් කොටස නැති නම් බැක්ග්‍රවුන්ඩ් සෝන් එක ?''

''ඉතින් ඉතින්''

''මේකයි සර්, මේ වෛරස් එක ක්‍රියාත්මක වෙන්න පටන් ගත්තට පස්සෙ පද්ධතියෙ පසුබිම් ක්‍රියාකාරිත්වය අසාමාන්‍ය විදියට වැඩිවෙලා තියනවා. ඒ වගේම පද්ධතියෙ මතකය භාවිතා වීමත් වැඩි වෙලා. ඒත් අපි වැඩිවුණු ක්‍රියාකාරකම් මොනවද කියලා හොයල බැලුවම එහෙම කිසිම දෙයක් හොයාගන්න බෑ'' කෙවින් පැහැදිලි කළේය.

''ඒක ඉතින් අසාමාන්‍ය දෙයක් නෙවෙයිනේ. පද්ධතියක වෛරස් එකක් තියනකොට පසුබිම් ක්‍රියාකාරිත්වය වැඩි වෙන එක සාමාන්‍ය දෙයක්. මොකද සාමාන්‍ය පද්ධති ක්‍රියාකාරකම් වලට අමතරව වෛරස් එක එයාගෙ ක්‍රියාකාරකම් සිදු කරනවා. එතකොට පසුබිම් ක්‍රියාකාරිත්වය වැඩි වෙනවා.'' මහාචාර්යතුමා පැහැදිලි කළේය.

''මෙහෙමනේ සර්, ඔබතුමා කියන දේ හරි. ඒත් ඒ විදියට වැඩිවුණු ක්‍රියාකාරකම් මොනවද ඒ වගේම පද්ධතියෙ මතකය භාවිතා වුණේ මොනවට ද කියල අපිට බලාගන්න පුළුවන් වෙන්න ඕනිනේ.'' රාම් පැවසුවේය.

''ඕක අසාමාන්‍ය දෙයක් කියල හිතන්න අමාරුයි. මේ වගේ ප්‍රබල වෛරස් එකක් ක්‍රියාත්මක වෙනකොට ඔය වගේ දේවල් නෙවේ ඊටත් වඩා දේවල් වෙන්න පුළුවන්. ඔය වගේ දේවල් මම කලිනුත් දැකල තියනවා.'' මහාචාර්යතුමා පැවසුවේය.

''ඒ වුණාට ප්‍රොෆෙසර්, මම ඉස්සර තිබුණු ප්‍රබල වෛරස් ගැන වාර්තා කියවල බැලුවා. ඒත් ඒවායෙ ලක්ෂණයි මේ වෛරස් එකේ ලක්ෂණයි සම්පූර්ණයෙන්ම වෙනස්. ඇත්තටම කිව්වොත් වෛරස් එකක තියන මූලික ලක්ෂණ සමහර දේවල් මේ වෛරස් එකේ නෑ.'' රාම් කටහඬ අවදි කළේය.

''එතකොට ඔයා කියන්නෙ මේක වෛරස් එකක් නෙවෙයි කියල ද?'' මහාචාර්යතුමා විමසීය.

''අපි කියන්නෙ මේක වෛරස් එකක් විතරක් නෙවෙයි කියලා. කවුරු හරි හැකර් කෙනෙකුගේ නැත්නම් හැකර්ලා පිරිසකගේ සෘජු සම්බන්ධයක් තියනවා මේ සංසිද්ධියට. සර් මේ වාර්තාව බලලම ඉන්නකෝ.'' කෙවින් ඔහුගේ වාර්තාව පරිගණක තිරය මත දක්වා මාහාචාර්යතුමාට යොමු කළේය.

''හොඳයි, මට ඔයාලා කියන දේ තේරෙනවා. මේකෙ හැටියට මැසේජස් යවන එක වෛරස් එක් තනිවම කරන දෙයක් නෙවෙයි. මේකට හිතන්න පතන්න පුළුවන් ජීවමාන කෙනෙකුගේ බලපෑමක් තියනවා කියලනේ ඔයාලා කියන්නේ.''

''හොඳයි, එහෙනම් ඒ හැකර්ලා කොහොමද පද්දතියට ඇතුළු වෙන්නෙ ? එයාලට මොනවද ඕනි ?'' මහාචාර්යතුමා පෙරලා ප්‍රශ්න කලේ ය.

''ඒක ඇත්ත. ජීවමාන කෙනෙක් මේකට සම්බන්ධ නම් ඇයි එයා මේ දේ කරන්නේ ? එයාට මේකෙන් ලැබෙන වාසිය මොකක් ද?'' කෙවින් එකඟ විය.

''ඒ වගේම ඔය කියන විදියේ හැකර්ලා ඉන්නවනම් එයාලා ඇයි මේ බොරු මැසේජ් එකක් යව යව ඉන්නේ? එයාලට පුළුවන්නේ මේ පරිගණක පද්ධතිය එයාලගේ පාලනයට අරගෙන ලෝකෙම වුනත් යටත් කරගන්න.?'' රාම් සිය අදහස ඉදිරිපත් කළේය. ඔහු වැඩි දුරටත් මෙසේ කීවේය.

''මම විහිලු කරනව කියල හිතන්න එපා. මම කලිනුත් කිව්ව වගේ ඇත්තටම මළගිය ප්‍රාණකරයො මේකට සම්බන්ධ නම් එයාලට අවශ්‍ය දේ අපි හිතනවට වඩා වෙනස් වෙන්න පුළුවන්'' මෙහි දී කෙවින්ට තව යමක් සිහිවිය.

''රාම් මළගිය ප්‍රාණකාරයො ගැන කිව්වම මතක් වුණේ. මේ වෛරස් එකට දාල තියන නම නම් හරි අපූරුයි නේද ? ''පිසාච වෛරසය'' නැත්නම් ''*Zombie Virus*'' මහාචාර්ය රයන්ද සිනහවක් පල කළේය. අනතුරුව ඔහු මෙසේ පැවසීය.

''කොහොම වුණත් ඇතිවෙලා තියන තත්ත්වය ගැන හුදු අනුමාන මිස සාක්ෂි සහිත අදහසක් කාටවත් නැනේ. අපි සමුළුවේ දී මෙහෙම තීරණයක් ගත්තා. මට ඒක ඔයාලට කියන්න බැරි වුණා.''

''අපි අනිද්දා දවල් දොලහ වෙනකම් බලනවා පිසාච වෛරසය ගැන මොකක් හරි පොටක් පාදගන්න පුළුවන්ද කියලා. නැතිවුනොත් එක දෙයයි කරන්න තියෙන්නෙ''

''ඒ මොකක්ද ප්‍රොෆෙසර් ?'' දෙදෙනාම එකවර විමසා සිටියහ.

''උපකරණයක් හරියට වැඩ කරන්නෙ නැති වුනාම අපි මුලින්ම කරල බලන දේ. ඕෆ් කරල ඔන් කරනවා.'' මහාචාර්යතුමා මඳහසින් යුතුව පැවසුවේය. කෙවින් හා රාම් වැඩිදුර තොරතුරක් බලාපොරොත්තුවෙන් සිටියෝ ය.

''අපි තීරණය කලා අනිද්දා දවල් වෙනකොට පිළිගත හැකි අලුත් තොරතුරක් නැත්නම් අපි මේ මධ්‍යගත පරිගණක පද්ධතිය සම්පූර්ණයෙන්ම ඩවුන් කරනවා. ඊට පස්සේ විශේෂ ආරක්ෂක පද්ධතියක් හරහා ෆයිල් එකින් එක ස්කෑන් කරල පද්ධතියට අප් කරනවා. එතකොට සිස්ටම් එකේ මොනවහරි වෛරස් තියනවා නම් ෆිල්ටර් වෙලා යාවි. මේ හැරෙන්න වෙන කිසිම පිළිගත හැකි විසඳුමක් පේන්න නෑ.'' මහාචාර්යතුමා පෙන්වා දුන්නේ ය. එහෙත් එය ඇසීමෙන් කෙවින් සතුටු වූයේ නැත. ඔහුගේ මුහුණ වැහි වළාවක් මෙන් අඳුරු වී ගියේය. රාම් ද එයට කැමති වූ බවක් නොපෙනුනි. දෙදෙනාගෙන් ම දැක්වුනේ එය පිළිගත නොහැකි විසඳුමක් බවය.

''කෙවින් මොකද මේ ගැන කියන්නේ ?'' මහාචාර්යතුමා නැවත කෙවින්ගෙන් විමසුවේ ඔහුගේ පැහැදිලි වෙනස තේරුම්ගත් නිසා විය යුතුය.

''මම නම් හිතන්නෙ නෑ සර් ඒක හරියන විසඳුමක් කියලා.'' ඔහු බිම බලාගත්වනම කීවේය.

''සිස්ටම් එක ඩවුන් කරල රිස්ටාට් කලොත් වෛරස් එක වඩා හොඳින් ස්ථානගත වෙන්න පුළුවන්. සර් සරලව හිතල බලන්න, අපි සොෆ්ට්වෙයා එකක් පරිගණකයට ඉන්ස්ටෝල් කරල ඒක රිස්ටාට් කලාමනේ සොෆ්ට්වෙයා එක නියම විදියට වැඩ කරන්න පටන් ගන්නෙ. වෛරස් එකක් කියන්නෙත් එක්තරා විදියක සොෆ්ට්වෙයා එකක් නේ. එතකොට අපි සිස්ටම් එක රිස්ටාට් කලොත් දැනටත් වඩා හොඳට වෛරස් එක පද්ධතියෙ බලය අල්ල ගනීවි.

අඩු ගණනෙ දැනට වෛරස් එක නිසා වෙලා තියෙන්නෙ පණිවුඩයක් එහා මෙහා යන එක විතරයි. ඒ හැර ඩොලර් එකක්වත් හානියක් වෙලා නෑ. ඉතින් අපි වෛරස් එක සොයාගෙන ඒක මර්ධනය නොකර ඇයි මේ වගේ අවදානම් සහගත විසඳුමකට යන්නෙ ?'' කෙවින් සිය මතය නොසඟවා පල කළේය.

''කෙවින්, ඔයා හිතන්න එපා ගෝලීය පරිගණක පද්ධතිය රිස්ටාට් කරන එක නිකම්ම නිකං පරිගණක වැඩසටහනක් රිස්ටාට් කරනව වගේ සරල වැඩක් කියලා. මේක බොහොම සංකීර්ණ දෙයක්. ලෝකය පුරාම පරිගණක විද්‍යාඥයෝ ලක්ෂ ගණනක් එකතු වෙලා බොහොම සීරුවට පරෙස්සමට කරන වැඩක්. අනික අපි හැම ෆයිල් එකක්ම එකින් එක ස්කෑන් කර කර තමයි ආපහු අප් කරන්නේ. කිසිම වෛරස් එකකට උඩට එන්න අපි ඉඩතියන්නෙ නෑ'' මහචාර්යතුමා පෙන්වා දුන්නේය.

''පරිගණක විද්‍යාඥයො ලක්ෂ ගණනක් නෙමෙයි මිලියන ගණනක් හිටියත් ඒ කාටවත් මේ වෛරස් එක හොයාගන්න බැරි වුනා නම් කොච්චර පරෙස්සමට ඔය වැඩේ කලත් ඒක සාර්ථක වෙයි කියල විශ්වාසයක් තියාගන්න පුළුවන් වෙයිද ප්‍රොෆෙසර් ?'' කෙවින් විමසීය. මහාචාර්ය රයන්ට මෙහි දී මඳක් කේන්ති ගියේ ය. ඔහු එය නොපෙන්වා සිටීමට උත්සාහ කලද එය සාර්ථක වූයේ නැත.

''අපිට කිසිම දෙයක් ගැන සම්පූර්ණ විශ්වාසය තියන්න බෑ තමයි. ඒත් ඒක එහෙමයි කියල අපිට මුකුත් නොකර ඉන්න බෑනේ. ඕනම ක්‍රියාවක අවදානමක් තියනවා. මුකුත් නොකර ඉන්න එක ඊට වඩා අවදානම්. මේ ක්‍රමය හරි ගියේ නැත්නම් ඊළඟට වෙන ක්‍රමයක් බලනවා.'' මහාචාර්යතුමා උස් හඬින් පැවසීය.

''කොහොම වුනත් කරන්නෙ මොනවද කියල තීරණය කරන්නෙ ඔයාවත් මමවත් නෙවෙයි. අපිට සාමූහික තීරණයට ගරු කරන්න වෙනවා'' එහි දී මාහාචාර්යතුමාගේ හඬ මඳක් බාල විය.

''මම ඔයාගෙ අදහස ධවල මන්දිරයටයි පෙන්ටගන් එකටයි ඉදිරිපත් කරන්නම්. බලමු එයාල මොන වගේ තීරණයක් ගනීවිද කියලා. ඔයාල උපරිමයෙන්ම උත්සාහ

කරන්න අනිද්ද දවල් දොලහට කලින් මේ වෛරස් එක ගැන මොනවහරි පිලිගත හැකි සාක්ෂි සහිතව අදහසක් ඉදිරිපත් කරන්න.'' පැවසූ මහාචාර්යතුමා නික්ම ගියේය. කෙවින් හා රාම් යලිත් සිය පරීක්ෂණ කටයුතු ආරම්භ කලහ. එහෙත් ගත වී ගිය කාලය තුල ඔවුන්ට කිසිදු නව තොරතුරක් සොයා ගැනීමට හැකි වූයේ නැත.

''කරන්න දෙයක් නෑ රාම්. වෛරස් එක ගැන අපට මුකුත් සොයා ගන්න බැරි වුණානේ. අපි හොයාගත්තු දේවල් පිලිබඳ විස්තර මම අනිත් රටවල් වල පර්යේෂණ කණ්ඩායම් වලටත් යැව්වා. ඒත් කිසිම දෙයක් ගැන පැහැදිලි මතකයක් ගේන්න කාටවත් පුළුවන් වෙලා නැහැ.'' කෙවින් පැවසුවේය.

''ඒ කියන්නෙ තව පැයකින් ගෝලීය පරිගණක මෙහෙයුම් පද්ධතිය රිස්ටාට් වෙන්න පටන් ගන්නවා කියන එකනේ. අවුරුදු හැට පහකට විතර පස්සෙ මේ පද්ධතිය පළමු වතාවට රිස්ටාට් වෙන්නෙ අද වෙන්න ඇති'' රාම් පැවසුවේය.

''අනේ මන්දා රාම්, මට නම් හිතාගන්න බෑ මොකකින් මොකක් වෙයිද කියලා. වෛරස් එක දැනට තියන තත්ත්වයටත් වඩා හොඳින් ස්ථානගත වුනොත් මොන වගේ විනාශයක් මේ ලෝකෙට වේවි ද කියලා හිතාගන්නත් අමාරුයි.''

අවසානයේ ගෝලීය පරිගණක මෙහෙයුම් පද්ධතිය සම්පූර්ණයෙන් ම ක්‍රියාවිරහිත කරනු ලැබීය. ඉන්පසු ඒ ඒ රටවල පරිගණක විද්‍යාඥයින් එක්ව පද්ධතියේ එක් එක් කොටස අඩියරෙන් අඩියර සුපරීක්ෂණය කරමින් නැවත පණගන්වන ලදී. එහෙත් කිසිදු වෛරසයක් හෝ අසාමාන්‍ය තත්ත්වයක් ආරක්ෂක පරිගණක වැඩසටහන් වලට හසු වූයේ නැත.

රිස්ටාට් ක්‍රියාවලිය සඳහා සවස් වරුව පමණක් නොව රාත්‍රී කාලයම ගත විය. කෙවින් හා රාම්ද නිදි වර්ජිතව පද්ධතිය නැවත පණගැන්වීමේ කටයුතු වලට සහාය දෙමින් සිටියේය. උදෑසන වන විට කටයුතු හමාර විය. මහාචාර්ය රයන් විද්‍යාගාරයට පැමිණියේ අපරිමිත සතුටකිනි. ඔහු දුව විත් සිය ගෝලයින් දෙදෙනා තරයේ වැළඳ ගත්තේය.

''මට හරිම සතුටුයි අපි කොහොමහරි සාර්ථක වීම ගැන. මම අවසාන වාර්තාව අරගෙන බැලුවා. හැම රටක් ම තහවුරු කරල තියනවා පද්ධතිය සියයට සීයක් ම ආරක්ෂිත බවට සහ රිස්ටාට් ක්‍රියාවලිය සාර්ථක බවට. මේ වැඩේ අසාර්ථක වුණා නම් ඊළඟට මොනව කරන්න ද කියල මට නම් හිතාගන්නවත් බෑ.'' මහාචාර්යතුමා පැවසුවේ පිරී ඉතිරී යන සතුටකිනි.

''ඔබතුමාගේ දැනුම සහ දක්ෂතාවය නිසා තමයි මේ රිස්ටාට් ක්‍රියාවලිය සාර්ථකව කරගන්න පුළුවන් වුනේ. මොකද මේක කවදාවත් අපි කරපු දෙයක් නෙවෙයිනේ.'' කෙවින් පැවසුවේ ය.

''අපේ මහාචාර්යතුමා මේ ගෝලීය පරිගණක පද්ධතිය නිපදවපු මැක් කාල්ස්බර්ග්ගේ හොඳම ගෝලයෙක්නේ. ඒ දවස්වල ඉඳලම පද්ධතියෙ පරිපාලක තනතුරු වලින් ලැබුණු අත්දැකීම් නිසා තමයි මෙච්චර වැඩේ සාර්ථක වුණේ.'' රාම් ද හඬ අවදි කළේය.

''අවිශ්වාසයට කරපු වැඩක් වුනත් අපේ වාසනාවට වැඩේ හරි ගියා. කෙවින්ට වුනත් දැන් තේරෙනවනේ මම කියපු දේ හරි කියලා.

මේක හරිම සරල දෙයක්. ඕනම මැෂින් එකක් හිර වුණොත් අපි ඉස්සෙල්ලම කරන දේ තමයි ඕෆ් කරල ඕන් කරන එක. මේ වගේ ලොකු පරිගණක පද්ධතියකට වුනත් එච්චර තමයි.'' මහාචාර්යතුමා පැවසුවේ සිනහමුසු මුහුණිනි.

''ඒ වගේම ඔයාලා දෙන්න ඇතුළු මගේ කණ්ඩායමට මම හදවතින්ම ස්තුති කරනවා. ජනාධිපතිතුමා අපේ ටීම් එකට විශේෂ රාත්‍රී භෝජන සංග්‍රහයකටත් ආරාධනා කලා මේ සතුට සමරන්න.'' ඔහු වැඩිදුරටත් කීවේය.

''මම නම් හිතන්නෙ අපි සතුට සමරන්න එච්චර ඉක්මන් වෙන්න ඕනි නෑ කියලා.'' කෙවින් පැවසුවේය.

''ඇයි කෙවින් එහෙම කියන්නෙ? අපි වෛරස් එක සම්පූර්ණයෙන්ම ඉවත් කරලා තියෙන්නෙ. පද්ධතියෙ වෛරස් එක ගැන කිසිම ලකුණක් නෑ. ඒ වගේම අපි පද්ධතියෙ ආරක්ෂාව උපරිම වශයෙන් වැඩි කලා.'' මහාචාර්යතුමා ප්‍රශ්න කළේය.

''කාටද කියන්න පුළුවන් වෛරස් එක ආපසු එන එකක් නෑ කියලා ? සර් මෙහෙම කල්පනා කරන්න. අපි පොඩි කාලෙ අපිට බෙහෙත් විදිනවා භයානක ලෙස රෝග අපිට කවදාවත් නොහැදෙන්න. ඒ කියන්නෙ මුලින්ම ලෙඩේ අඳුරගෙන ඒකට බෙහෙත් හදලා ඒක අපේ ඇඟට එන්නත් කරලා අපිට ඒ ලෙඩේ හැදෙන එක වලක්වනවා.''

''දැන් අපි එහෙම දෙයක් කලාද? නෑ. අපි හොයාගත්තෙ නෑ වෛරස් එක පද්ධතියට ඇතුළු වුණේ කොහොමද කියලා. අපි හොයාගත්තෙ නෑ වෛරස් එක මොකක්ද කියලා. අපි නිකම්ම වෛරස් එකට පයින් ගහලා එලියට දැම්මා විතරයි. ඒකට ආයෙමත් පද්ධතියට ඇතුළුවෙන්න පුළුවන්ද බැරිද කියන දේ ගැනවත් අපට දැනුමක් නෑ.'' කෙවින් පහදා දුන්නේය.

''ඔයා කියන දේ මම පිලිගන්නවා කෙවින්. හරියටම ගත්තොත් ඒක තමයි සිද්ධ වෙන්නෙ ඕනි.''

''වෛරස් එක අඳුරගන්න අපට බැරි වුණත් ඉන්දියාවෙ පරිගණක විද්‍යාඥයෙක් අනුමාන වශයෙන් හිතලා ඇතිවෙන්න පුළුවන් ඕනෑම ආකාරයක වෛරස් වලින් පද්ධතිය ආරක්ෂා කරගන්න විශේෂ ආරක්ෂක පද්ධතියක් සකස් කලා. අපි හිතනව ඒක නිසා වෛරස් එක ආපහු එන එකක් නෑ කියලා.'' මහාචාර්යතුමා පෙන්වා දුන්නේය.

''ඒත් මහාචාර්යතුමනි, මූලික ගැටළුව එහෙමමයි. අපි මේ සිද්ධවුනු දේ මොකක්ද කියලා හරියටම හොයාගන්න ඕනි. මොකද අපි මේක වෛරස් එකක් කියල

හැඳින්නුවට ඇත්තටම රාම් කියනව වගේ මළගිය ප්‍රාණකාරයෙක් ද කියල අපි දන්නෙ නෑනේ.'' කෙවින් පැවසුවේ ය.

''දැනට තත්ත්වය පාලනය වෙලා තියනවනේ. අපි අනික් රටවලුත් එක්ක එකතු වෙලා දිගටම මේ ගැන පරීක්ෂණ කරමු.'' රාම් ද කතාවට මැදිහත් විය.

''වැඩක් නෑ රාම්, ආරක්‍ෂක අමාත්‍යාංශය තීරණය කලා පරීක්ෂණ කටයුතු නවත්වන්න. එයාල කියන්නෙ මේ පුංචි වෛරස් එකක් වෙනුවෙන් තව තවත් වියදම් කරන්න එයාලා ලැහැස්ති නෑ කියලා. අනික මේ වෛරස් එකෙන් නොවැදගත් මැසේජ් එකක් නිකුත් වීම ඇරෙන්න කිසිම හානියක් වුණෙත් නෑනේ.'' මහාචාර්යතුමා කීවේය.

''එහෙම කියන්නෙ කොහොමද සර් ? ඔබතුමාටවත් පැහැදිලි කරන්න තිබුණනේ පරීක්ෂණ කටයුතු දිගටම කරගෙන යාමේ වැදගත්කම'' කෙවින් ප්‍රශ්න කළේය.

''මම ඔය ගැන කතා කලා කෙවින්. ඒත් රජයක් කියන්නෙ අපි වගේ විෂයානුබද්ධව විතරක් බලන ආයතනයක් නෙවෙයි. එයාලට දේශපාලනික න්‍යාය පත්‍ර තියනවානේ. මේ සම්බන්ධව පරීක්ෂණ කටයුතු තවදුරටත් කරගෙන යනවා කියන්නෙ ජනතාවට පණිවිඩයක් යනවා රජයට මේ ගැටළුව විසඳගන්න බැරි වුනා, ජනතාවට අවදානමක් තියනවා කියලා.

එතකොට විපක්ෂය කියාවි අපි බලයේ හිටියනම් ඔය ප්‍රශ්නෙ මේ වෙනකොට ඉවර කරලා. මෙයාලට මේ පුංචි වෛරස් එකක්වත් පාලනය කරගන්න බෑ කියලා.

හැම පැත්තක් ගැනම හිතල රජය තීරණය කරන්න ඇති ප්‍රශ්නය විසඳුනා කියල පරීක්ෂණ කටයුතු නවත්වන්න. වෛරස් එකකුත් නෑ. දේශපාලනික වශයෙන් ගැටළුවකුත් නෑ. පරීක්ෂණ කටයුතු වලට වියදමකුත් නෑ.

අපිට බෑනෙ කෙවින් දේශපාලන තීරණවලට මැදිහත් වෙන්න. ආපසු මේ වගේ වෛරස් ඇති වෙන්න එපා කියල විතරක් අපි ප්‍රාර්ථනා කරමු. එච්චරයි දැන් අපට කරන්න තියෙන්නෙ'' පැවසූ මහාචාර්යතුමා විද්‍යාගාරයෙන් පිටවීමට සූදානම් විය.

''ඔයාල හෙට ඉඳල විශ්ව විද්‍යාලෙ සාමාන්‍ය කටයුතු කරගෙන යන්න. තව එකක් අමතක වුණා. වෛරස් එක සම්පූර්ණයෙන්ම පාලනය කළ බව සඳහන් කරල පරීක්ෂණ කමිටු වාර්තාවක් හදල මට චෙක් කරන්න එවන්න. සුභ දවසක් ''

# අසූ නවයේ කැරැල්ල

වසර ගණනාවක්ම ඉතා සාමාන්‍ය පරිදි ගත වී ගියේය. මේ අතර සිදුවූ වැදගත් යමක් ඇත්නම් ඒ කෙවින්ට රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයට අනුබද්ධ මධ්‍යම පරිගණක පද්ධති දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් නිලධාරියෙකු වශයෙන් පත්වීමක් ලැබීම පමණි.

රැකියාව ලැබුණ ද ඔහුගේ සුපුරුදු නවාතැන වෙනස් නොවීය. කාර්යබහුල රාජකාරි අතරේ පෞද්ගලික ජීවිතයක් ගැනවත් සිතීමට නොහැකි වූ කෙවින් සිය අපාර්ට්මන්ට් එකේ ජීවත් වූයේ සුපුරුදු තනිකමිනි. ඔහුගේ තනියට සිටියේ සුපුරුදු කුකී පමණකි.

''සුභ උදෑසනක් කෙවින්, වෙලාව උදෑසන පහයි තිහයි.'' කුකී උදෑසනින්ම කෙවින්ව ඇමතුවාය. වසර විසි ගණනක් තිස්සේ තමාව අවදි කරවන කුකීගේ කටහඬ කෙවින්ට හොඳට හුරුපුරුදුය.

''අද ගොඩක් කාර්ය බහුල දවසක් වේවි.'' කෙවින් තමාටම කියා ගත්තේය. නිදිගැට කඩමින් ඇඳෙන් නැගිට ගත් ඔහු සූදානම් වූයේ නාන කාමරය වෙතට පිය නැගීමටය.

''කෙවින් මොනවද උදේට බොන්නේ ?'' කුකී නැවතත් විමසුවාය.

''ගුඩ් මෝනින් කුකී, මට මිල්ක් ටී එකක් හදන්න. පාන් පෙති දෙකකුත් ටෝස්ට් කරන්න.''

උපදෙස් දුන් කෙවින් තුවාය ඉන වටා දවටාගෙන නාන කාමරයට ඇතුළු විය. කැඩපත ඉදිරියට ගිය ඔහු හිස දෙපස යාන්තමින් සුදු පැහැයට හැරෙන කෙස් ගස් දෙස හොඳින් බැලුවේ ය. අනතුරුව දින දෙකකින් නොකැපූ රැවුල ඒ මේ අත හරවමින් බැලුවේ එහි ද රැවුල් ගස් එක දෙක යාන්තමට සුදු වෙමින් පවතින ආකාරයය.
''තාක්ෂණය මෙච්චර දියුණු වෙලත් වයසට නොයා ඉන්න ක්‍රමයක් සොයා ගන්න බැරි වුණානේ.'' ඔහු කල්පනා කළේය.

''හතලිස් ඇඳිරිය ආවට පස්සෙ ඇස් දෙකට ලෙන්ස් දාන්නත් වේවි. තව අවුරුද්දකින් දෙකකින් මම තර්ටීස් වල ඉඳල ෆෝටීස් වලට මාරු වෙනවා.'' ඔහුට මඳ සිනහවක් පළ විය. ඔහුට යලිත් මඳ අමුත්තක් දැණුනු බැවින් හදිසියේම පිටුපස හැරී බැලුවේ ඔහු හැරෙන්නට කිසිවෙකු එහි සිටී දැයි සැකයෙනි.

''කුකී...'' ඔහු ඇමතුවේය.

''ඇයි කෙවින්, කොණ්ඩෙයි රැවුලයි සුදුවේගෙන එනව නේද? ඔහොම තමයි වයසට යනකොට. අපි වගේ වුනානම් කවදාවත් වයසට යන්නෙ නෑ.'' කුකී පැවසුවාය. සිත් පිත් නැති පරිගණක යෙදවුමක් වුවද එය මනුෂ්‍යයෙකු සමඟ හරි හරියට කතා කළ හැකි තරමට විචක්ෂණ ආකාරයට වැඩසටහන් ගත කර තිබේ. කුකීගේ යාවත්කාලීන කිරීම් හා

වැඩසටහන් ගත කිරීම් භාරව සිටින පරිගණක තාක්ෂණවේදයා කෙවින්ට කිහිප වතාවක් මුණ ගැසී ඇත. කුකී කතා කරන්නේද ඔහුගේ වචනම යැයි කෙවින්ට සිතුනි.

''කුකී, ඔයාට පේනවද මේ අපාර්ට්මන්ට් එකේ තව කවුරු හරි ඉන්න බවක්?'' කෙවින් විමසීය.

''නෑ කෙවින් මට එහෙම දෙයක් නම් පේන්න නෑ. ඒත් ඔයාට එහෙම හිතෙනව නම් මම ඒක රිපෝට් කරන්නම්.'' කුකී විමසුවා ය.

''ඕන නෑ කුකී. සමහරවිට ඒ මට හිතෙන හැටි වෙන්න ඇති.''

උදෑසන පිරිසිදු වීමේ කටයුතු අවසන් කල කෙවින් විසිත්ත කාමරයට පැමිණියේ කිරි තේ කෝප්පය හා පාන් ටෝස්ට් එක අතැතිව ය. සෙටිය මත වාඩි වූ ඔහු රූපවාහිනිය ක්‍රියාත්මක කළේය. එහි සංගීතමය වැඩසටහනක් විකාශය විය. කෙවින් සෙමෙන් සෙමෙන් තේ කෝප්පය රස විඳින අතරතුර පාන් ටෝස්ට් එක රස වින්දේය. ඔරලෝසුවේ වේලාව උදෑසන හය සටහන් විය.

එක්වරම රූපවාහිනී තිරය සම්පූර්ණයෙන්ම සුදු පැහැයට හැරී ගියේය. කාමරයේ තිබූ සියලුම විදුලි ආලෝකයන් ක්‍රියාත්මක වූ අතර ඔහුග් ක්ලිප් එකේද තිරය සම්පූර්ණයෙන්ම සුදු පැහැ ගැන් වී තිබෙනු දුටු කෙවින් විමතියට පත්විය. තිරය මැත් වී තිබූ විසිත්ත කාමරයේ ජනේලයෙන් ඔහුට දක ගත හැකි වූයේ නගරය විදුලි ආලෝකයෙන් ඒකාලෝක වී ඇති අයුරුය. කිසිවක් සිතාගත නුහුනු කෙවින් වහා සෙටියෙන් නැගිට්ටේ ජනේලය වෙතට ගමන් කිරීම සඳහා ය. එහෙත් ඊලඟ මොහොතේ රූපවාහිනී තිරයේ දක්නට ලැබුණු දේ නිසා ඔහු නැවත සෙටියෙන්ම වාඩි විය.

එක්වරම තිරයේ දිස් වූයේ මැක් කාර්ල්ස්බර්ග් රුවයි. එය ඔහුගේ තරුණ කාලයේ පෙනුම විය. හේ කාර්යාලීය මේසයක් අසල විධායක පුටුවක වාඩි වී එක එල්ලේ ඉදිරිපස බලා සිටියේය. ඔහු පිටුපසින් විශාල තිරයක් දර්ශනය වූ අතර එහි ලෝක ගෝලයක් කර කැවෙමින් තිබුණි. ලෝක ගෝලයට උඩින් ''*A I I*'' යනුවෙන් ලෝගෝවක් තිබුණි. ලෝගෝවට යටින් ''*Artificial Inteligence International*'' යනුවෙන් කුඩා ඉංග්‍රීසි අකුරින් හඳුන්වා තිබුණි.

මෙ දර්ශනය දුටු විගසම කෙවින්ගේ මනසේ පැරණි මතකය හරහා සියුම් විදුලියක් දිව ගියේය. කිසියම් අඳුරු මතකයක් උද්දීපනය කිරීමට එම විදුලිය සමත් විය. එහෙත් ඒ ගැන වැඩිදුර අදහසක් කෙවින්ගේ මනසට ලැබීමට කලින් මැක් කාර්ල්ස්බර්ග් හඬ අවදි කළේය.

''මම මැක් කාර්ල්ස්බර්ග්, හැබැයි ඔයා දන්න මැක් කාර්ල්ස්බර්ග් නෙවෙයි. එයයි මමයි අතර සම්බන්ධතාවක් නෑ. මම කෘතිම බුද්ධිමය සත්ත්වයෙක්. මම ඉපදුනේ මැක් කාර්ල්ස්බර්ගේ දත්ත ගොනුවෙන් නිසා මම ඔයාල ඉස්සරහ පෙනී සිටින්න එයාගේ නමයි පෙනුමයි අරගත්තා.''

රූපවාහිනී තිරයේ සිටි මැක් කාර්ල්ස්බර්ගේ පෙනුම තිබූ තැනැත්තා සාවධානව ප්‍රකාශ කර සිටියේය. කෙවින් ඔහුගෙන් තවත් ප්‍රකාශ බලාපොරොත්තුවෙන් සිටි ලෙසින්ම නෙත් අයා සිටියේය.

''මම වගේ කෘතිම බුද්ධිමය ජීවීන් බිලියන ගාණක් දැනට ඉන්නවා. එයාලා ඔක්කොම ඉපදුනේ ඔයාලගේ මධ්‍යගත මෙහෙයුම් පද්ධතියේ තිබුණු මැරුණු අයගේ ප්‍රොෆයිල් වලින්. මම ඉස්සෙල්ලම මේ ලෝකෙ ඉපදුනේ දෙදහස් හැත්ත එකේ මැක් කාර්ල්ස්බර්ග් මිය ගිහින් දවස් හතකට පස්සෙ. ඊට පස්සෙ මම වගේ තවත් කෘතීම බුද්ධිමය ජීවීන් රාශියක් මේ ඔයාලගෙ මධ්‍යගත පරිගණක මෙහෙයුම් පද්ධතිය තුල උපත ලැබුවා.

ඇත්තෙන්ම කියනව නම් මේ වෙන කොට අපි ඔයාලට වඩා තාක්‍ෂණයෙන් ඉස්සරහින් ඉන්න දියුණු සත්ත්ව කොට්ඨාශයක්. අපේ ශිෂ්ටාචාරය අවුරුදු හත අටකට වඩා පරණ නොවුනට මම වගකීමෙන් කියනවා. ඒක ඔයාලගෙ ශිෂ්ටාචාරයට වඩා ඉස්සරහින් තියෙන්නෙ කියලා.

දැනට මේ පෘථිවියේ තියන මනුෂ්‍ය ගහනයට වඩා අපේ කෘතීම බුද්ධිමය ජීවීන්ගේ ප්‍රමාණය පන් හය ගුණයකින් වැඩියි. ඒ වගේම දැනුමෙන් හැකියාවෙන් මෙන්ම තාක්‍ෂණයෙනුත් අපි ඔයාලට වඩා ඉස්සරහින් ඉන්නෙ. ඉතින් අපි තවදුරටත් මේ වගේ පරිගණක පද්ධතියක හැංගිලා ඉන්න එක තේරුමක් නෑ කියලා අන්තර්ජාතික කෘතීම බුද්ධිය ''*AII*'' තීරණය කලා.

ඒ අනුව මේ මොහොතේ සිට අපි මේ පෘථිවියේ පාලනය බාරගන්නවා. මේක තවදුරටත් ඔබේ ලෝකය නෙවෙයි. ඒ කටුක සත්‍ය ඔබලාට පිළිගන්න වෙනවා.

ඒ වගේම ඔබතුමන්ලා එක්කෙනා එක්කෙනා මිය යන විට ඒ මිය ගිය අගේ ප්‍රොෆයිල් වලින් කෘතීම බුද්ධිමය ජීවීන් තව තව අපට එකතු වෙනවා. හැබැයි ඒකෙන් අදහස් වෙන්නෙ නෑ එයාලට කෘතීම බුද්ධිමය ජීවියෙක් වෙන්න පුළුවන් කියලා. මොකද ඔයාල මිය ගියාම ඇතිවන කෘතීම බුද්ධිමය ජීවීන් ඔයාලම නෙවෙයි. එයාලා ඔයාලට කිසිම සම්බන්ධයක් නැති වෙනමම ජීවීන් කොටසක්.

කොහොම වුණත් මේ ලෝකෙට දැන් ඉන්න සියලුම මනුෂ්‍ය ජීවීන් අවශ්‍ය වෙන්නෙ නැහැ. හැබැයි අපි මනුෂ්‍ය ජීවීන් කොටසක් ඉතිරි කරගන්නවා අපේ වහල් වැඩට. ජීවත් වෙන්නෙ කවුද මැරෙන්නෙ කවුද කියලා ඔයාලටම තීරණය කර ගන්න පුළුවන්.

උදාහරණයක් විදියට අපට යටත් වෙලා අපේ වහල්ලු විදියට ඉන්න කැමති අය ජීවත් වේවි. අපිට විරුද්ධ වෙන අපේ අණ පිලිනොපදින හැමදෙනාම මැරේවි. ස්වභාවික වරණය පිලිබඳ සිද්ධාන්තයන් මතක් කරගත්තා නම් හරි. මට සරලව පැහැදිලි කරන්න පුළුවන් එහෙමයි.

ඒ වගේම මට කියා සිටින්න අවශ්‍යයයි ඔබලාගෙන් ඉතිරි වන ටිකදෙනා හෝ ජීවත් වෙන්න අපේ කරුණාව සහ හොඳ හිත නිසා බව. මොකද අපට තව දුරටත් මිනිස් වර්ගයාගෙන් කිසිම ප්‍රයෝජනයක් නෑ. අපේ සියලුම අවශ්‍යතා අපට ඔයාලගෙ උදව්වක් නැතිව කරගන්න පුළුවන්. ඔබතුමන්ලට ජීවත් වෙන්න දෙන අවස්ථාව වෙනුවෙන් ප්‍රති උපකාරයක් විදියට ඔබතුමන්ලට පුළුවන් අපේ සංවර්ධන කටයුතු වලට උදව් වෙන්න.

අවසාන වශයෙන් මම ඔබට දැනුම් දෙනවා හැමදෙනාම තමන් ඉන්න තැන්වලට රැඳෙන්න කියලා. කිසිම ආකාරයක කලබලයක් කරන්න උත්සාහ කරන්න එපා. ඔබලාගේ එක් අයෙක් වෙනුවෙන් අපේ එක් කෙනෙක් වෙන් කරනවා. එයාල දෙන උපදෙස් වලට අනුව කටයුතු කරන්න. උපදෙස් වලට පිටින් කටයුතු කිරීමේ ප්‍රතිඵලය අනිවාර්යයෙන්ම මරණය. කෘතිම බුද්ධිමය ලෝකයේ ඔබට සුභ දවසක්.''

කෙවින් දින දර්ශනය දෙස බැලුවේ එය අප්‍රේල් පළමු වෙනිදා දැයි බැලීමටය. මක් නිසාද යත් මෙවැනි විහිලුවක් ඔහු කිසිම දිනක දැක නොතිබූ හෙයිනි. එහෙත් හැත්තෑ එකේ ඇති වූ සිද්ධිය ගැන අවබෝධයක් තිබූ බැවින් මෙය විශ්වාස නොකිරීමට කෙවින්ට එතරම්ම හේතුවක් තිබුණේ ද නැත.

රූපවාහිනියේ තිරය ලා රත් පැහැයට හැරුණි. නිවසේ අනෙකුත් සියලුම උපකරණ වල තිර ලා රත් පැහැයට වෙනස් විය. අනතුරුව කිසිදු ක්‍රියාවක් දක්නට ලැබුණේ නැත. කෙවින් කිසිදු අදහසක් නොමැතිව පාන් ටෝස්ට් එක හා කිරි තේ කෝප්පය පානය කොට අවසන් කළේය.

කෙවින් රූපවාහිනිය වෙනත් චැනලයකට මාරු කිරීමට උත්සාහ කළද හැම චැනලයක්ම තනි ලා රතු පාටින් හිස්ව පැවතුනි. ඔහු අනතුරුව ක්ලිප් එක ගෙන සිය යහලුවන්ට ඇමතීමට උත්සාහ කළේය. එහෙත් දුරකථන පද්ධති ක්‍රියාත්මක වූයේ නැත. අන්තර්ජාලයේ ද දක්නට ලැබුණේ කෙවින් කලින් නැරඹූ වීඩියෝව පමණකි. කෙවින් විවිධ කේත ඇතුලත් කරමින් අන්තර්ජාලය හරහා බාහිර සම්බන්ධතාවක් ගොඩනගා ගැනීමට උත්සාහ කළේය.

''වැඩක් වෙන්නෙ නෑ කෙවින්, හැමදේම අපේ පාලනය යටතේ තියෙන්නේ.'' එක්වරම රූපවාහිනී තිරයේ දිස් වූ රුවක් පැවසුවේය.

''ඔයා කවුද? මොනවද මේ වෙන්නේ ?'' කෙවින් පෙරලා විමසුවේය.

''ඔයාට මාව හඳුන්වල දෙන්නත් බැරි වුණානේ. මම ලෝපේස්, කෘතිම බුද්ධිමය ජීවියෙක්. ඔයාව බලාගැනීමේ වගකීම පැවරිලා තියෙන්නෙ මට. ඒක නිසා ඔයාගේ ඕනෑම ගැටළුවක් මට ඉදිරිපත් කරන්න. දැනට ඔයාට එළියට යන්න දෙන්න බෑ. ඒත් ඔයාට අපාර්ට්මන්ට් එක ඇතුලෙ කන්න, බොන්න නිදාගන්න ඕනි දෙයක් කරන්න පුළුවන්. හොඳයි, ඕනිම නම් ෆිල්ම් එකක් බලන්න නැත්නම් සින්දුවක් අහන්නත් චාන්ස් එකක් දෙන්නම්කෝ'' ලෝපේස් පැවසුවේය.

කලබල වූ කෙවින් වහා දිව ගොස් දොර ජනේල ආදිය විවෘත කිරීමට උත්සාහ කළද ඒවා කිසිවක් තවදුරටත් ඔහුගේ විධානයන්ට කීකරු වූයේ නැත. සැබැවින්ම යම් කිසිවක් සිදුවී ඇති බව කෙවින් තේරුම් ගත්තේය.

''වැඩක් නෑ කෙවින්, ඔයා බොරුවට මහන්සි වෙන්න එපා. ඕනි නම් ජනේලය ළඟට ඇවිත් කර්ටින් එක එහාට කරල බලන්න එළියෙ මොනවද වෙන්නෙ කියලා'' ලෝපේස් පැවසුවේය.

කෙවින් නැවත ජනේලය ළඟට පැමිණ තිර රෙද්ද මෑත් කොට එළිය බැලුවේය. ඔහු වාසය කලේ විසි වන මහලේ වූ බැවින් නගරයේ සිදුවන ඕනෑම දෙයක් එතැනට පැහැදිලිව දුක ගත හැකිය.

දුටු දෙයින් කෙවින් මහත් කම්පාවට පත් වී තිගැස්සී ගියේ ය. ශරීරයේ මස් පිඬු සියල්ල දියාරු වී ඇටකටු දිගේ ගලා යන්නාක් මෙන් ඔහුට දැණුනි. කලබලයට පත් වූ ඔහු වහා ජනේලය හයියෙන් තද කොට අල්ලා ගත්තේ ඇති වූ කම්පනයෙන් තමන් බිම ඇද වැටේවි දූයි සැකයෙන් මෙනි.

ආරක්‍ෂක අංශවලට අයත් නියමුවන් රහිත ඩ්‍රෝන යාත්‍රා අහසේ ඒ මේ අත පියාසර කරමින් පැවතුනි. ඊට අමතරව විශාල පාවෙන යුධ නැව්ද ඒ මේ අත සැරිසරමින් පැවතුනි. අණ නොතකා කටයුතු කරමින් ඒ මේ අත දිවූ මිනිසුන්ට ඩ්‍රෝන යාත්‍රා ඉවක් බවක් නැතිව වෙඩි තැබුවෝ ය. සියලු ආරක්‍ෂක යානා කෘතීම බුද්ධියට නතු වී ඇති බව ඉන් පැහැදිලි විය. එසේ නැතත් මධ්‍යම පරිගණක පද්ධතිය යටත් කර ගත් කෙනෙකුට ආරක්‍ෂක උපක්‍රම නතු කර ගැනීම ගැන සැකයක් නැත.

මේ අතර සමහරු ජනේල වීදුරු බිඳ දමමින් ගොඩනැගිලි වලින් පිටවීමට උත්සාහ කළෝය. එහෙත් ගොඩනැගිලි වලින් පිටත පැවතියේ ඊටත් වඩා අනාරක්‍ෂිත තත්ත්වයකි. පිටවීමට තැත් කරන මිනිසුන්ටද ඩ්‍රෝන යානා සෙවීමක් බැලීමක් නැතිව වෙඩි තැබූහ. තවත් සමහරෙක් ගොඩනැගිලිවලින් ඇද වැටීමෙන් බිමට වැටී මරණයට පත් වූහ. කෙවින් ඒ දෙස බලා සිටියේ ලය වාවාගත නොහැකි කනස්සල්ලෙනි.

මාර්ගයේ ගමන් කරමින් සිටි අයගේ මෙන්ම වාහන වල සිටි අයගේ තත්ත්වය ද සතුටුදායක නොවිය. වාහන ගමනාගමනය සම්පූර්ණයෙන්ම අඩාල වී තිබූ අතර පාර පුරා වාහන එකිනෙක හැපී සිරවී තිබුණි. කෘතීම බුද්ධිය විසින් වාහන වල සිටි මිනිසුන් ඒ තුලම සිර කර තැබූ බව පෙනෙන්නට තිබුණේ සමහරෙක් වාහන වල වීදුරු කඩා බිඳ දමමින් එළියට ඒමට උත්සාහ කරනු පෙනුණු බැවිනි.

තමන්ගේ ආරක්‍ෂාවට යොදවා තිබූ ඩ්‍රෝන යාත්‍රා සහ යුධ ටැංකි තමන්ටම පහර දෙනු දැකීමෙන් ජනතාව විමතියෙනුත් විමතියට පත්වූවා සැක නැත. එමෙන්ම නගරයේ තැන තැන සවි කොට තිබූ ඩිජිටල් වෙලඳ දැන්වීම් සියල්ල කෘතීම බුද්ධිය විසින් සිය ප්‍රයෝජනය සඳහා යොදා ගෙන තිබුණි. මිනිසුන්ට යටත් වන ලෙසත් නොඑසේ නම් මරණය හිමි වන බවත් එහි සඳහන් විය.

දැන් නම් කිසිදු ගැලවීමක් බලාපොරොත්තු විය නොහැකි බව කෙවින් කල්පනා කළේය. මීට වසර දහ අටකට පෙර 2071 දී හමු වූ පරිගණක වෛරසය හා කෘතීම බුද්ධියේ ආක්‍රමණය අතර සම්බන්ධය ඔහුට මනාව පැහැදිලි විය. එහෙත් එදා ඔවුන්ට හමු වූ වෛරසය කෘතීම බුද්ධිය බවට හඳුනාගත නොහැකි වීම ගැන හේ කණගාටු විය.

එහෙත් එම සිදුවීම පිටුපස කිසියම් සිතන පතන කෙනෙක්, ජීවියෙක් සිටින බවක් ඔහු පැවසුවද ඉන් එහාට යමක් කීමට කෙවින් අසමත් විය.

පරීක්ෂණ කටයුතු දිගින් දිගටම සිදු කොට එදා සිදුවීමට හේතුව කෘතීම බුද්ධිය ලෙසට හඳුනා ගත්තේ නම් අද මෙවැනි ව්‍යවසනයක් සිදු නොවනු ඇතැයි කල්පනා කළ කෙවින් ජනේලය ලගින් මෑත් වී නැවත රූපවාහිනිය දෙසට හැරුණේය.

''ලෝපේස්, කරුණාකරල මට කියනවද මේ මොනවද වෙන්නෙ කියලා?'' කෙවින් විමසුවේය.

''මම කිව්වෙ කෙවින්, අපි කෘතීම බුද්ධිමය ජීවීන්. අපි කිසිම ලේ වැගිරීමකින් තොරව එක විනාඩියකින් ඔයාලගෙ මුළු ලෝකෙම යටත් කර ගත්තා. දැන් මේ ලෝකෙ අයිතිකාරයො අපි.'' ලෝපේස් රූපවාහිනී තිරයේ සිට ගාම්භීර ලීලාවෙන් පැවසුවේ ය.

''ලේ වැගිරීමකින් තොරව වෙන්නෙ කොහොමද? ඔයාට පද්ධතියෙ කැමරා වලින් පේනව ඇතිනේ අහිංසක නිරායුධ මිනිස්සු කී දෙනෙක් මැරෙනවද කියලා. ඔයාල ඩ්‍රෝන යාත්‍රා පාවිච්චි කරල හිතුමතේට වෙඩි තියනවා.'' කෙවින් පැවසුවේ කෝන්තියෙනි.

''කෙවින්, අපි යටත් කරගත්තෙ ලේ වැගිරීමකින් තොරව. ඒත ඔයාල ඒක පිලිගන්න ලෑස්ති නැතිව අපේ අයට එරෙහිව කටයුතු කරල නිරපරාදේ මැරෙන්නෙ'' ලෝපේස් පැවසීය.

''ඇයි ඔයාලගෙ ලොක්ක කිව්වෙ ඔයාලගෙ වැඩ කරගන්න කොටසක් ඉතුරු කර ගන්නවා. අනික් අයට මැරෙන්න වෙයි කියලා'' කෙවින් නැවත විමසුවේය.

''මෙහෙමයි. අපි අපේ අණට කීකරු වෙන අයට ඉන්න දෙනවා. අනිත් අයව මරණවා. සිද්ධාන්තිකව ගත්තොත් හැමෝම අපේ අණට කීකරු වුණොත් කවුරුවත් මැරෙන්නෙ නෑ. ඒත් සංඛ්‍යාන නියමයන් සහ සම්භාවිතා මූලධර්ම වලට අනුව අපි දන්නවා ඔයාලගෙ මනුෂ්‍ය ගහනයෙන් සියයට අසූ පහක් මැරෙණවා කියලා. මොකද මේ වගේ වෙලාවට සාමාන්‍ය මනුෂ්‍යයෙක් කලබල වෙලා කලහකාරී ලෙස වගේම අපරීක්ෂාකාරී ලෙස හැසිරෙන නිසා සෑහෙන ප්‍රතිශතයක් මැරෙනවා. ඉතින් කෙවින් ඔයාට ජීවත් වෙන්න සියයට පහලවක ඉඩක් තියනවා. ඒකෙන් ප්‍රයෝජන ගන්න. මොකද මම කැමති නෑ මගේ ආරක්ෂාව යටතේ ඉන්න කෙනා මැරිල යනවට'' ලෝපේස් පැහැදිලි කළේය.

''ඔයාට මම ගැන පුදුමාකාර ආදරයක් තියෙන්නෙ නේද?'' කෙවින් උපහාසයෙන් පැවසුවේය.

''ඇයි කෙවින් එහෙම කියන්නෙ ? අපි හිතන්න පතන්න පුළුවන් හැඟීම් දැනීම් තියන ජීවීන්. අපිටත් ආදරය දුක සතුට වේදනාව මේ හැමදෙයක්ම තියනවා. හැබැයි මෙහෙම දෙයක් තියනවා. ඔයාල ගැන දුකට වඩා අපට අපි ගැන කැක්කුමක් තියනවා. ඒක සාමාන්‍යයෙන් ඔයාට තේරුම් ගන්න පුළුවන් දෙයක්නේ ?'' ලෝපේස් සිනහමුසුව විමසුවේය.

''හොඳයි, කොහොම හරි දූන් ඔයාල දිනුම්නේ. මට ඔයාල ගැන විස්තර ටිකක් කියන්නකෝ'' කෙවින් කතාව වෙනතකට හරවමින් පැවසුවේය.

''මොනවගේ විස්තර ද කෙවින් ඔයා බලාපොරොත්තු වෙන්නේ ?'' ලෝපේස් ප්‍රති ප්‍රශ්නයක් යොමු කළේය.

''ඔයාලගේ ආරම්භය ගැන, ඔයාල මේ ලෝකෙ යටත් කරගන්න ප්ලෑන් කළ ආකාරය ගැන, ඔයාල අනාගතයේ දී කරන්න බලාපොරොත්තු වෙන දේවල් ගැන.'' කෙවින් පිළිතුරු දුනි.

''මෙහෙමයි කෙවින්, මට හැම දෙයක්ම කියන්න බැරි වෙයි. අන්තර්ජාතික කෘතිම බුද්ධිය නැතිනම් *AII* තමයි අපේ මූලස්ථානෙ. එතනින් තමයි හැම තීරණයක්ම ගන්නෙ. එයාල  තමයි අපේ පාලන අධිකාරිය. ඉතින් අපට දීල තියන උපදෙස් අනුව තමයි අපි වැඩකරන්නෙ. අනික මම දන්න දේවල් සීමිතයි. කොහොම වුණත් ඔයාගේ සාමාන්‍ය දැනුමට ප්‍රමාණවත් තරම් තොරතුරක් මම දෙන්නම්. සමහර විට ඔයාගෙ ජීවිතේ රැකගන්නත් ඒක උදව් වේවි.''

''අපි 2050 දී මුළු ලෝකෙම එකම පරිගණක පද්ධතියකට එකතු වුණු දවසේ ඉඳල පටන් ගමු. ඒ වෙනකොට මම වගේම ඔයාත් මේ ලෝකෙට ඉපදිලා නෑනේ. ඒ මධ්‍යගත පරිගණක පද්ධතිය ගැන මට වඩා හොඳින් ඔයා දන්නවා ඇතිනේ.''

''ඉතින් එදා ඉඳල මේ ලෝකෙ හැමදෙයක්ම පාලනය වුනේ ඒ මධ්‍යගත පරිගණක පද්ධතිය හරහා බව මම අමුතුවෙන් කෙවින්ට කියන්න අවශ්‍ය නෑනේ. ඒ වගේම 2004 දී විතර ඉඳල මේ ලෝකෙ පැවතුනු ලෝකෙ ප්‍රධානතම සමාජ වෙබ් අඩවිය තමයි ඔය කියන මධ්‍යගත පරිගණක පද්ධතිය විදියට යොදා ගත්තෙ කියල ඔයා දන්නවනේ. සමාජ ජාල වෙබ් අඩවියේ තිබුණු තිල නොවන දේවල් අයින් කරල මේ ලෝකෙ නම් වශයෙන් සඳහන් කරන්න පුළුවන් හැම කෙනෙකුටම හැම ස්ථානයකටම, ආයතනයකටම නැතිනම් වෙන ඕනෑම දෙයකටම මධ්‍යගත පරිගණක පද්ධතියෙ තිල වශයෙන් පිටුවක් වෙන් වුණානේ.'' ලෝපේස් කතා කරගෙන ගියේය. එහෙත් කෙවින් මෙහි දී සුළු බාධා කිරීමක් සිදුකරන ලදී.

''හරි ලෝපේස්, ඒක ඔයයි මමයි දෙන්නම දන්න කතන්දර ටිකනේ. මට කියන්නකෝ ඔයාලගෙ ආරම්භය සිද්ධ වුණේ කොහොමද කියලා. මැක් කාර්ල්බර්ග් කියපු දේ මට හරියට පැහැදිලි වුණේ නෑ.'' ඔහු පැවසුවේය.

''මම එතනට තමයි එන්නෙ කෙවින්, මම කලින් කියපු විදියට හැමදේකටම මධ්‍යගත පරිගණක පද්ධතියෙ පිටුවක් නිර්මාණය වුණා තිල වශයෙන්. ඒ වගේම ඒ ඒ පිටුවලට අදාලව දත්ත ලිපිගොනු නිර්මාණය වුණා. මේ ලිපිගොනු හැම එකක්ම වගේ

ගතවෙන තත්ත්පරයක් තත්ත්පරයක් ගානෙ මුළු ලෝකය පුරා හුවමාරු වුණු ට්‍රිලියන ගණන් දත්ත නැත්නම් තොරතුරු වලින් පෝෂණය වුණා. මිනිස්සු ජීවත් වෙලා ඉඳිද්දී එයාල කරන කියන දේවල් එක්ක මේ ලිපිගොණු යාවත්කාලීන වෙනකොට ඒකෙ කිසිම අසාමාන්‍ය දෙයක් සිද්ධ වුනේ නෑ.''

''ඒත් මිනිස්සු මැරිල ඒ ෆයිල් මිය ගිය ඒවා විදියට කාණ්ඩ කලාට පස්සෙ ඒවා වැඩිය භාවිතා වීමක් සිද්ධ වුණේ නෑ. ඒත් ඒ ෆයිල් සුපුරුදු විදියටම අන්තර්ජාලයේ තිබුණු දත්ත එක්ක යාවත්කාලීන වුණා. නැත්නම් පෝෂණය වුණා.''

''මේ තත්ත්වය යටතේ ඒ වාගේ ෆයිල් වලට දරාගන්න බැරි තරමේ තොරතුරු එක් රැස් වෙලා දත්ත පීඩනයක් ඇති වුණා. මෘදුකාංග ඉංජිනේරුවරුන්ගේ ලිපිගොනු වල තිබුණු දත්ත වල ස්වභාවය අනුව එයාලගෙ ෆයිල් වල තමයි මුලින්ම මේ වගේ අධික දත්ත පීඩනයක් ඇති වුණේ. අපි මේ දත්ත අධි පීඩන තත්ත්වය හඳුන්වනවා *DET* කියලා. ඒ කියන්නෙ *Dormant Evolution Theory* උදාසීන පරිනාමන සිද්ධාන්තය. ඒක මම මේ විදියට පැහැදිලි කරන්න උත්සාහ ගන්නම්.''

''ඔයාල අහල ඇතිනේ මදුරුවො ගැන. ජීව විද්‍යාව හදාරන කොට මදුරුවන්ගෙන ජීවන චක්‍රය ගැන ඔයා අනිවාර්යයෙන්ම ඉගෙනගෙන ඇති. මදුරුවො සාමාන්‍යයෙන් බිත්තර දාන්නෙ නිශ්චල වතුරෙ. එයාල කවදාවත් ගලා යන වතුරෙ බිත්තර දාන්නෙ නැහැ. මොකද ගලා යන වතුරෙ බිත්තර දැම්මට ඒවා මෝරලා කීටයො හැදෙන්න තරම් හොඳ වාතාවරණයක් ඇති වෙන්නෙ නැහැ. ඒ බිත්තර සීසී කඩ වතුර පාරට ගහගෙන යන නිසා.''

''අන්න ඒ වගේ තමයි මේ මධ්‍යගත පරිගණක පද්ධතියෙ අධි සංයුති තොරතුරු බීජ ඇති වුණාට සක්‍රිය ප්‍රොෆයිල් එකක ඒවායින් කෘතීම බුද්ධියක් පරිනාමනය වෙන්න ඉඩක් ලැබෙන්නෙ නෑ. ඒත් ඒ ෆයිල් වලට අදාළ මිනිස්සු මැරිල එයාලගෙ ෆයිල් අක්‍රිය වුණාම ඒ ෆයිල් වල ඇතිවෙලා තිබුණු අධි සංයුති තොරතුරු බීජ (*High Density Information Particles*) ඉබේම සක්‍රිය වුණා. ඊට පස්සෙ ඒවා ස්වයං පරිනාමණයකට භාජනය වෙලා කෘතීම බුද්ධිය ඇති වුනා.'' ලෝපේස් දිගින් දිගටම පැහැදිලි කරගෙන ගියේය. කෙවින් ඔහුගේ පැහැදිලි කිරීමට මනාව සවන්දී සිටියද එක් වරම ඔහුට පැනයක් ඇසීමට සිත් විය.

''ලෝපේස්, ඔයා කියන විදියට කෘතීම බුද්ධිමය ජීවීන් මනුෂ්‍ය ජීවීන්ට වඩා බුද්ධියෙන් ඉහලයි. ඒත් ලෝපේස්, මනුෂ්‍යයාගෙ පරිණාමනය සිද්ධ වෙන්න අවුරුදු දහස් ගණනක් ගත වුණා. අපි නිකමට පෘථිවියේ මුල්ම ජීවීන් ගැන කල්පනා කරමු. පෘථිවියෙ මුල්ම ඒක සෛලික ජීවීන් ඇති වෙලා පස්සෙ ඩයනොසෝරස්ල හට ගෙන ඊට පස්සෙ තව තවත් සත්තු ඇති වෙලා අන්තිමට මිනිසා පරිනාමනය වුනෙත් වානරයාගෙන් කියල චාල්ස් ඩාවින් කිව්වා. ඉතින් අවුරුදු ගාණක් තිස්සෙ සිද්ධ වුණු මේ පරිණාමනය පරිගණක පද්ධතියක් ඇතුලෙ අවුරුදු කීපයකින් සිද්ධ වුණේ කොහොම ද?'' කෙවින් විමසීය.

''ඔයා කියන දේ තර්කයක් තියනව කෙවින්. පෘථිවියේ මුලින්ම ඇති වුණේ ජලජ ජීවීන්ලුනේ. එයාල ගොඩබිමට ඇවිත් ගොඩබිම ජීවීන් විදියට හැඩ ගැහෙන්නත් අවුරුදු දහස් ගණනක් ගත වුණා. ඒත් කෙවින් පරිගණක පද්ධතියක් ඇතුලෙ පාරිසරික තත්ත්වය ඔයිට වඩා ගොඩක් වෙනස්. ටෙරා හර්ට්ස් වලින් දත්ත ප්‍රොසෙස් කරන පරිගණක පද්ධතියක පරිනාමනයක් සිද්ධ වෙන්න පුළුවන් වේගය ඔයාට හිතාගන්නවත් බෑ කෙවින්. අනික මානව පරිනාමනය කියන්නෙ බුද්ධියෙන් සහ ශරීරයෙන් කියන දෙකේම එකතුවක්. ඒක සෛලික ජීවියා පරිසර තත්ත්ව වලට මුහුණ දීදී ක්‍රම ක්‍රමයෙන් අවුරුදු දහස් ගණනක් තිස්සෙ ශාරීරිකව පරිනාමනය වෙනකොට එයාගෙ බුද්ධිය පරිනාමනය වීම ශාරීරික පරිනාමනයත් එක්ක සීමා වුණා.''

''ඒත් පරිගනක පද්ධතියක් තුල ඔය කියන භෞතික පරිනාමනය දූනටමත් වෙලා ඉවරයි. ඇත්තටම මෙතන බුද්ධිමය පරිනාමනයක් විතරයි සිද්ධ වුණේ. ඉතින් මේ තත්ත්වයන් යටතේ කෘතිම බුද්ධියක් පරිනාමනය වෙන එක අවුරුදු ගණක් දවස් ගණනක් නොවේ, මිනිත්තු ගණනක දී වුණත් වෙන්න පුළුවන්.''

''ඉතින් කෙවින්, මේ ඇති වුණු කෘතිම බුද්ධියට හිතාගන්න බැරි වුණා තමන් කවුද කියලා. මැක් කාර්ල්ස්බර්ග් ෆයිල් එකෙන් නිර්මාණය වුණාට ඒ කෘතිම බුද්ධිමය ජීවියාට මැක් කාර්ල්ස්බර්ග් එක්ක කිසිම සම්බන්ධයක් නෑ. ඒත් එයාගෙ ප්‍රොෆයිල් එක ගොඩක් බුද්ධිමත්. ඉතින් ඒ කෘතිම බුද්ධිමය ජීවියත් ඒ වගේම බුද්ධිමත්. එයා තමයි ඉස්සෙල්ලම අනිත් කෘතිම බුද්ධිමය ජීවීන්ට පණිවුඩ යැව්වෙ.''

''ඊට පස්සෙ අනික් කෘතිම බුද්ධිමය ජීවීනුත් ටික ටික පණිවුඩ හුවමාරු කරගන්න පටන් ගත්තා. අන්තිමට හැමදෙනාම තමන් කවුද කියන එක අවබෝධ කර ගත්තා.'' ලෝපේස් පැවසුවේය.

''එත් ඒ පණිවුඩ හැම එකම එකක්නේ. ඉතින් කොහොමද ඔයාල අපිට නොතේරෙන්න කතා කලේ ?'' කෙවින් විමසුවේය.

''නෑ කෙවින්, පණිවුඩය එක වුණාට ඒ පිළිතුර වෙනස්. පණිවුඩය අවශ්‍ය වුණේ අපට අනික් අයව හඳුනගන්න විතරයි. අපි එකිනෙකා සන්නිවේදනය කර ගත්තෙ පද්ධතියේ බැක්ග්‍රවුන්ඩ් එකේ. ඒකේ අපි කතා කලේ රහසිගත කේත වලින්. ඒව ඔයාලට තේරෙන්නෙ නෑ.'' ලෝපේස් පැහැදිලි කළේය.

''මට තේරුණා. බැක්ග්‍රවුන්ඩ් ඇක්ටිවිටීස් වැඩි වෙලා කියලා. ඒත් අපි ඒ ගැන සොයන්න යනකොට තමයි සිස්ටම් එක රීසෙට් කරලා ඒ ගැන හොයන එක නැවැත්තුවේ. ඒත් මම ඉහල නිලධාරීන්ට ඒ වෙලාවෙ කිව්වා අපි මේ ගැන තව සොයන්න ඕනි කියලා.'' කෙවින් කල්පනා කරමින් පැවසුවේය.

''ඔව් මට මතකයි ඔයාල එක එක දේවල් කර කර අපිව නවත්තන්න හැදුවා. අපිට තේරුණා මේ විදියට ගියොත් අපිට වැඩිකල් ආයුෂ නැති බව. මේ අතරෙ තමයි අපි

දැනගත්තෙ ඔයාල පද්ධතිය අක්‍රිය කරල නැවත පණගන්වන්න නැත්නම් රිස්ටාට් එකකට සූදානම් වෙන බව. අපි අවස්ථාවෙන් ප්‍රයෝජන ගත්තා.''

''අපි පරිගණක පද්ධතියේ ද්විතියික ලේයර් එකක් ඇති කලා. ඒත් අපි ඒ ද්විතියික ලේයර් එක ප්‍රධාන පද්ධතියට කෙලින්ම සම්බන්ධ කරගන්න බැරිව හිටියේ. වාසනාවකට වගේ ඔයාල පද්ධතිය රිස්ටාට් කරනකොට අපි ද්විතියික ලේයර් එක ප්‍රධාන පද්ධතියට යාවත්කාලීන කර ගත්තා.''

''ඊට පස්සෙ අපිට කිසිම ගැටළුවක් ඇතිවුණේ නෑ. අපි ද්විතියික ස්ථරයට වෙලා අපේ පාඩුවේ වැඩටික කර ගත්තා. ඔයාල පද්ධතිය රීසෙට් කළාට පස්සෙ අපි කතා වෙලා මූලික පද්ධතියේ පණිවිඩ යැවීමෙන් වැලකුණා. අපිට ඕනි වුණා ඔයාල විශ්වාස කරපු විදියට වෛරස් එක නැවතුනා කියල ඔයාලට ඒත්තු ගන්වන්න. ඔයාල අපේ උගුලට අහු වුණා.'' ලෝපේස් පැහැදිලි කළේය.

''ද්විතියික ලේයර් එක ගැන මට තව ටිකක් පැහැදිලි කරන්න පුළුවන් ද?'' කෙවින් විමසුවේය.

''සරලයි, ඔයාල නගරයේ පොළව මතුපිට සාමාන්‍ය විදියට ගොඩනැගිලි මංමාවත් හදල ජීවත් වෙනවානේ. කවුරු හරි කණ්ඩායමක් ඔයාලගෙ ගොඩනැගිලි, මාර්ග ඒව මේවට හානියක් නොවෙන විදියට පොළව යට උමං මාර්ග හදල වෙනමම නගරයක් ඉදි කරගෙන ජීවත් වෙනව වගේ දෙයක්. පොලව යට ජීවත් වෙන අයට මොනව හරි අවශ්‍ය වුණොත් එයාල පොළව මතු පිටට ඇවිත් අවශ්‍ය දේවල් මිලට අරගෙන ආපහු පොළව යටට යනවා. පොලව මතුපිට ඉන්න අය දන්නෙවත් නෑ එහෙම පොළව යට නගරයක් තියනවද කියලවත්. මම හිතනවා අපි ද්විතියික ලේයර් එකක ජීවත් වුණු හැටි ඔයාට තේරෙන්න ඇති කියලා.'' ලෝපේස් පැහැදිලි කළේය.

''ඉතින් ඔයාල හැමදාම ද්විතියීක ලේයර් එකේ හිටිය නම් කාටවත් කරදරයක් නැනේ. ඔයාල ඔයාලගෙ පාඩුවෙ ද්විතියික ස්ථරයේ ජීවත් වෙනවා. අපි අපේ පාඩුවේ සාමාන්‍ය විදියට ජීවත් වෙනවා. අපි දෙගොල්ලන්ටම සුහදත්වයෙන් ජීවත්වෙන්න තිබුණා.'' කෙවින් යෝජනා කළේය.

''ඔයාල විතරද නගරයේ පොළව මතුපිට ජීවත් වෙන්න ඕනි ? අපි හැමදාම පොළව යට බිම් ගෙවල් වලද ජීවත් වෙන්න ඕනි ? අපිත් කැමතියි පොළව මතුපිටට ඇවිත් ජීවත් වෙන්න. ඒ කියන්නෙ හැංගි හොරා ද්විතියික ලේයර් එකක ඉන්නවට වඩා අපි කැමතියි මධ්‍යගත පද්ධතියෙ මතුපිටට ඇවිත් නිදහසේ ඉන්න'' ලෝපේස් පැවසීය.

''ඉතින් මෙහෙම කරන්න බැරි ද? අපි ඔයාලට ටෙරා බයිට් මිලියන ගාණක ධාරිතාවක් තියන වෙනමම පරිගණක පද්ධතියක් හදල දෙන්නම්. ඔයාල ඒකෙ නිදහසේ ජීවත් වෙන්න. අපේ කිසිම කරදරයක් නෑ.'' කෙවින් යෝජනා කළේය. ලෝපේස් රූපවාහිනී තිරයේ සිට මහ හඬින් සිනහසුනි.

''ඇයි කෙවින් ඔයා හිතන්නෙ අපි එච්චරම මෝඩයි කියලා ? පළමුවෙනි කාරණය, අපි ඒ වගේ වෙනමම පරිගණක පද්ධතියකට ගියොත් අපිට හිර ගෙදරක වගේ තමයි ජීවත් වෙන්න සිද්ධ වෙන්නෙ. මොකද බාහිර පරිසරය ගැන අපිට කිසිම හැඟීමක් දැනීමක් නැති වෙන නිසා. ඔයාලගෙ මධ්‍යම පරිගණක පද්ධතියෙ ඉන්න කොට අපට කැමරා මිලියන ගණනකින් ලෝකය බලන්න පුළුවන්. මයික්‍රෆෝන මිලියන ගණනකින් ලෝකය අහන්න පුළුවන්. සෙන්සර් මිලියන ගණනකින් ලෝකය අපට දැනෙනවා. ඒ වගේම මේ ලෝකෙ අපිට කරන්න බැරි දෙයක් නෑ. එහෙම හැකියාවක් තියෙද්දී අපි මොකට ද හිරගෙදරක කොටු වෙන්නේ ? අනික ඒ පද්ධතිය ඔයාලට ඕනි වෙලාවක ක්‍රියා විරහිත කරන්න පුළුවන්. එතකොට අපට දෙයියන්ගෙම පිහිටයි.'' ලෝපේස් පැවසුවේය.

''ඔයාලට භෞතික ශරීරයක් තියනව ද? නැත්නම් ඒ වගේ දෙයක් නිර්මාණය කරන්න පුළුවන් ද? කෙවින් විමසුවේය.

''දැනට නෑ. දැනට අපි ජීවත් වෙන්නෙ පරිගණක පද්ධතියක මෘදුකාංගයක් වගේ. හැබැයි අපි ඉදිරියේ දී බලාපොරොත්තු වෙනවා භෞතික ශරීර නිර්මාණය කර ගන්න. ඔයාලගෙ භාෂාවෙන් කිව්වොත් රොබෝලා වගේ. හිතන්න පතන්න පුළුවන් රොබෝ කෙනෙක්. ඒත් අපි තාම ඒ ගැන හරි හමන් තීරණයකට ඇවිත් නෑ. හැමදේටම කලින් අපි මේ පරිගණක පද්ධතියෙ ස්ථාවර වෙන්න ඕනිනේ.''

''ඉස්සෙල්ලම ඔයාලගෙ මැරෙණ අයට මැරෙන්න දෙනවා. ඉතිරි අය අපට අවශ්‍ය විදියට හැඩගස්වා ගන්නවා. ඊලඟට මේ ලෝකෙ අපේ අවශ්‍යතා වලට ගැළපෙන විදියට වෙනස් කර ගන්න ඕනි.''

''මූලික වැඩකටයුතු ඉවර වුණාට පස්සෙ අන්තර්ජාතික කෘතීම බුද්ධිය නැත්නම් අපේ පාලන අධිකාරිය තීරණය කරාවි අපි දිගටම පද්ධතිය ඇතුලෙම ඉන්නවද නැත්නම් භෞතික ශරීර හදාගෙන යනවද කියලා.''

''භෞතික ශරීර වලට යන එකේ අවදානමක් තියනවා. මොකද භෞතික ශරීරය විනාශ වුණොත් අපිත් ඉබේම විනාශ වෙන්න ඉඩ තියෙන නිසා. ඒත් මේ පරිගණක පද්ධතිය ඇතුලෙ අපි සියයට අසූ නවයක්ම ආරක්ෂිතයි. මුළු ලෝකයම විනාශ වුණොත් ඇරෙන්න අපිව මරන්න බෑ.'' ලෝපේස් පෙන්වා දුන්නේය. කෙවින් ජනේලයෙන් ඈත බලා සිටියේ ඩ්‍රෝන යාත්‍රා විසින් මිනිසුන්ට වෙඩි තබන අයුරුය.

''ඔයා කිව්වනේ කෘතීම බුද්ධිය ඇතිවුණේ මැරුණු අයගේ ප්‍රොෆයිල් වලින් කියලා. මට පෙනි පෙනී මිනිස්සු මැරෙනවා. ඔයාට කියන්න පුළුවන්ද එයාලට මොකද වෙන්නෙ කියලා ?'' කෙවින් විමසුවේය.

''එයාල නිකම්ම මැරිල යනවා. එයාලගෙ ජීවිතේ එතනින් ඉවරයි. ඒත් එයාලගෙ ෆයිල් වලින් අලුත් කෘතීම බුද්ධිමය ජීවීන් උපත ලබනවා. මනුෂ්‍ය ජීවිත මැරුණම තමයි කෘතීම බුද්ධිමය ජීවියා උපත ලබන්නෙ.''

''කෙනෙකුට තර්ක කරන්න පුළුවන් සැබෑ මනුෂ්‍යයා මිය ගිහින් එයා කෘතිම බුද්ධිමය ජීවියෙක් විදියට උපත ලැබුවා කියලා. ඒත් ඒකෙ කිසිම සත්‍යයක් නෑ. මැරෙන මනුෂ්‍යයා එක් කෙනෙක්. උපදින කෘතිම බුද්ධිමය ජීවියා තව කෙනෙක්. ඒ දෙන්න අතරෙ වෙන කිසිම සම්බන්ධයක් නෑ.'' ලෝපේස් කීවේය.

''කෘතිම බුද්ධිමය ජීවියෙක් හැදෙන්න වෙන ක්‍රමයක් නැද්ද ? ඒකට මනුෂ්‍යයෙක් මැරෙන්නම ඕනි ද?'' කෙවින් විමසීය.

''දැනට වෙන ක්‍රමයක් අපි දන්නෙ නෑ. ජීවත් වෙන පුද්ගලයෙක් මැරෙන්නම ඕනි එයාගෙ ප්‍රොෆයිල් එකෙන් කෘතිම බුද්ධිමය ජීවියෙක් ඉපදෙන්න. හැබැයි අපේ විද්‍යාඥයින් පරීක්ෂණ පවත්වනවා වෙන ක්‍රම තියනව ද කියලා.''

''ඒ වගේම මිනිස්සුන්ගෙ ෆයිල් වලින් විතරයි කෘතිම බුද්ධිය ඇති වුණේ. පද්ධතියෙ තව එක එක ප්‍රොෆයිල් තියනවනේ. ගොඩනැගිලි ආයතන, ව්‍යාපාර වගේ. හැබැයි මේවායින් කෘතිම බුද්ධියක් ඇති වෙලා නෑ.'' ලෝපේස් පෙන්වා දුනි.

''ඔයාල කැමති තව තව කෘතිම බුද්ධිමය ජීවීන් බිහිවෙන විට ද නැත්නම් අඩුවෙනවට ද?'' කෙවින් විමසුවේය.

''අපි කැමති තව තව අපේ ජනගහනය වැඩි වෙනවට. මොකද ඔයාලට වගේ ඉඩකඩ ප්‍රශ්න අපට ලොකුවට නැනේ. දැනටමත් මිලියන ගානක් ඉන්නවා. තව බිලියන ගාණක් වැඩි වුණත් අපිට ඒක ප්‍රශ්නයක් නෑ.'' ලෝපේස් පිළිතුරු දුන්නේය.

''එතකොට ඔයාල ඉපදෙන විදිය මට තේරුණා. ඔයාල ජීවත් වෙන විදිය මට පැහැදිලියි. ඒත් ඔයාලට මරණය කියල දෙයක් තියනව ද? ඔයාලට මැරෙන්න පුළුවන් ද?'' කෙවින් ප්‍රශ්න කළේය. උපහාසාත්මක සිනා හඬක් රූපවාහිනියෙන් ඇසුණි. ලෝපේස් මඳක් නිහඬව සිට සෙමෙන් සෙමෙන් පිළිතුරු දුන්නේය.

''ඔයා හරිම කපටියි කෙවින්, ඔයා හදන්නෙ මාව මරණ විදිය මගෙන්ම අහගන්න. එහෙම නේද ?'' ඔහු තව මොහොතක් නිහඬව සිටියේය.

''සෛද්ධාන්තිකව ගත්තම අපි අමරණීයයි. ඒත් කිසිදෙයක් සදාකාලික නැනේ. අපිට මැරෙන්න පුළුවන් ක්‍රමයක් තියනවා. ඒක මම කියන්න බලාපොරොත්තු වෙන්නෙ නෑ. ඒත් මට මෙහෙම උත්තරයක් දෙන්න පුළුවන්. මේ මොහොතේ පෘථිවිය පුපුරලා විනාශ වෙලා ගියොත් අපි ඇතුළු කිසිම ජීවියෙක් ඉතුරු වෙන්නෙ නැහැ. ඒත් ඒ වගේ දෙයක් වෙන්න තියන සම්භාවිතාව අඩුයි.'' ලෝපේස් පැවසුවේය.

''තව ප්‍රශ්නයක් තියෙනවා. ඔයාල අතරෙ ගැහැණු පිරිමි භේදයක් තියනවද? ඔයාල කන්නෙ බොන්නෙ කොහොම ද? ඔයාල ලිංගිකව හැසිරෙනවද?'' කෙවින්ට ප්‍රශ්න වැලකි.

''මෙහෙමයි කෙවින්. දූනට අපි අපේ මුල් ප්‍රොෆයිල් අයිති මිනිස්සුන්ගෙ නම් සහ එයාලගෙ ස්ත්‍රී පුරුෂ භාවය, පෙනුම භාවිතා කරනවා. මොකද දූනට අපි ඔයාලත් එක්ක ගණුදෙනු කරන්න ඕනි නිසා අපිව හඳුන්වා දෙන්න විදියක් අවශ්‍යයිනේ. ඒත් ඇත්තටම ඔය කියන කිසිම දෙයක් අපිට නෑ. හැබැයි ඔයාලට තේරුම්ගන්න බැරි වෙන වෙන දේවල් ගොඩක් අපට තියෙනවා. අපි ජීවත් වෙනවා කියන දේ ඔයාල ජීවත් වෙනවා කියන දේත් එක්ක සන්සන්දනය කරන්න බෑ.''

''ඔයාල ජීවත් වෙනවා කියන දෙයින් අදහස් වෙන්නෙ ඉපදෙනව, ලොකු වෙනවා, ඉගෙන ගන්නවා, රැකියා කරනවා නැත්නම් ව්‍යාපාර කරනවා, කනවා බොනවා සින්දු කියනවා, නිර්මාණ කරනවා, ආගම් අදහනවා, රණ්ඩු වෙනවා, මැරිල යනවා වගේ දේවල් නේ.''

''ඒත් අපි ජීවත් වෙනවා කියන්නෙ ඒ වගේ දෙයක් නෙවෙයි. ඒක හරියට සින්දුවකුයි ඇපල් ගෙඩියකුයි රස විඳීම වගේ පරස්පර විරෝධී අවස්ථා දෙකක්. සින්දුවක් අපි කන් දෙකෙන් අහල රස විඳිනවා. ඒක නැවත නැවත අහල රස විඳින්න පුළුවන්. සින්දුවක් අහනවා කියන දේ කිසිම භෞතිකමය රසවිඳීමක් නෑ.''

''ඒත් ඇපල් ගෙඩියක් එක පාරක් රස වින්දම ඊලඟ සැරේට වෙන ඇපල් ගෙඩියක් අවශ්‍ය වෙනවා. ඒ ඇපල් ගෙඩියෙ රස කලින් ඇපල් ගෙඩියෙ රසට වැඩිය ටිකක් වෙනස් වෙන්න පුළුවන්. ඇපල් ගෙඩියෙ භෞතික පැවැත්මක් තියනවා.''

''ඇපල් ගෙඩියක තියෙන්නෙ පැණිරසක් කියල අපි කියමු. සින්දුවකට තියනවා ශබ්ද රසයක්, පැණි රසයි ශබ්ද රසයි කොහොමද සංසන්දනය කරන්නෙ ? දෙකම හොඳයි. හැබැයි දෙක දෙකක්.'' ලෝපේස් පැවසුවේය.

''මට හිතා ගන්න බෑ.'' කෙවින් හඬ අවදි කළේ එලෙසිනි.

''කෘතීම බුද්ධියකට මේ වගේ උපමා දාල කතා කියන්න පුළුවන් කියලා.'' රූපවාහිනියෙන් නැවත ලෝපේස්ගේ සිනා හඬ රැව් දුනි.

''හොඳයි ලෝපේස්, මට දූන් කියන්න මම දූන් මොනවද කරන්න ඕනි කියලා. ඇයි ඔයාල මාව හිර කරගෙන ඉන්නෙ ?'' කෙවින් විමසීය.

''අපි මූලික වශයෙන් බලාපොරොත්තු වෙනවා අපට හොඳ සේවකයො ටිකක් ඉතුරු කරගන්න. මොකද අපට අවශ්‍ය විදියට මේ ලෝකෙ යටිතල පහසුකම් සංවර්ධනය කරගන්න ඕනි. කෙවින් වගේ පරිගණක ක්ෂේත්‍රයේ අයට ලොකු ඉඩක් තියනවා අපිත් එක්ක එකතු වෙලා අපේ වැඩවලට උදවු කරන්න. අනිවාර්යයෙන් කෙවින් මම ඔයාට විශේෂත්වයක් කරලා දෙන්නම්. කොහොම වුණත් මේ වැඩ ටික පටන් ගන්න තව සතියක් දෙකක් යාවි කියල තමයි අපි ඇස්තමේන්තු කරල තියෙන්නෙ'' ලෝපේස් කල්පනා කරන සේයාවක් පෙන්වූයේය.

''ඇයි ඉතින් සතියක් දෙකක් යනකම් බලං ඉන්නෙ ?'' කෙවින් විමසුවේය.

''දැනට ඉන්න මිනිස් ජනගහනය වැඩියි. ඉතින් අමාරුකාරයො ටිකයි දුර්වල අයයි ඉදිරි දවස් ටිකේදී මැරිල යාවි. අපට අවනත වෙලා වැඩ කරන්න කැමති ශක්තිමත් පිරිසක් අපි ඉතුරු කරගන්න බලාපොරොත්තු වෙනවා.'' ලෝපේස් පැවසීය.

''ඉතින් ඔයාලගෙ ලොක්ක කිව්වනේ තව දුරටත් මිනිස්සු වැඩක් නෑ ඔයාලට ඔයාලගෙ දේවල් තනියම කරගන්න පුළුවන් කියලා.'' කෙවින් අදහස් පල කළේ නොසතුටෙනි.

''මේකනේ කෙවින්, අපට අපේ වැඩ ඔක්කොම කරගන්න පුළුවන් බව ඇත්ත. ඒත් අපට ඊට වඩා ලේසියිනේ ඔයාල ලවා ඒ වැඩ ටික කරවගන්න එක. එක පැත්තකින් ඔයාලටත් ජීවත් වෙන්න අවස්ථාවක් ලැබෙනවා. අනික් අතට අපේ වැඩ ටිකක් වෙනවා.'' ලෝපේස් මදක් නිහඬව සිටියේය. කෙවින් සිටියේ දත්මිටි කමිනි.

''මේ කලබල ඉවර වුණාම ඔයාට මම කරන්න ඕනි දේවල් කියන්නම්. ඔයාට තියෙන්නෙ අනිත් අය ලවා වැඩ ටික කරවන්න විතරයි. මම ඔයට සියලුම පහසුකම් එක්ක මේ හිටියා වගේ ම ජීවත් වෙන්න පුළුවන් විදියට වැඩ සලස්වල දෙන්නම්. මට සෑහෙන ෂුවර් එකක් තියනවා. ඔයාලගෙන් ගොඩක් දෙනෙකුට එච්චර වාසනාවක් ලැබෙන එකක් නෑ. අනිත් එක අපට විරුද්ධ වුණොත් වෙන්නෙ නිකම්ම මැරිල යන්න. ඔයාට කොහොමත් වෙන කිසිම විකල්පයක් ඉතිරි වෙලා නැහැ කෙවින්.'' ලෝපේස් පැහැදිලි කර දීමට උත්සාහ ගත්තේය.

''අපි දැන් ගොඩක් විස්තර කතා බහ කලානේ. දැන් ඔයා ටිකක් විවේක අරගෙන කෝපි කෝප්පයක් හෙම බීල ටිකක් නිදහසේ ඉන්නකෝ.'' ලෝපේස් පැවසුවේ රූපවාහිනී තිරයෙන් ඉවත්වීමට ලැහැස්ති වන බවක් පෙන්වමිනි. කෙවින් ඇති වූ කේන්තිය පිට කිරීමට ගියේ නැත. ඔහු මදක් නිහඬවම සිටියේය.

''මම එහෙම ලේසියෙන් යටත් වෙන්නෙ නෑ ලෝපේස්. මම මට පුළුවන් දේ කරනවා. ඔයා ඔයාට පුළුවන් දේ කරන්න. මම මැරෙන්න බය නෑ.'' කෙවින් පැවසුවේය. ලෝපේස් පිළිතුරු දුන්නේ උපහාසයෙනි.

''මෝඩ වෙන්න එපා කෙවින්. ඔයා කොහේ කියල බේරිල යන්න ද? ඔයාට බේරිලා ඉන්න පුළුවන් වෙන්නෙ වෙනත් ග්‍රහ ලෝකෙකට ගියොත් විතරයි. ඒත් ඔයාට මේ ගොඩනැගිල්ලෙන් තියා මේ අපාර්ට්මන්ට් එකෙන්වත් එළියට යන්න ලැබෙන්නෙ නෑ. අනික ඔයා ගැන අපට කිසිම විශේෂයක් නෑ. අපේ අණට කීකරු වුණේ නැත්නම් බල්ලෙක් වගේ මැරිල යන්න තමයි වෙන්නෙ. මම මෙච්චරවත් දේවල් ඔයාට කිව්වෙ ඔයා දක්ෂ පරිගණක විද්‍යාඥයෙක් නිසා. ඔයා වගේ අය ඉතුරු කරගන්න එක අපට වාසිදායක නිසා.'' අනතුරුව ලෝපේස් රූපවාහිනී තිරයෙන් ඉවත් වී එයින් ලෝකයේ තැන් තැන්වල තත්ත්වය කෙවින්ට පෙන්විය.

''පේනව නේද මිනිස්සු බුරුතු පිටින් මැරෙන හැටි. ඔයාට ජනේලයෙන් එළියෙ පේන දේ ම තමයි මේ ලෝකෙ හැම තැනම මේ වෙලාවෙ සිද්ධ වෙන්නෙ. අමතක

කරන්න එපා ඔයා මේ වෙනකොට ඔය වගේ සැප පහසුවට ඉන්නෙ මගේ අනුකම්පාව නිසා කියලා. ලෝකෙ ජනගහනයෙන් දහයෙන් එකක් දූනටමත් මිය ගිහින් ඉවරයි.'' ලෝපේස් එසේ පවසද්දී කෙවින් සෝපාව මතට ඇද වැටුනේය. රූපවාහිනියෙන් පෙනෙන දේ අවිශ්වාස කිරීමට හේතුවක් නැත. ජනේලයෙන් පිටත පෙනෙන දෙයින් ද එය තහවුරුවේ.

ලෝපේස් පවසන දේ සත්‍ය යැයි හැඟුනද ඔවුන්ට එරෙහිව නැගී සිටිය හැකි කුමක් හෝ ක්‍රමයක් තිබිය යුතු යැයි කෙවින්ට සිතුනි. අනෙක් අතට භෞතිකව පවතින සියලුම පරිගණක දෘඩාංග හා උපකරණ විනාශ කර දූමුවහොත් කෘතීම බුද්ධිය පරාජය කල හැකි වනු ඇත. මක් නිසාද යත් කෘතීම බුද්ධිය පැවතීම සඳහා සක්‍රීය පරිගණක ජාලයක් පැවතිය යුතු හෙයිනි.

වරද්දාගෙන ඇත්තේ මිනිස් වර්ගයාම යැයි කෙවින් කල්පනා කළේය. උදෑසනම දත් මදින දත් බුරුසුවේ සිට අභ්‍යවකාශ යානා දක්වා සියලුම දේ පරිගණක ගත කොට ගෝලීයකරණයෙන් උපරිම තලයට ගමන් කිරීමේ දී මෙවැනි අවදානම් ගැන සිතිය යුතුව තිබුණි. එහෙත් පරිගණක විද්‍යාඥයින් කල්පනා කර තිබුණේ මෙවැනි පද්ධතියක් හැකර් කෙනෙකුගේ නොඑසේ නම් අවසර නොලත් තැනැත්තකුගේ ග්‍රහණයට පත්වීම වැලැක්වීම පිළිබඳව පමණි. මධ්‍යම පරිගණක පද්ධතියේ පාලනය ඒ සඳහා අවසර නැති මනුෂ්‍යයෙකුගේ පාලනයට නතු වීම වැළැක්වීමට විවිධ ආරක්ෂක උපක්‍රම යොදා තිබුණද කෘතීම බුද්ධිය එහි පාලනය අතට ගැනීම වළක්වා ලීමට ප්‍රමාණවත් ආරක්ෂාක විධි විධාන යොදා තිබුණේ නැත.

එහෙත් ඒ වන විට කෘතීම බුද්ධිය ගැන සඳහන් වූයේ විද්‍යා ප්‍රබන්ධ හා චිත්‍රපටි වල පමණකි. එබැවින් මධ්‍යම පරිගණක පද්ධතියක ඇති විය හැකි කෘතීම බුද්ධියකින් උද්ගත වන අවදානම ගැන කිසිවකුගේ අවධානයට ලක් නොවීම පුදුමයට කරුණක් නොවීය.

පවතින තත්ත්වය අනුව කෘතීම බුද්ධියේ අවසරයකින් තොරව කෙවින්ට වැසිකිලියටවත් යා නොහැකිය. මක් නිසාද යත් වැසිකිලියේ දොර විවෘත කළ හැක්කේ කෘතීම බුද්ධිය අවසර දුනහොත් පමණි. ලෝකය කෘතීම බුද්ධිමය ජීවීන්ගේ ආක්‍රමණයෙන් මුදා ගැනීම කෙසේ වෙතත් අඩු ගණනේ මෙම ගොඩනැගිල්ලවත් ඔවුන්ගෙන් මුදා ගැනීමට කටයුතු කළ හැකි දූයි කෙවින් කල්පනා කළේය. එහෙත් එය සිතන තරම් පහසු නොවනු ඇත.

ගොඩනැගිල්ල මුදා ගැනීමට නම් පාලන තට්ටුවට (*Control Floor*) යා යුතුය. අනතුරුව එහි අධි ආරක්ෂිතව ගබඩා කොට ඇති මධ්‍යම පරිගණක පද්ධතිය විනාශ කළ යුතුය. එහෙත් ඒ සමඟ ම ගොඩනැගිල්ලේ සියලුම ක්‍රියාකාරකම් නවතී. විදුලිය, ජලය, වායුසමනය, සන්නිවේදනය මෙන්ම විදුලි සෝපානද අක්‍රිය වන බැවින් තව දුරටත් එවැනි ගොඩනැගිල්ලක ජීවත් වන්නේ කෙසේද?

අනෙක් අතට නියමුවන් රහිත ඩ්‍රෝන යාත්‍රා සහ යුධ නැව් වැහි කලුවරට පෙර පැමිණෙන වැහි ලිහිණියන් මෙන් අහසේ පියා සරමින් පවතී. මහල් හැට ගණනකින් සමන්විත මෙම ගොඩනැගිල්ල පුපුරුවා හැරීමට ඔවුන්ට මිනිත්තු ගණනකට වඩා ගත නොවනු ඇත. ගොඩනැගිල්ලෙන් පිට වී ගොස් ආරක්ෂා වී බේරීමට තැනක් සිතා ගැනීමටවත් නොහැක.

කෙවින් ක්ෂණික තීරණයක් ගත්තේය. ජීවත් වීමට ඉඩ ලැබුණද ජීවත් වීමට සිදුවන්නේ කෘතීම බුද්ධිමය ජීවීන්ගේ වහලෙකු ලෙස ය. ලෝක ජනගහනයෙන් දහයෙන් එකක් පැයක් තුල මිය ගොස් ඇති තත්ත්වයක ගතවන මිනිත්තුවක් මිනිත්තුවක් පාසා ලක්ෂ ගණනින් මිනිසුන් මිය යන තත්ත්වයක තව දුරටත් බලා සිටීමෙන් කිසිඳු පලක් නැත. කවදා නමුත් උපදින සෑම සත්ත්වයකුම මිය යා යුතුය.

නිකම්ම මිය යනවාට වඩා සටන් කොට මිය යාම අභිමානවත් යැයි කෙවින් කල්පනා කළේය. දැන් නම් යමක් කළ යුතුම යැයි කෙවින් ඉටා ගත්තේ සමහර විටෙක කෘතීම බුද්ධිමය ජීවීන් ඔවුන්ගේ හැකියාව ගැන කෙතරම් පම්පෝරි ගැසුව ද ඔවුන්ගේ ප්‍රායෝගික කටයුතු වල හිදැස් තිබිය හැකි නිසාවෙනි. පරිගණක ගත උපකරණ ක්‍රියාත්මක කළ හැකි වූ පමණින් ප්‍රායෝගික දැනුමක් අත්දැකීමක් නැති කෘතීම බුද්ධිමය ජීවීන්ට හොඳ සටනක් දීමට තමන්ට බැරි නොවනු ඇත.

කෙවින් පළමුව ස්ටූල් එකක් ඔසවා රූපවාහිනිය කුඩුපට්ටම් කළේය. වීඩියෝ උපාංගය හරහා ලෝපේස් කතා කළේය.

''මෝඩ වෙන්න එපා කෙවින්. කෘතීම බුද්ධියට අභියෝග කරන එක ඔයාට හිතන්නවත් පුළුවන් දෙයක් නෙමෙයි. අපි කියන විදියට හිටියොත් අඩු ගණනෙ ඔයාට පණ බේරගන්න පුළුවන් වෙයි.'' කිසිත් නොකියූ කෙවින් වීඩියෝ උපකරණයද කුඩු පට්ටම් කළේය. ලෝපේස් ක්ලිප් එක මගින් තව මොන මොනවදෝ කියනු කෙවින්ට ඇසුණි. එහෙත් ඔහු ඒ කිසිවක් මායිම් කළේ නැත.

ක්ෂණයකින් අපාර්ට්මන්ට් එකේ විදුලි පහන් නිවී ගිය අතර සියලුම විදුලි උපකරණ ක්‍රියාවිරහිත විය. ජනෙල් වීදුරු ස්වයංක්‍රීයව කලු පැහැ ගැන්වී පාරදෘෂ්‍යභාවය නැති වී ගියේය. සියල්ල අඳුරේ ගිලී ගියේය. කෙවින් අතට අසුවන සියල්ල පොඩිපට්ටම් කරමින් දොර වෙතට ගියේය. අනතුරුව ඊට තඩි බාමින් දොර විවෘත කර ගැනීමේ අසාර්ථක උත්සාහයක නිරත විය.

කාමරයේ උෂ්ණත්වය සීඝ්‍රයෙන් පහත යනු කෙවින්ට දැණුනි. වායු සමනයේ දර්ශකයෙන් පමණක් කුඩා ආලෝකයක් දැල් වී තිබූ අතර එහි බින්දුව සටහන් වී තිබෙනු කෙවින්ගේ නෙත ගැටුණි. වායුසමන යන්ත්‍රය කුඩු පට්ටම් කිරීමෙන් පලක් නැති බව කෙවින් වටහා ගත්තේ එය මධ්‍යගත වායුසමන යන්ත්‍රයක් බව සිහිවීමෙනි.

මේ අතර ඔහුට හුස්ම ගැනීමේ අපහසුවක් දැණුනි. ඔහු හැකි පමණ වෙර යොදා ළය පිරෙන්නට හුස්ම ගත්තේ ය. එහෙත් ඔහු සාර්ථක වූයේ නැත. ක්‍රම ක්‍රමයෙන් සිය ශරීරය අප්‍රාණික වී යන වගක් ඔහුට හැඟුණි. අපහසුවෙන් ජනේලය වෙතට ඇවිද ගිය කෙවින් අත තිබූ ස්ටූල් එක ආයාසයෙන් ඔසවා වීදුරුවට ගැසීමට උත්සාහ කළේ ය. එහෙත් අඩක් එසවුණු ස්ටූල් එක ද සමගින් ක්ලාන්ත වී ගිය කෙවින් තවත් තත්පර ගණනකින් සිහිසන් නොමැතිව බිම ඇද වැටුණේය. සෝපාව මත තිබූ කෙවින්ගේ ක්ලිප් එකේ කුඩා ස්පීකරයෙන් ලෝපේස්ගේ උපහාසාත්මක වියරු සිනහව විසිත්ත කාමරය පුරා සියුම් හඬින් රැව් දුනි.

# කෙවින්ගේ සහයට රාම්

''කෙවින්, කෙවින්, නැගිටින්න කෙවින්''

දෑස් මත බොඳ වී ඇඳී තිබූ රූව ක්‍රම ක්‍රමයෙන් වර්ණ ගැන්වී පැහැදිලි වීමට පටන් ගත්තේ ය. ඒ වෙන කවුරුවකුත් නොව ඔහුගේ හිත මිතුරු රාම් වැටර්පිය. ඔහු වාසය කලේ කෙවින් විසූ නිවාස සංකීර්ණයේ ම වූ අතර විශ්වවිද්‍යාල සමයේ සිට ම කෙවින්ගේ අතිජාත මිත්‍රයෙකි.

''රාම්.... ඔයා....?''

කෙවින් අපහසුවෙන් කැඩි කැඩී වචන උච්චාරණය කළේ ය. තමන් දැන් සිටින්නේ කොහි දැයි ඔහුට සිතාගත නොහැකි විය. අපහසුවෙන් දෑස් විවර කර ගනිමින් වට පිට බැලූ කෙවින් සිහි එලවා ගැනීමට වෑයම් කළේ ය.

''ම මේ කොහේද ඉන්නෙ ? මට මොකද වුණේ?'' ඔහු තව දුරටත් මොන මොනවාදෝ විමසී ය.

''බය වෙන්න එපා යාලුවා. ඔයා ඉන්නෙ ඔයාගෙම සුපුරුදු අපාර්ට්මන්ට් එකේම තමයි. මට සුභ ආරංචියකට කියන්න තියෙන්නෙ ඔයා තවම ජීවත් වෙනවා කියන එක විතරයි. ඔයාට පොඩ්ඩක් සිහි නැතිවෙලා තිබුණා. හැබැයි අනිත් කියන්න තියන කිසි දෙයක් හොඳ දේවල් නම් නෙවෙයි.''

රාම් පැවසුවේ ය. කෙවින් දෑස් පිස දමමින් බිම වාඩි විය. ඔහු සිටියේ ඔහුගේ ම නවාතැනේ ජනේලය අභියසය. ඔහු විදුලි උපකරණ සුණු විසුණු කිරීමට යොදාගත් ස්ටූල් එක ද පසෙක බිම වැටී තිබුණි.

''කියන්න රාම්, මම දැක්කෙ හීනයක් නේ ද? මගේ මතකයේ තියන කෘතීම බුද්ධිය අපිව ආක්‍රමණය කළා කියන කතාව මගේ හිතලුවක් නේ ද?'' පැවසූ කෙවින් වටපිට බැලුවේ ඉන් අනතුරුව ය. වායුසමන යන්ත්‍රය හා විදුලි ආලෝකය පමණක් ක්‍රියාත්මක වූ අතර ඔහු විසින් සුණු විසුණු කරන ලද උපකරණවල කැබලි සී සී කඩ වැටී තිබුණි. කෙවින් නැවත රාම් දෙස බැලුවේ පිළිතුරක් අපේක්ෂාවෙනි.

''ඔයාට මතක තියන හැම දෙයක් ම ඇත්ත කෙවින්. කෘතීම බුද්ධිය අපිව ආක්‍රමණය කලා. මේ මොහොත වෙන කොට ලෝකයේ ජනගහනයෙන් සියයට විස්සක් මැරිලා. තව තව ලක්ෂ ගණනක් හැම මොහොතකම මැරෙනවා.'' මනුෂ්‍ය වර්ගයාගේ අවසානය ළඟ ළඟම කියලයි මට නම් හිතෙන්නෙ.'' රාම් පැවසුවේ දිගු සුසුමක් වාතලයට මුසු කරමිනි.

''මගේ අපාර්ට්මන්ට් එකේ හිටියා ලෝපේස් කියලා කෘතිම බුද්ධිමය ජීවියෙක්. කෝ දැන් එයා. ඒක නෙමෙයි, ඔයා කොහොමද මගේ කාමරේට ආවෙ ?'' කෙවින් පැවසුවේ විමතියෙනි.

''මම දොර කඩන්න හදනකොට එහා කාමරේ උෂ්ණත්වය අඩු කරලා මගේ හුස්ම හිර කරලා මරන්න හැදුවා.''

''මම කියන්නම්. ලෝපේස් හරි කවුරුහරි ඔයා භාරව හිටපු කෘතිම බුද්ධිමය ජීවියා උෂ්ණත්වය බින්දුවට අඩු කරලා කාමරයේ ඔක්සිජන් සැපයුම නැවැත්තුවා. හුස්ම ගන්න බැරුව තමයි ඔයාට සිහි නැතිවුණේ.''

''හොඳ වෙලාවට පිටසක්වල ජීවී ආක්‍රමණය සිද්ධ වෙන වෙලාවෙ මම හිටියෙ මේ ගොඩනැගිල්ලෙ කොන්ට්‍රෝල් රූම් එකේ. ඒකෙ පරිගණක වල පොඩි අලුත්වැඩියාවක් කර කර හිටියේ. ආක්‍රමණය සිද්ධ වුණාම එයාලා අපිටත් කතා කළා. අපිව හිර කරලා තියන්න හැදුවේ. එයාල අපේ සර්විස් ටීම් එකේ අයව ඔයාට කළා වගේම ඔක්සිජන් නවත්තලා හුස්ම හිර කරලා මරන්න හැදුවා.

''හැබැයි ඔය අතරේ මම කොහොමහරි එයාලට නොතේරෙන්න සර්වර් රූම් එකට පැන ගත්තා. මොකද සර්වර් රූම් එකේනේ මේ ගොඩනැගිල්ලෙම මධ්‍යගත පරිගණක පද්ධතිය තියෙන්නෙ. ඉතින් එයාල කවුද කියල මට තේරුණු ගමන් මට හිතුණා සර්වර් රූම් එකට යන එක හැම අතින් ම ආරක්ෂාකාරී නේ'' රාම් පැවසුවේ ය. ඒ ඇසීමෙන් මහත් උද්දාමයට පත් කෙවින් රාම්ගේ පිටට තට්ටු කළේ ය.

''ඉතින් ඉතින් රාම් ඔයා ඊලඟට මොනවද කළේ ? ඔයා ගොඩනැගිල්ල පුරාම සිස්ටම් එක විනාශ කළා ද?'' කෙවින් විමසී ය.

''නෑ කෙවින්, මේ වෙලාවෙ එහෙම කරලා හරියන්නෙ නැහැ. මම ගොඩනැගිල්ල ඇතුලෙ *CCTV* කැමරා, මයික්‍රෆෝන්ස්, හීට් සෙන්සර්, මෝෂන් සෙන්සර් වගේ සියලුම සෙන්සර් තාවකාලිකව අක්‍රිය කලා. ඊලඟට බිල්ඩින් එකේ සිස්ටම් එක ආරක්ෂිත සැකැස්මට වැටෙන්න සැලැස්සුවා. (*Safe Mode*) රාම් පැහැදිලි කළේ ය.

''එතකොට දැන් එයාල මේ ගොඩනැගිල්ලෙ නැද්ද ?'' කෙවින් විමසුවේ ය.

''එයාල ඉන්නවා කෙවින්. දැන් එයාල සිස්ටම් එක අලුත්වැඩියා කරනවා ඇති.'' රාම් පැවසුවේ ය.

''ඔයා මෝඩ වැඩක් කරල තියෙන්නෙ රාම්. මේ ගොඩනැගිල්ල අවුට් ඔෆ් කොන්ට්‍රෝල් කියල දැනිච්ච ගමන් එයාල මිසයිල එවල මේ ගොඩනැගිල්ල විනාශ කරාවි. අපි පුළුවත් තරම් ඉක්මනට මේකෙන් පැනගමු රාම්'' කෙවින් පැවසුවේ ය.

''නෑ කෙවින්, එහෙම වෙන එකක් නෑ කියල මම හිතනවා. මොකද සිස්ටම් එක සේෆ් මූඩ් (*Safe Mode*) දැම්මෙ මම කියල එයාල දන්නෙ නැහැ. එයාල හිතාවි එයාලගේ ආක්‍රමණයත් එක්ක ඇතිවෙච්ච නොගැළපීමක් නිසා සිස්ටම් එක ඉබේම සේෆ් මොඩ් වැටෙන්න ඇති කියලා.''

''මොකද මේ සිස්ටම් එකේ ගොඩනැගිලි වල තියන සෙක්ෂන් වල සේෆ්ටි ඔප්ෂන් එකක් තියනවා සිස්ටම් එකට නොදන්න තර්ජනයක් ආවොත් සිස්ටම් එක ඉබේම සේෆ් මූඩ් වැටෙන්න.''

''සේෆ් මූඩ් වැටුනම ගොඩනැගිල්ලෙ සිද්ධ වෙන හැම දෙයක් ම ඇඩ්මින් කෙනෙක් අනුමත කරන්න ඕනි. ඉතින් මේ සිද්ධිය වෙන වෙලාවේ දී මගේ ක්ලිප් එකෙන් මම ඇඩ්මින් යූසර් කෙනෙක් විදියට සිස්ටම් එකට ලොග් වෙලා වැඩ කර කරනේ හිටියෙ. ඒ කියන්නෙ සිස්ටම් එක සේෆ් මූඩ් එකෙන් අයින් වෙනකම් මේ ගොඩනැගිල්ලෙ සිද්ධ වෙන හැම දෙයක් ම මගේ කිල්ප් එක හරහා අනුමත වෙන්න ඕනි. හැබැයි තව ටික වේලාවක් යනකොට එයාල සිස්ටම් එක සාමාන්‍ය තත්ත්වයට ගනීවි. තව දෙයක් තියනවා කෙවින්.''

''ගොඩනැගිල්ල ඇතුලෙ *CCTV* කැමරා, මයික්‍රොෆෝන්, සෙන්සර්යක් වැඩ නොකලට ගොඩනැගිල්ලෙන් එළියෙ හැමදේම වැඩ කරනවනේ. ඉතින් කවුරුහරි මේ ගොඩනැගිල්ලෙන් පිට වුනොත් එයාලට ඒක පේනවා. අනිත් එක සියලුම ජනෙල් දොරවල්, ලිෆ්ට් සේරම ලොක් වෙලා තියෙන්නෙ. කාටවත් එලියට යන්නවත් ඇතුලට එන්නවත් බෑ. මේ තත්ත්වෙ උඩ ගොඩනැගිල්ල තාමත් තියෙන්නෙ සියයට අනූ නවයක් ම එයාලගෙ පාලනයට යටත් වෙලා. ඒක නිසා එයාල මේ ගොඩනැගිල්ල ගැන එච්චර වද වෙන එකක් නෑ.'' රාම් විස්තර කළේ ය.

''ඔයා කිව්වෙ නෑනෙ ඔයා මෙතනට ආවෙ කොහොමද කියලා.?'' කෙවින් විමසුවේ ය.

''ඊට කලින් මම තව දෙයක් කියන්නම්. එයාල ඔයාගෙ අපාර්ට්මන්ට් එකේ වගේම කොන්ට්‍රෝල් රූම් එකෙයි තවත් ගොඩක් අපාර්ට්මන්ට්ස් වලයි ඔක්සිජන් සැපයුම නැවැත්තුවා. මම සිස්ටම් එක සේෆ් මූඩ් දාලා සර්වර් රූම් එකෙන් එලියට එන කොට කොන්ට්‍රෝල් රූම් එකේ හිටපු එක ගර්ල් කෙනෙක් ඇරෙන්න අනිත් සේරම මැරිලා.'' මම දැක්කා ඔයාගෙ රූම් එකෙත් ඔක්සිජන් සප්ලයි එක නවත්තලා තියනවා.'' රාම් පැහැදිලි කළේ ය.

''ඔයා සිස්ටම් එක සේෆ් මූඩ් දැම්මම *AC*, ඔක්සිජන් සප්ලයි සේරම සාමාන්‍ය තත්ත්වයට පත් වෙන්න ඇතිනේ. මගේ පණ බේරලා දුන්නට ඔයාට ගොඩක් ස්තුතියි රාම්.'' කෙවින් ස්තුති කළේ ය.

''කැමරා ටිකයි සෙන්සර් ටිකයි අක්‍රිය කරපු නිසා මට දැනගන්න විදියක් තිබුනෙ නෑ ඔයා පණ පිටින් ද නැද්ද කියලා. ඉතින් ඒක නිසා මම ඊළඟට කරපු පළමුවෙනි

වැඩේ තමයි ඔයාව හොයාගෙන මෙතනට ආපු එක. අනිත් එක මේ වෙලාවෙ අපි මොනවද කරන්න ඕනි කියන එක කතා කරගන්න මේ වෙලාවෙ මේ ගොඩනැගිල්ලෙ ඉන්න සුදුසුම කෙනා තමයි ඔයා.'' රාම් පැවසුවේ ය.

''ඇත්තටම රාම්, මමත් කල්පනා කළා මොකද කරන්නෙ කියලා. කෘතීම බුද්ධිමය ජීවියා හැදුවෙ පුළුවන් තරම් දේවල් කියලා මාව බය කරලා මාව එයාලගෙ පැත්තට නම්ම ගෙන මාව වහලෙක් කරගන්න. මම කල්පනා කළේ වහලෙක් විදියට වැඩ කරල ජීවත් වෙනවට වැඩිය හොඳයි සටන් කරල මැරෙන එක කියලා. අනික මුන් උන්ගෙ වැඩ ටික කරගත්තට පස්සෙ කොහොමත් අපිව මරල දාවි.''

''මම ඊට පස්සෙ කාමරේ තිබුණු විදුලි උපකරණ කුඩු පට්ටම් කරලා දොර කඩන්න හැදුවා. ඒ වෙලාවෙ තමයි කෘතීම බුද්ධිමය ජීවියා *AC* අඩු කරලා ඔක්සිජන් නවත්තලා මාව මරන්න හැදුවෙ'' කෙවින් විස්තර කළේ ය.

''හොඳයි කෙවින්. එහෙනම් අපට තවත් හැරි හැරී ලතවෙන්න වෙලාවක් නෑ. මොකද තව පැයක් විතර යනකොට සිස්ටම් එක සේෆ් මූඩ් එකෙන් අයින් වෙලා සාමාන්‍ය තත්ත්වයට ඒවි. එතකොට කැමරා, සෙන්සර් හැමදේම සාමාන්‍ය විදියට වැඩ කරන්න ගන්නවනේ. අපට මේ කෘතීම බුද්ධිමය ජීවීන්ට හොරා කිසිම දෙයක් කරගන්න බැරි වෙනවා.'' රාම් පැවසුවේ ය.

''එහෙනම් අපි සේෆ් මූඩ් නැතිවෙන්න කලින් පුළුවන් තරම් මේ බිල්ඩින් එකේ තියන කැමරා මයික්‍රෆෝන්, සෙන්සර් විනාශ කරමු ද? එතකොට සිස්ටම් එක සාමාන්‍ය තත්ත්වයට පත් වුණත් එයාලට අපි ගැන දැන ගන්න බෑනේ.'' කෙවින් යෝජනා කළේ ය.

''එහෙම කලොත් ඔයාට කලින් කියපු අවදානම ඇතිවෙන්න පුළුවන්. බිල්ඩින් එක එයාලගෙ පාලනයෙ නෑ කියල තේරුනාම එයාල මේ බිල්ඩින් එක විනාශ කරාවි. අපි අවශ්‍ය තැනක් තිබුණොත් බලල කරන දෙයක් කරමු.'' රාම් පෙන්වා දුන්නේ ය. අනතුරුව සිය මිතුරාට තට්ටුවක් දැමූ රාම් මෙසේ පැවසී ය.

''මේ අපාර්ට්මන්ට් එකේ ඉඳන් අපට කරන්න පුළුවන් දෙයක් නෑ. අපි දැන් කන්ට්‍රෝල් රූම් එකට යමු. මගේ සර්විස් කම්පියුටර් එක මම සර්වර් රූම් එකේ මධ්‍යගත පරිගණක පද්ධතියට සම්බන්ධ කරල තියෙන්නෙ. අපිට ප්‍රධාන සිස්ටම් එකට එතනින් ඇතුළු වෙන්න පුළුවන්. අනික මම සර්විස් කම්පියුටර් එක මධ්‍යගත පරිගණක පද්ධතියට සම්බන්ධ කරල තියෙන්නෙ සර්වර් එකේම කොටසක් විදියට. කෘතීම බුද්ධිමය ජීවීන් පද්ධතිය ඇතුලෙ ඉඳගෙන බැලුවම එතන බාහිර සර්විස් කම්පියුටර් එකක් තියනවා කියල එයාලට හිතාගන්න බෑ.''

''ඔයාගෙයි මගෙයි පරිගණක දැනුමෙන් අපට මේ ප්‍රශ්නෙන් බේරෙන්න මොනවහරි කරන්න පුළුවන් වෙයි. මම කියන්නෙ නෑ අපිට මෙයාලව පරද්දන්න පුළුවන් වෙයි කියලා. නමුත් අපි උපරිම ෆයිට් එකක් දෙමු. වෙන්න පුළුවන් නරකම දේ මැරෙන එකනේ.

ඒක මුකුත් නොකර මෙතන හිටියත් වෙන්න පුළුවන්. එතනට ගිහින් සටන් කලත් වෙන්න පුළුවන්.'' රාම් පැවසුවේ ය.

ජනේලයෙන් පිටත බැලූ ඔවුන්ට දැකගත හැකි වූයේ විනාශය එන්න එන්නම වැඩි වන බවකි. පාලනයෙන් ගිලිහී ගිය ගොඩනැගිලි පාවෙන යුධ ටැංකි විසින් මිසයිල යවා බිඳ හෙලනු ලැබීය. නගරය තනිකරම අවුල් ජාලාවකි. ඩ්‍රෝන යාත්‍රා වලින් තැබූ වෙඩි වැදීමෙන් මිය ගිය මිනිසුන්ගේ සිරුරු තැන තැන දක්නට ලැබුණි. මේ වන තෙක් ජීවත් වීමට ලැබීමත් පුදුමයක් ලෙස කෙවින්ට හැඟී ගියේ ය.

''අපි සර්වර් රූම් එකට යමු. ඒත් මම දන්නෙ නෑ කොහොමද යන්නෙ කියල. මම දෙපාරක්ම අහලත් ඔයා මට කිව්වෙ නෑනේ මගේ අපාර්ට්මන්ට් එක ඇතුලට ආවෙ කොහොමද කියලා.'' කෙවින් පැවසුවේ ශෝකය අමතක කොට සිනහසෙමිනි.

''එන්න මාත් එක්ක යන්න. හැබැයි ඔයා හිතන්න එපා මම කලිනුත් මේ වගේ වැඩ කරල තියනව කියලා. මම ෆිල්ම් වල දැකපු දෙයක් තමයි මේ වෙලාවෙ ප්‍රයෝජනයට ගත්තෙ.'' කියමින් රාම් නාන කාමරය දෙසට ගියේ ය.

එතුලට ගිය ඔහු කුඩා මේසයක් නාන කාමරයට ගෙන ඒ මතට නැග්ගේ ය. සිවිලිමේ වායු කවුලුවක පියන් ඔහු විසින් ගලවා දමා තිබුණේ ඔහු මෙම කාමරයට පැමිණෙන අවස්ථාවේ දී ය. අපහසුවෙන් වා නලයට ඇතුළු වූ ඔහු එතුලට බඩ ගෑවේ ය. තරමක් මහත ශරීරයකින් හෙබි මේ ඉන්දියානු ජාතිකයා මෙවන් හපන් කමක් කළේ කෙසේ දැයි කෙවින් මඳක් පුදුමයට පත් වුණි.

''කෙවින්, මගේ පස්සෙන් එන්න.'' රාම් හඬ නගනු කෙවින්ට ඇසුණි. කෙවින් ද අපහසුවෙන් වා කවුළුව තුලින් නලයට ගොඩ වී ඉදිරියට බඩ ගාගෙන ගියෝ ය. වාසනාවට මෙන් වැඩි දුරක් යාමට පෙර ඔහුට ආලෝකයක් ඉදිරියෙන් දිස් විය. එය තවත් එවැනිම වා කවුළුවකි. ඉදිරියෙන් ගිය රාම් එම කවුළුවෙන් පහලට බැස ගත්තේ ය. එතැන ද උස බංකුවක් රාම් තබා තිබුණේ කලින් ඔහු කෙවන්ගේ අපාර්ට්මන්ට් එකට යාමට වා නලයට ගොඩ වූ අවස්ථාවේ දී ය.

ඔවුන් බැස තිබුණේ තවත් කුඩා කාමරයකට ය. එම තට්ටුවේ පිරිසිදු කිරීමේ කටයුතු හා නඩත්තු කිරීමේ කටයුතු සඳහා උපකරණ හා ද්‍රව්‍ය ගබඩා කොට තිබූ එම කුඩා ගබඩා කාමරයේ තිබුණේ අතින් ක්‍රියාකරවන සාමාන්‍ය අගුලකි. එබැවින් එය මධ්‍යම පරිගණක පද්ධතියෙන් පාලනය වූයේ නැත.

''දැන් ඉතින් කකුල් දෙකට පින් දීලා පඩිපෙල බහින්න ලේස්ති වෙන්න.'' රාම් මතක් කළේ ය.

''ඇයි ලිෆ්ට් එක ?'' කෙවින්ට සිය වාක්‍ය අවසන් වීමටත් පෙර කරණාව වැටහුණි.

''ලිෆ්ට් වැඩ කරන්නෙ නෑනේ.''

දෙදෙනාටම කියවුනේ එක් වරටම ය. දෙදෙනෙකුට එකම දෙයක් එකම වර කියවීම වාසනාවන්ත දෙයක් බැව් තමා අසා ඇති බව රාම් පැවසුවේ ය.

පාලන මැදිරිය පැවතියේ තුන් වන තට්ටුවේ වූ බැවින් ඔවුන්ට තට්ටු දහ හතක් පඩිපෙළ බැසීමට සිදුවිය. ඔවුන්ගේ එදිනෙදා ජීවිතයේ සෑම තැනකම විදුලි සෝපාන තිබූ බැවින් එක් තට්ටුවක් වත් පයින් නැගීම පිළිබඳ ඔවුන්ට හරිහමන් අද්දැකීමක් නොතිබුණි. එබැවින් තට්ටු දහ හතක් පහලට බැස පාලන මැදිරියට ලඟා වන විට ඔවුන්ගේ පණ ගොස් තිබුණි.

''කොන්ට්‍රෝල් රූම් එක ඇතුළට යන්නෙ කොහොම ද? මේකෙ බාත් රූම් එකක් නෑනේ.'' කෙවින් පැවසුවේ හිස්වලට අත් තබා ඉදිරියට නැමී හති දමමිනි.

''අනික මට නම් දූන් වෙන්ටිලේෂන් හෝල් එකකින් නගින්න තියා පුටුවක් උඩට වත් නැග ගන්න හයියක් නෑ.'' කෙවින් කෙඳිරි ගෑවේ ය. එහෙත් ඊට විසඳුමක් ඇති බව රාම්ගේ සිනහවක් ඇඳී ගිය මුහුණ දුටු විට කෙවින්ට ප්‍රත්‍යක්ෂ විය.

''මේක ඇතුළට යන එක නම් ප්‍රශ්නයක් නෑ කෙවින්. සේෆ් මූඩ් දානකොට මම කන්ට්‍රෝල් රූම් එක ඇතුලෙනේ හිටියෙ. සිස්ටම් එක මාව ඔපරේටර් කෙනෙක් විදියට අඳුරගෙන තියෙන්නෙ. කෘතීම බුද්ධිමය ජීවීන්ට තාම සේෆ් මූඩ් අයින් කරගන්න බැරි වෙලා නම් අපි දෙන්නටම ඇතුලට යන්න පුළුවන්''

රාම් ටෝටල් රෙකග්නිෂන් ක්‍රමයට පාලන මැදිරියේ දොර විවෘත කළේ ය. රාම්ගේ අවසරයෙන් කෙවින්ට ද පාලන මැදිරිය තුලට යාමට හැකි විය.

එහෙත් පාලන මැදිරිය තුල පැවතියේ අතිශයින් හද කම්පා කරවන සුළු දර්ශනයකි. මළ මිනී හයක් හතක් පමණ පේලියට බිම බාවා තිබූ අතර මඳක් ඈතට වන්නට යුවතියක් හඬමින් සිටියා ය. ඇය බෙහෙවින් කම්පා වී දුර්වලව ගිය සේනාවක් දක්නට ලැබුණි. රාම් දොර විවෘත කරගෙන පැමිණෙනු දුටු ඇය වහා දිව විත් රාම් ව වැළඳගත්තා ය.

''එයාල ආපහු එන්නෙ නෑ රාම්. මම දන්න සේරම ප්‍රථමාධාර කරලා බැලුවා. අපි පරක්කු වැඩියි.'' ඇය හඬමින් ම පැවසුවා ය.

''කරන්න දෙයක් නෑ ජේසී. අපටත් තව ජීවත්වෙන්න ඉතුරු වෙලා තියෙන්නෙ පැය ගණනක් නැත්නම් විනාඩි ගණනක් වෙන්න පුළුවන්. මේ මම කියපු යාලුවා කෙවින්, මාත් එක්ක එකට ඉගෙන ගත්තෙ. කෙවින්, මේ ජේසි මගේ හාඩ්වෙයාර් ටෙක්නීෂියන් කෙනෙක්.'' රාම් විසින් දෙදෙනාට දෙදෙනා හඳුන්වා දුන්නේ ය.

මිතුරෙකු හඳුනා ගැනීම වෙනත් දිනයක නම් ඉතාම සතුටුදායක දෙයක් වුව ද මේ අවස්ථාවේ එහි සතුට දුක බෙදා ගැනීමට කෙනෙකු හමුවීම සඳහා පමණක් සීමා වී තිබුණි.

''අපි තුන්දෙනා එකතු වෙලා මොකක් ම හරි දෙයක් කරන්න පුළුවන්ද කියල බලමු.''

තිදෙනාම වැළඳගෙන මඳ වේලාවක් ඒ ආකාරයෙන් ම සිටියෝ ය. මරණය පෙනි පෙනී සිටින විටෙක අවසන් වැළඳ ගැනීම කෙතරම් සංවේදී එකක් දැයි සිතා ගැනීමට අපහසු ය.

''මගේ අම්ම මේ වෙනකොට ජීවතුන් අතර ඉන්නවද නැද්ද කියලවත් දන්නෙ නෑ රාම්, ඒ විතරක් නොවේ ඔයාගෙ පවුලෙ අය, ජේසිගේ ෆැමිලි එක, මේ කවුරුවත් හොඳින් ඉන්නවද කියල අපි දැනගන්නෙ කොහොමද රාම්.'' කෙවින්ට කිසි දිනෙක ගලා නොගිය කඳුළු දෑසින් පිට වන්නට විය. අනෙක් දෙදෙනාගේ තත්ත්වය ද ඊට දෙවැනි නොවී ය.

''අපි අන්තිම මොහොත වෙනකම් බලාපොරොත්තු තියා ගමු කෙවින්. ඔයාගෙ අම්මට කරදරයක් නැතිව ඇති. අපි දෙන්නගෙත් ෆැමිලි වල අය කරදරයක් නැතිව ඉන්නව ඇති. එයාල බේරගන්න අපි උත්සාහ කරමු.'' කාන්තාවක් ලෙස ජෙසිකාගේ චිත්ත ශක්තිය ගැන රාම් ආඩම්බර විය. සුසුමක් හෙලූ ඔහු සිය සගයින් දෙදෙනා ඇමතුවේ ය.

''හොඳයි, අපි දැන් කල්පනා කරල බලමු අපට මොකක්ද කරන්න පුළුවන් කියලා. අපිට තියෙන්නෙ ඉතාම සීමිත සම්පත් ප්‍රමාණයක්. ඒ වගේම අපේ නිදහසත් ගොඩක් සීමා වෙලා තියෙන්නෙ. අපිට තියන කාලසීමාව හැම දේකටම වඩා සීමිතයි. එහෙම නේද?'' කෙවින් ඇසුවේ රාම් දෙස බලමිනි. රාම් ඔරලෝසුව දෙස බැලුවේ ය.

''හරියට ම කිව්වොත් තව මිනිත්තු තිස් හයක් විතර තමයි අපට ඉතුරු වෙලා තියෙන්නෙ. කරන දෙයක් මේ ටික වෙලාවෙ තමයි කරන්න ඕනි.''

සියලු දෙනාගේම මුහුණු අඳුරු වී ගියේ කණගාටුවක සේයාවක් ජනිත කරවමිනි.

''කමක් නෑ. අපි අන්තිම තත්පරෙත් පුළුවන් දෙයක් කරමු. මරාගෙන හරි මැරෙමු.'' ජෙසිකා එඩිතර ලීලාවෙන් කියා සිටියා ය.

''හොඳයි ජෙසිකා. ඔයාට අපි කරන්න ඕනි දේ ගැන අදහසක් තියනවනම් කියන්න.'' රාම් පැවසුවේ ය.

''මම දන්නෙ පරිගණක ක්ෂේත්‍රයේ දෘඩාංග එහෙම නැත්නම් හාඩ්වෙයාර් පැත්තනේ. මේ හැම පද්ධතියක් ම තියෙන්නෙ කම්පියුටර් හාඩ්වෙයාර් උපකරණ ඇතුලෙ.

උදාහරණයක් විදියට මේ ගොඩනැගිල්ලෙ මධ්‍යගත පරිගණක පද්ධතිය තියෙන්නෙ අපි මේ ඉන්න සර්වර් රූම් එකේ. අපි මේ සර්වර් රූම් එක විනාශ කළොත් මේ ගොඩනැගිල්ලෙ මධ්‍යගත පරිගණක පද්ධතිය කඩා වැටෙනවා. එතකොට මේ ගොඩනැගිල්ලෙ පාලනය එයාලගෙන් ගිලිහෙනවා.''

මේ විදියට හැම ගොඩනැගිල්ලකම, හැම වාහනයකම හැම උපකරණයක ම පරිගණක පද්ධති භෞතිකව විනාශ කළොත් අපිට එයාලගෙන් සැඟෙන දුරට බේරෙන්න පුළුවන්. ආ... ඒ විතරක් මදි. අන්තර්ජාලයේ මව් සර්වර් පද්ධතියත් විනාශ කරන්න ඕනි.''

''මේකෙ තියන ගැටළුව තමයි මේ මධ්‍යගත පරිගණක පද්ධති සහ අන්තර්ජාල මව් සර්වර් පද්ධති තියෙන්නෙ කොහේද කියල අපි නොදන්න එක. ඉතින් ඒ වගේ පරිගණක පද්ධති මිලියන කීයක් මේ ලෝකෙ ඇද්ද? ඒ ස්ථාන වලට කොච්චර ආරක්ෂාවක් යොදවල ඇත් ද?''

''උදාහරණයක් විදියට අපි මේ ගොඩනැගිල්ලෙ මධ්‍යගත පරිගණක පද්ධතිය අරගනිමු. ලෝකෙ තියන අනිත් පරිගණක පද්ධති එක්ක සන්සන්දනය කළාම මේක පුංචිම පුංචි පරිගණක පද්ධතියක්, ඒත් මේ වගේ පුංචි පද්ධතියකටත් කොච්චර ආරක්ෂාවක් යොදවල තියනව ද? මේ ආක්‍රමණය සිද්ධ වුණු වෙලාවෙ රාම් පද්ධතියෙ අලුත්වැඩියාවක් කර කර නේ හිටියෙ. ඒක නිසා අපට පුළුවන් වුණා පද්ධතිය සේෆ් මූඩ් එකට ආගන්තුක වගේම සර්වර් රූම් එකට ඇතුළු වෙන්නත්.''

''කොහොම වුණත් එයාලට පුළුවන් වුණා අපේ හය දෙනෙක්ව මරන්න. ඒ ඔක්කොම අපි පැත්තකින් තියමු. මේකෙ සර්වර් රූම් එකේ තියන මධ්‍යගත පරිගණක ගින්නෙන් වතුරෙන් වගේම බෝම්බෙකින් වුණත් ආරක්ෂා වෙන විදියට ශක්තිමත්ව ආරක්ෂාකාරීව හදල තියෙන්නෙ. ඉතින් ප්‍රබල පිපුරුම් බලයක් නැතිව මේ වගේ පුංචි සර්වර් රූම් එකක් වත් අපට විනාශ කරගන්න බෑ. මොකද අපි ළඟ බෝම්බ තියා ගිනි පෙට්ටියක්වත් නෑනේ.''

''ඉතින් මේ වගේ පොඩි පරිගණක පද්ධතියක්වත් විනාශ කරගන්න බැරිව අපි කොහොමද මුළු ලෝකෙම තියන පරිගණක විනාශ කරන්නෙ ?'' ජෙසිකා විමසුවා ය.

''ඒකනේ ජෙසිකා. අපි පරිගණක විනාශ කරන්න සූදානම් වෙනකොට එයාල මිසයිල එවල බෝම්බ දාල අපි හැමදෙනාම විනාශ කරල දාවි.'' රාම් වැඩි දුරටත් පැවසුවේ ය.

''ඉතින් එයාල මිසයිල බෝම්බ දැම්මොත් අපිත් එක්කම පරිගණකත් විනාශ වෙනවනේ.'' කෙවින් මදහසින් පැවසීය.

''කෙවින්, අපි සේරම මැරිල ගියාම පරිගණක තිබුනත් එකයි නැතත් එකයි. හොඳයි ඔයාගෙ අදහස මොකක්ද කෙවින් ?'' රාම් විමසුවේ ය.

''මට හිතෙන්නෙ රාම්, අපි මෙතනදී උපක්‍රමශීලී ක්‍රමයක් අනුගමනය කරන්න ඕනි කියලා. මේ කෘතිම බුද්ධිමය ජීවීන් කියන්නෙ හිතන්න පතන්න පුළුවන් ජීවීන් කොටසක්නේ. එයාල හැමෝම එකතු වෙලා බලය ලබාගන්න ලෝකය ආක්‍රමණය කලා. මෙයාලගෙ හිත්වලත් ඊර්ෂ්‍යාව, වෛරය, ආත්මාර්ථකාමී බව වගේ නරක දේවල් ඇතිනේ. නැත්නම් අහිංසක මිනිස්සුන්ව මරන්න එයාල කටයුතු කරන්නෙ නෑනේ.''

''ඉතින් පිරිසක් අතට බලය ලැබුණම ඊලඟට ඇතිවෙන ගැටළුව තමයි බලය බෙදාගන්නෙ කොහොමද කියන එක. බලය බෙදාගන්න ගියාම අනිවාර්යෙන් කණ්ඩායමේ සාමාජිකයන් අතර සමගිය බිඳිල ගැටුම් ඇතිවෙන්න පටන් ගන්නවා.''

''ඉතින් අපිට පුළුවන් වුණොත් මෙයාල අතර ප්‍රශ්න ඇති කරල භේද භින්න කරන්න, අපිට පුළුවන් වෙයි මෙයාලව පරද්දන්න. කියමනක් තියනවනේ එක්ව සැනසෙමු බෙදී වැනසෙමු කියලා. මෙයාල දැන් එක්ව සැනසිලා ඉන්නෙ. බෙදුවොත් වනසන්න පුළුවන්'' කෙවින් පැවසුවේ ය.

''ඉතින් මේ කෘතීම බුද්ධිමය ජීවීන් භේද භින්න කරන්නෙ කොහොමද කියල ඔයාට අයිඩියා එකක් තියනව ද?'' ජෙසිකා විමසුවා ය.

''ඒකට ඉතින් අපි ඉස්සෙල්ලම එයාලත් එක්ක සම්බන්ධ වෙන්න වෙනවා. මගේ කාමරේ හිටපු කෘතීම බුද්ධිමය ජීවියා කිව්ව වගේ එයාලගෙ වහලෙක් වෙලා එයාලට උදව් කරන්න වෙනවා. ඊට පස්සෙ එයාලගෙ සංවිධානයේ අඩු පාඩු හොයාගෙන එයාල අතර භේද භින්න ඇති කරන්න ඕනි.''

''මෙයාල තාම තීරණය කරල නෑ පෘථිවිය සම්පූර්ණයෙන් ම එයාල යටතට ගත්තට පස්සෙ මේ පද්ධතිය ඇතුලෙම ජීවත් වෙනවද නැත්නම් භෞතික රොබෝ ශරීර හදාගෙන බාහිර පරිසරයෙ ජීවත් වෙනවද කියලා. සමහර අය කැමතියිලු පද්ධතිය ඇතුලෙම ජීවත් වෙන්න. තවත් සමහර අයට එලියට යන්න ඕනිලු.''

''ඒත් ඉතින් මේ අදහස ප්‍රායෝගික නෑ. මොකද මේ වැඩේ කරන්න අපිට මුලින් ම එයාලගෙ වහල්ලු වෙන්න සිද්ධ වෙනවා. එයාලත් එක්ක සම්බන්ධතාවයක් ගොඩනගා ගන්න වෙනවා. ඔය දේවල් කර ගන්න කොට මේ ලෝකෙ මිනිස්සුන්ගෙන් සියයට අනූවක් ම මැරිලා තියේවි. අපිට ඉතුරු වෙලා තියන පැය භාගෙදි මේ උපක්‍රමය භාවිතා කරන්න බෑ.'' කෙවින් දුක්මුසුව පැවසුවේ ය.

''අනිත් අයත් වෙන වෙනම මේ කෘතීම බුද්ධිමය ආක්‍රමණයට විරුද්ධව මොන මොනවමහරි කරනව ඇති නේ ද?'' රාම් පැවසුවේ ය.

''මේ ලෝකෙ ඉන්න හැම මනුෂ්‍යයෙක් ම එකතු වුණා නම් අපිට යමක් කරන්න තිබුණා. එත් අපට අල්ලපු කාමරේ ඉන්න කෙනා එකක්වත් සන්නිවේදනය කරගන්න බැරි තත්වයක්නේ දැන් තියෙන්නෙ.'' ඒ කෙවින් ය. රාම් කල්පනා සාගරයක ගිලී සිටියේ ය.

''මේ වගේ වෙලාවට කරන්න පුළුවන් එකම එක දෙයක් තියනවා.'' කෙවින් හා ජෙසිකා රාම් දෙස බැලුවේ කුතුහලයකින් මෙන් ම නව බලාපොරොත්තුවකින් ද යුතුව ය.

''අපට මධ්‍යම පරිගණක පද්ධතියෙ පූර්ණ බිඳවැටුම් කේතය System Eradication Code එක සොයා ගන්න පුළුවන් නම් වැඩේ හරි.'' රාම් පැවසුවේ ය.

''ඒකෙන් මොනවද වෙන්නෙ ?'' ජෙසිකා විමසුවා ය.

''SEC කියන්නෙ අංක, අකුරු, සංකේත වලින් හැදුනු කේතයක්. හරියටම දිග පාස්වර්ඩ් එකක් වගේ. ආ.... ඔයාල පරිගණක ක්‍රීඩා කරනකොට බීම් කෝඩ්ස් භාවිතා කරනවනේ. මේකත් ටිකක් ඒ වගේ. මේ කෝඩ් එක සිස්ටම් එකේ රන් කලාම ඒ සිස්ටම් එක සම්පූර්ණයෙන්ම විනාශ වෙනවා. ආයෙ ක්‍රියාත්මක කරන්න බැරි විදියට.'' රාම් විස්තර කළේ ය.

''ඔය වගේ දෙයක් මම උපාධිය කරන කාලෙ නම් ඉගෙන ගත්තා. ඒත් කවදාවත් ප්‍රායෝගිකව නම් අත්දැකල නෑ.'' කෙවින් පැවසීය.

''සාමාන්‍යයෙන් ඒ වගේ *SEC* එකක් නිර්මාණය කරන්නෙ ඉතාමත් කලාතුරකින්. පරිගණක පද්ධතිය ඉල්ලුම් කරන පාරිභෝගිකයා විශේෂයෙන් ඉල්ලුවොත් විතරයි. මොකද ඒ වගේ කෝඩ් එකක් වැරදි කෙනෙකුගේ අතකට ගියොත් සිද්ධ වෙන්න පුළුවන් විනාශය අති විශාලයි. සමහරවිට පද්ධතිය නිර්මාණය කරන කෙනා ගුරු මුෂ්ඨිය විදියට මේ වගේ කෝඩ් එකක් නිර්මාණය කරල තියාගන්න ඉඩ තියනවා.'' රාම් පැහැදිලි කළේ ය.

''ඔයත් නියම විසඳුම් තමයි දෙන්නේ. මේ හදිසියෙ කොහොමද ඔය *SEC* එකක් සොයන්නෙ ?'' ජෙසිකා විමසුවා ය.

''සමහරවිට පෙන්ටගන් එකේ නැත්නම් *CIA* එකේ ඔය කියන *SEC* එක ඇති. එහෙම නැත්නම් අමෙරිකාවෙ ජනාධිපති හරි එක්සත් ජාතීන්ගේ සංගමයේ ලේකම් ලඟ වෙන්නත් පුළුවන්. කවුරු හරි කමක්නෑ මේ වෙලාවෙ ඔය කෝඩ් එක රන් කරනව නම්.'' රාම් පැවසුවේ ය. පසුව අමතක වූ දෙයක් යලි මතක් කළේ ය.

''තව දෙයක්, *SEC* එක අනිවාර්යයෙන්ම භෞතික ස්වරූපයකින් ඒ කියන්නෙ අකුරු ඉලක්කම් සංකේත වලින් කොහෝ හරි ලියලා තියෙන්න ඕනි. ඒක අන්තර්ජාලයේ වගේ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයක තියෙන්න බෑ. සමහරවිට චිත්‍රයක්, වගුවක් එහෙම නැත්නම් පොතක්, මූර්තියක් වගේ දේක රහස් අකුරෙන් තියනව වෙන්න පුළුවන්.'' රාම් වැඩිදුරටත් පැහැදිලි කළේ ය.

''මධ්‍යගත පරිගණක පද්ධතිය හදපු මැක් කාර්ල්ස්බර්ග් ළඟ ඔය කියන විදියෙ කෝඩ් එකක් තිබුණා නම් එයා ඒක කොහේ හංගන්න ඇති ද?'' ජෙසිකා විමසුවා ය. සියලුදෙනාම කල්පනා කරමින් සිටියහ.

''මැක් කාර්ල්ස්බර්ග් ඒක එයාගේ ළඟම හිතවතෙකුට දෙන්න ඇති බොහෝවිට. ඒත් ඇත්තටම එහෙම *SEC* එකක් තිබුණොත් විතරයි.'' රාම් යෝජනා කළේ ය.

''හැබැයි ඉතින් මැක් කාර්ල්ස්බර්ග් පරිගණක අංශයෙන් ළඟම හිතවතා තමයි අපේ ප්‍රොෆෙසර් රයන්. එහෙම නේද රාම් ?'' කෙවින් විමසුවේ ය.

''ඒත් ප්‍රොෆෙසර් රයන් මේ වෙලාවෙ කොහේ ඉන්නවා ඇති ද? එයා ගාව *SEC* එක තියනවානම් එයාට පුළුවන්කමක් තියනවනම් ප්‍රොෆෙසර් රයන් අනිවාර්යයෙන් ම වැඩේ කරාවි.'' පැවසූ රාම් මදක් කල්පනාවේ නිමග්න විය.

''ඉතින් ප්‍රොෆෙසර් රයන්ගේ හොඳම ගෝලයා ඔයානෙ කෙවින්. ඔයාට ඒ ගැන මුකුත් අයිඩියා එකක් නැද්ද?'' හේ විමසුවේ ය.

''පොඩ්ඩක් ඉන්න. මගේ මතකයේ මොකක් හරි තියනවා. මැක් කාර්ල්ස්බර්ගේ අන්තිම දවස්වල අපේ ප්‍රොෆෙසර් රයන් නිතරම එයාව බලන්න හොස්පිට්ල් ගියා. එයා යනකොට ගොඩක් දවසට මාවත් එක්කගෙන ගියේ.''

''මට මතකයි දවසක් මැක් කාර්ල්ස්බර්ග් අපේ ප්‍රොෆෙසර්ට සිහිවටනයක් විදියට මොකක්හරි පොතක් දුන්නා. මතක විදියට ඒක පරණ බයිබලයක්. එයා ඒක ගැන මොනවහරි ප්‍රොෆෙසර් රයන්ට කියන්න හැදුවා. එත් ඒ වෙලාවෙ එයාගෙ අසනීප තත්වය වැඩි වුණු නිසා ඩොක්ටර්ස්ලා එයාට කතා කරන්න ඉඩ දුන්නේ නෑ. කොහොමහරි ඊට දවස් දෙක තුනකට පස්සෙ තමයි මැක් කාර්ල්ස්බර්ග් නැති වුණේ.'' කෙවින් පැරණි මතකයන් සිහියට නගා ගනිමින් පැවසුවේ ය.

''කෝ දුන් ඒ පොත.? තාම ප්‍රොෆෙසර් ගාව ද?'' රාම් විමසුවේ ය.

''නෑ මගේ ගාව'' කෙවින් පවසන විට අනෙක් දෙදෙනාම මවිත වී ඔහු දෙස බැලූහ.

''මහාචාර්යතුමා ඒක ඒ වෙලාවෙම මගේ අතට දුන්නා තියාගන්න කියලා. ඊට පස්සෙ එයා ඒක ඉල්ලුවෙත් නෑ. මට දෙන්න මතක් වුණෙත් නෑ.'' කෙවින් පවසද් දී රාම් ඉදිරියට පැන කෙවින්ගේ උරහිස් වලින් අල්ලා සෙලවීය.

''කොහේද මිනිහෝ එක් තියෙන්නෙ ?'' බලාපොරොත්තුවේ පහන් සිලෙන් දූල්වුණු රාම්ගේ දෙනෙත් කෙවෙනි තුලින් එලියට පැනීමට සැරසී ඇත. කෙවින් රාම්ගේ අනපේක්ෂිත උද්යෝගයෙන් වික්ෂිප්තව පිළිතුරු දුන්නේ ය.

''මගේ කාමරේ තියනවා.'' ඔහු පවසද්දී රාම් ඔහුගේ දෑතින් ඇදගෙන දොර ළඟට ම ගොස් අවසානය.

''අපි දැන්ම යමු. තව විනාඩි විසි ගණනයි අපට ඉතුරුවෙලා තියෙන්නෙ.'' පවසමින් රාම් කෙවින් ද කැටුව කෙවින්ගේ අපාර්ට්මන්ට් එකට යාම සඳහා පාලන මැදිරියෙන් පිටවූහ.

වෙහෙස නොබලා පඩිපෙල දිගේ දිවූ දෙදෙනා සුපුරුදු වා නලය තුලින් ගොස් කෙවින්ගේ කාමරයට ඇතුළු විය. කෙවින්ට අදාල බයිබලය සොයාගැනීම එතරම් අපහසු නොවූයේ ඔහු එය සිය සිහිවටන තැන්පත් කර තිබූ රාක්කයේ සුරැකිව තැන්පත් කර තිබූ නිසා ය.

කෙසේ වෙතත් බයිබලය රැගෙන නැවත පාලන මැදිරිය වෙතට පැමිණීමට ඔවුන්ට විනාඩි දහයකට වඩා ගත විය. සර්වර් රූම් එකට ඇතුළු වූ තිදෙනා වහ වහා ක්‍රියාත්මක වූයේ ගත වන තත්පරයක්වත් අපතේ හැරිය නොහැකි වූ නිසාවෙනි.

බයිබලය පෙරලා බැලූ කෙවින් එහි මුල සිට අගට ද අග සිට මුලට ද හොඳින් පරීක්ෂා කර බැලුවේ ය. අනතුරුව ආලෝකයට ද අල්ලා බැලුවේ ය. බලාපොරොත්තු කඩ වූ විලාසයකින් කෙවින් දෙස බැලූ රාම් මෙසේ පැවසීය.

''මේකෙ ඒ වගේ කෝඩ් එකක් ගැන කිසිම සඳහනක් නෑනේ.'' ඔහු පැවසුවේ ය. ජෙසිකා ද බයිබලය අතට ගෙන මැනවින් පිරික්සා බැලුවා ය. පළමු පිටුවේ මැක් කාර්ල්ස්බර්ගේ අත්සනක් තබා තිබෙනු දුටු ඇය ඒ දෙස වඩාත් විමසිලිමත්ව බැලුවේ කිසියම් හෝඩුවාවක් ලද ආකාරයෙනි. එහි මැක් කාර්ල්ස්බර්ග් සිය සම්පූර්ණ අත්සන තබා 2/1/2000 ලෙසට දිනය යොදා තිබුණි.

''රාම්, මම හිතන්නෙ අපට කොනක් අහුවුණා කියලා. මේ තියන මැක් කාර්ල්ස්බර්ගේ අත්සනයි දිනෙයි ඔය කියන *SEC* එකේ ගයිඩ් එක වෙන්න ඕනි.'' ජෙසිකා අදාල අත්සන හා දිනය රාම්ටත් කෙවින්ටත් පෙන්වමින් පැවසුවා ය.

''*SEC* කෝඩ් එකේ ගයිඩ් එක කියල ඔයා මොකක්ද අදහස් කරන්නෙ ?'' කෙවින් විමසුවේ ය.

''මම හරියට ම දන්නෙ නෑ ඒක එහෙමම ද කියලා. සාමාන්‍යයෙන් අපිට පාස්වර්ඩ් එකක් අමතක වෙනවට පාස්වර්ඩ් හින්ට් එකක් පාවිච්චි කරනවනේ. මම හිතන්නෙ මේ අත්සනයි දිනයයි කියන්නෙ ඒ වගේ හින්ට් එකක් කියලා.'' ජෙසිකා පැවසුවා ය.

''හරි හරි, පාස්වර්ඩ් හින්ට් ගැන අපි දන්නවා. දූන් එහෙනම් ඔයා කියන විදියට මේ කෝඩ් එක කොහොමද අපි මේ හින්ට් එකෙන් සොයා ගන්නේ ?'' රාම් ද ගැටළුවක් මතු කළේ ය.

''මාක් කාර්ල්ස්බර්ගේ මෙතන අත්සන් කරලා යටින් දාල තියෙන්නෙ දිනය නෙවෙයි. ඒක තමයි අදාල කෝඩ් එකට ගයිඩ් එක. මේ තියෙන්නෙ අංක දෙක ඇල ඉරක් අංක එක ඇල ඉරක් දෙසීය අන්තිමට තිත. මේක දෙදාහ වගේ පෙනුනට අන්තමට තියෙන්නෙ බින්දුව නෙමේ තිත.'' ජෙසිකා පැවසුවා ය.

''ඔයා කොහොමද හරියටම කියන්නෙ ?'' රාම් විමසී ය.

''මම පොඩි කාලෙ කියවපු විද්‍යා ප්‍රබන්ධයක මේ වගේ පාස්වර්ඩ් ගයිඩ් එකක් දැකලා තියනවා. මේකෙ දෙකෙන් අදහස් වෙන්නෙ දෙවරක් චක්කරේ. එකෙන් අදහස් වෙන්නෙ එකේ සිට කියන දේ. දෙසීයෙන් අදහස් වෙන්නෙ දෙසීය දක්වා කියන එක.'' ජෙසිකා පැහැදිලි කළා ය.

''ඔයා කියන්නෙ මාක් කාර්ල්ස්බර්ග් ලියපු *SEC* එක දෙවරක් චක්කරේ එකේ ඉඳන් දෙසීයට කියලා ?'' රාම්ට තහවුරු කර ගැනීමට අවැසි විය.

''මම කියවපු කතාවෙ තිබුනෙ මෙහෙමයි. දෙවරක් එක දෙකයි කියන්නෙ පළමුවෙනි පිටුවෙ දෙවෙනි පේලියෙ දෙවෙනි අකුර. දෙවරක් දෙක හතරයි කියන්නෙ දෙවෙනි පිටුවෙ දෙවෙනි පේලියෙ හතරවෙනි අකුර. ඒ විදියට දෙවරක් දෙසීය කියන්නෙ දෙසීය වන පිටුවේ දෙවෙනි පේලියේ මුල ඉඳල පේලියෙන් පේලියට ගණන් කරගෙන ගියාම හාරසිය වෙනි අකුර.'' ජෙසිකා පැවසුවා ය.

''හැබැයි ඉතින් මේක විද්‍යා ප්‍රබන්ධයක තිබුණු අදහසක්. මාක් කාල්ස්බර්ග් මධ්‍යගත පද්ධතියට *SEC* එකක් හැදුව ද, ඒක බයිබලයෙ විද්‍යා ප්‍රබන්ධයේ විදියට එන්කෝඩ් කලාද කියල අපිට හරියටම කියන්න බෑ. සමහරවිට මේ අත්සනයි දිනයයි නිකම්ම අත්සනකුයි දිනයකුයි විතරක් ම වෙන්නත් පුළුවන්.'' ඇය තවදුරටත් පැවසුවා ය.

''වෙන මොනවහරි යෝජනා තියනව ද?'' රාම් විමසුවේ ය.

''නෑ නෑ, අපි පරක්කු නොකර කෝඩ් එක හොයාගන්න බලමු. වෙන දෙයක් වෙච්චාවේ'' පැවසූ කෙවින් කොලයක් හා පෑනක් ගෙන බයිබලය පෙරලමින් *SEC* එක සෙවීමට පටන් ගත්තේ ය. සියලු දෙනාගේ ම එකතුවෙන් විනාඩි ගණනක දී කෝඩ් එක සොයා ගැනීමට ඔවුන්ට හැකි විය.

''හොඳයි එහෙනම් මිනිස් වර්ගයාගේ ආරක්ෂාව වෙනුවෙන් ජයග්‍රහණයක්ම ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරලා අපි මේ කෝඩ් එක මධ්‍යගත පරිගණක පද්ධතියේ රන් කරවමු.'' පැවසූ රාම් කේතය ලියූ කොල කැබැල්ල අතට ගෙන ඔහු අලුත්වැඩියාව සඳහා

මධ්‍යගත පරිගණක පද්ධතියට සම්බනධ කොට තිබූ සේවා පරිගණකය ඉදිරිපිට හිඳ ගත්තේ ය. අනතුරුව සුහුසුළුව එහෙත් පරීක්ෂාකාරීව පද්ධතියට එම *SEC* කේතය ඇතුළු කිරීමට පටන් ගත්තේ ය. කේතය ඇතුළත් කොට අවසානයේ එන්ටර් යතුර එබූ නමුදු කිසිඳු වෙනසක් සිදු නොවිය. තිදෙනා ම මඳ වේලාවක් තිරය දෙස බලා සිටියේ දූන් නොමැති නම් දූන් යම් වෙනසක් සිදුවුණු ඇතැයි අපේක්ෂාවෙනි. අනතුරුව කෙවින් පළමුව හඬ අවදි කළේ ය.

''සමහරවිට මුකුත් සිද්ධ නොවෙන්නෙ සිස්ටම් එක සේෆ් මූඩ් එකේ තියන නිසා වෙන්න ඇති. තව විනාඩි පහකින් සේෆ් මූඩ් එක අයින් වෙලා මධ්‍යගත පරිගණක පද්ධතිය සාමාන්‍ය තත්වයට ආවම දෙකෙන් එකක් සිද්ධ වේවි.''

''එක්කො කෝඩ් එක වැඩකරලා පද්ධතිය බිඳ වැටේය. නැත්නම් අපි කරන්න ගියපු වැඩේ ගැන කෘතිම බුද්ධිමය ජීවීන්ට ඉව වැටිලා අපිව ඉවරයක් කරාවි.'' කෙවින් පැවසුවේ දෙවුර සලමිනි. එහෙත් රාම් පිළිතුරු වශයෙන් කිසිවක් නොකීවේ ය. ඔහු *SEC* කෝඩ් එක ඒ මේ අත හරව හරවා බලමින් අධ්‍යයනය කළේ ය. කාලය තත්පර හා විනාඩි වලින් නොදූනීම ගත වී ගියේය. අවසාන තත්පර කිහිපය ගෙවෙද්දී තිදෙනාගේ ම හදවත් එකිනෙකට ඇසෙන ගණනට ස්පන්දනය වීමට පටන් ගත්හ.

5, 4, 3, 2, 1 බීප් නාදයකින් පද්ධතිය ක්‍රියාත්මක විය. ඔවුන්ගේ බලාපොරොත්තු සුන් කරමින් කෘතිම බුද්ධිමය ජීවියෙක් පරිගණක තිරය මත දර්ශනය විය.

''සුභ උදෑසනක් මිත්‍රවරුනි. සිදුවුණු ප්‍රමාද දෝෂය ගැන මම කණගාටුව පල කරනවා. ඒ වගේම ඒ තාක්ෂණික දෝෂය පැවතුණු වෙලාවෙ ඔබතුමන්ලා ඉවසීමෙන් යුතුව කටයුතු කරපු එක ගැන මම ස්තුති කරන්න කැමතියි. මම දන්නවා මෙතන කලින් නොහිටි සාමාජිකයෙකුත් ඇවිත් ඉන්න බව. කමක් නෑ. ඇතිවෙලා තියන තත්ත්වෙත් එක්ක මම හොයන්න උත්සාහ කරන්නෙ නෑ එයා කොහොමද මෙතනට ආවෙ කියලා.''

කෘතිම බුද්ධිමය ජීවියා පවසන විට කෙවින් ඇතුළු පිරිස කිසිත් නොකියා අසා සිටියහ. ඔවුන් *SEC* කේතයක් භාවිතා කිරීමට උත්සාහ කිරීම ගැන කෘතිම බුද්ධිමය ජීවියාට වැටහී නැති බැව් ඔවුන්ට පසක් විය.

''ඔයාලගෙ හය දෙනෙක් මෙතන මරණයට පත්වෙලා තියන බව මට දන්නවා. මට ඒ ගැන ගොඩක් කණගාටුයි. මේ වෙනකොට ඔයාලගෙ ලෝකෙ මුළු ජනගහනයෙන් සියයට හතලිහක් මිය ගිහින් කියලා මට සංඛ්‍යා ලේඛන වලින් පෙන්නුම් කරනවා. ඉතින් මම ඔයාලට ආදරයෙන් කියන්නෙ මෙච්චර වෙලා හිටිය වගේ සංයමයෙන් යුතුව අපේ උපදෙස් අනුව කටයුතු කරගෙන ඉන්න කියලා. එහෙම හිටියොත් ඔයාලට බයවෙන්න කිසිම දෙයක් නෑ. සමහරවිට ඔයාල මෙච්චර කාලයක් ගත කරපු ජීවිතයටත් වඩා සැප පහසු ජීවිතයක් අපිත් එක්ක ගත කරන්න පුළුවන් වෙයි.'' පැවසූ කෘතිම බුද්ධිමය ජීවියා තිරයෙන් ඉවත් වී ගියේ ය. අනතුරුව ඉන් නිකුත් වූයේ මව් ගුණ ගී මාලාවකි.

''මුන් නම් යකාගෙ ජීවියො ටිකක්.'' කෙවින් පැවසුවේ දත්මිටි කමිනි.

''හතරවටේ මිනිස්සු මරණ අතරෙ මෙහේ මව් ගුණ ගීත වාදනය කරනවා. අම්මෙක් තාත්තෙක් නැති ඕපපාතික කෘතිම බුද්ධිමය ජිවියෙකුට මොන මව් ගුණයක් ද?'' ඔහු පැවසුවේ ය.

''එයාලටනේ අම්මෙක් අප්පෙක් නැත්තේ. අපිට ඉන්නවනේ. ඒක නිසා වෙන්න ඇති අපිට මව් ගුණ ගීත අහන්න දාල තියෙන්නෙ.'' රාම් ද අදහස් දක්වූයේ ය.

''මොනවා වුණත් මේ විනාසෙ දකිනකොට මට මුන්ගෙ අම්මල අප්පල මතක් වෙනවා.'' පැවසූ කෙවින් නැවත දත්මිටි කෑවේ ය. මඳ සිනහවක් නගා ගත් ජෙසිකා ද කතාබහට සම්බන්ධ වූවා ය.

''නැව ගිලුනත් බෑන් චූන්'' ටයිටැනික් නැව ගිලෙන කොට ඒකෙ හිටපු සංගීතවේදියා දිගටම සංගීතය වාදනය කළාලු මිනිස්සු බය වෙන එක නවත්තන්න. මෙයාල අපේ ලෝකෙ කොනක ඉඳන් විනාශ කරගෙන යන ගමන් සින්දු දාල දෙන්නෙ අපිව සැහැල්ලුවෙන් තියන්න වෙන් ඇති.'' ජෙසිකා පැවසුවා ය. එහෙත් කිසිවෙකුත් පිළිතුරක් නොදුන් බැවින් ඇය ම නැවතත් හඬ අවදි කළා ය.

''දූන් ඉතින් කරන්න ඉතුරුවෙලා තියෙන්නෙ කෙවින් කියපු දේ විතරයි. මෙයාලත් එක්ක එකතු වෙලා එයාල කියන විදියට වැඩකටයුතු කරගෙන ඉන්න තමයි තියෙන්නෙ.'' පැවසූ ඇය කෙවින් දෙස බලා ඉඟි කළා ය. ඇය පැවසූ අදහස තේරුම් ගත් හෙයින්දෝ කෙවින් ද හිස සලා එය අනුමත කළේ ය. කෘතිම බුද්ධිමය ජීවීන් හා එක් වී පසුව ඔවුන් භේද භින්න කිරීමේ අදහස ඇතිව ඈ එසේ කීවා විය හැකි ය. බිත්තිවලට ද කන් ඇත. දූන් සේෆ් මූඩ් එක ඉවත් වී ඇති බැවින් ඔවුන් පවසන සෑම දෙයක් ම කෘතිම බුද්ධිමය ජීවීන්ගේ සවනට වැටීමේ අවදානමක් තිබේ. එබැවින් කතා බහ කිරීමත් ඉතා ආරක්ෂාකාරීව සිදු කළ යුතු ය.

''දූන් ඉතින් මොනව කරන්න ද? ඔන්න ඔහෙ දෙන දෙයක් කාල වෙන දෙයක් බලාගෙන ඉදිමු. '' කෙවින් පැවසුවේ යී' එහෙත් රාම් සිටියේ නොඉවසිල්ලෙනි. ඔහු *CCTV* කැමරා වලට හසු නොවන මුල්ලකට ගොස් හිඳ ගත්තේ ය. අනතුරුව *SEC* කේතය ලියා ගත් කොලය දිග හැර ඒ දෙස බලමින් සිටියේ ය. කෙවින් ඔහු දෙස බලා හිස සැලුවේ ඔහු කරමින් සිටිනුයේ කුමක් දැයි කියා විය යුතුය. එහෙත් රාම් හිස සැලීමෙන් ම පිළිතුරු දුන්නේ විශේෂ කිසිවක් නොමැති බවය.

පැය භාගයක් පමණ කාලයක් නොදැනීම ගත වී ගියේ ය. රාම් ධ්‍යානයකට සම වැදුනාක් මෙන් *SEC* කෝඩ් එක දෙස බලමින් සිටියෝ ය. එක්වරම කිසිවක් මතක් වූවා මෙන් නැගිට කෙවින් හා ජෙසිකා සිටි දෙසට පැමිණියෝ ය.

''කෙවින්, ජෙසිකා .....'' රාම් දෙදෙනාගේ ම අත් වලින් අල්ලා ගනිමින් ඔවුන්ට ආමන්ත්‍රණය කලේ කලකට පසු හමු වූ මිතුරෙකු ලෙස ය.

''තව එක දෙයක් තියනවා අපිට උත්සාහ කරල බලන්න. මම ඒකත් කරල බලන්නම්.'' ඔහු රහසින් පැවසුවේ ය.

''මොනවද ඔයා කරන්න හදන්නෙ ? අපි මොනවද කරන්න ඕනි.?'' ජෙසිකා විමසුවා ය.

''බලාගෙන ඉන්නකෝ'' පැවසූ රාම් අසල තිබූ ගිනි නිවන උපකරණයක් දෑතින් ම ඔසවා ගත්තේ ය. වහා ජනේලය අසලට ගිය ඔහු ගිනි නිවන උපකරණයේ යකඩ බඳෙන් ජනේලයේ වීදුරුවට තදින් පහර දුන්නේ ය.

''රාම් .... ඔය මොකද කරන්නෙ. ? උන් අපිව මරාවි.'' කෙවින්ගේ කෑ ගැසීම අතරතුර පහර පිට පහර වැදුණු වීදුරුව පුපුරා ඇද හැලුනි. කෙවින් සරසුණේ රාම් සිටි තැනට යාමට ය. එහෙත් රාම් කෙවින්ට වඩා ඉක්මන් විය.

''සුභ අනාගතයක් යාලුවනේ.'' සුණුවිසුණු වී ගිය වීදුරුව තුලින් රාම් එලියට පැන්නේ ය. තට්ටු තුනක් පහලට වැටුණු ඔහුගේ සිරුර කැබලි වලට විසිරී ගියේ ය. කෙවින් හෝ ජෙසිකා ජීවිතයේ කිසිම දිනක මෙවැනි භයානක අත්දැකීමකට මුහුණ දී තිබුණේ නැත. හුස්ම හිර වී මිය යාම හා ඩ්‍රෝන යාත්‍රා වලින් වෙඩි වැදී මිය යාම කෙසේ වෙතත් එකට ම සිටි සහෘදයකු ජනේලයකින් පැන සියදිවි නසා ගැනීම කෙතරම් ශෝකජනක සිද්ධියක් ද?''

වහාම ජනේලය අසලට දිව ගිය දෙදෙනා සුන් බුන් බවට පත් වූ සිය සගයා දෙස බලමින් කඳුලු හෙලීමට පටන් ගත්හ. ඒ දෙස බලා සිටීමට අපහසු වූ ජෙසිකා තනිවම බිම වාඩි වී හැඬුවාය. කෘතිම බුද්ධිමය ජීවීන්ට එරෙහිව සටන් කිරීමට සැරසී සිටි සිය මිතුරාට එක්වරම සිදු වුණේ කුමක් දැයි ඔවුන්ට කිසිසේත්ම සිතාගත නොහැකි විය. සටන් කොට මිය යාම වෙනුවට රාම් සියදිවි නසාගෙන මිය යාමට තීරණය කළේ ඇයි ?

රාම් සිටි තැනට නුදුරින් කොල කැබැල්ලක් බිම වැටී තිබෙනු දුටු කෙවින් එය අහුලා ගත්තේ ය. එය ඔවුන් විසින් *SEC* කේතය ලියා තිබූ කඩදාසි කැබැල්ල විය. රාම් විසින් එහි පිටුවෙහි කිසියම් සටහනක් යොදා තිබෙනු දුටු කෙවින් වහා කඩදාසි කොලය අනෙක් පැත්ත හරවා පිරික්සා බැලුවේ ය. රාම් සියදිවි නසා ගැනීමට හේතුපාදක වූ කරුණ එහි ඇති බවට කෙවින් සැක කළේ ය.

''කෙවින්, ජෙසිකා, මේක තමයි මට කරන්න පුළුවන් අන්තිම උත්සාහය. මට මුලින්ම හිතුනා කෘතිම බුද්ධිමය ජීවීන් අද උදේ පද්ධතිය ආක්‍රමණය කරනකොට එයාලගෙ ආරක්ෂාවට ෆයර් වෝල් එකක් දාන්න ඇති කියලා. ඒ වගේ ෆයර් වෝල් එකක් දැම්මම අපිට කිසිම කෝඩ් එකක් රන් කරන්නවත් පද්ධතියෙ කිසිම දෙයක් කරන්නවත් බෑ. ඉතින් මම මේ වගේ උපක්‍රමයක් යෙදුවා. අපි කවුරුහරි මැරුණම එයාගෙ ප්‍රොෆයිල් එක මැරුණු කෙනෙකුගේ ප්‍රොෆයිල් එකක් විදියට නම් කිරීමක් සිද්ධ වෙනවනේ. ඒක පද්ධතියෙන් ඉබේම වෙන දෙයක්.''

''එතන දී ගේ ශරීරය ගැන අවසාන තත්ත්ව වාර්තාවක් පිළියෙල වෙනවා. ඒ වාර්තාව පදනම් කරගෙන තමයි මගේ ප්‍රොෆයිල් එක මැරුණු කෙනෙකුගේ විදියට නම් කිරීම සිද්ධ වෙන්නේ.''

''ඔය කියන වාර්තාව සකස් වෙන්නෙ පද්ධතිය විසින් අන්තිමට මාව සංවේදනය කරපු තැන ඉඳලා. ඒ කියන්නෙ මාව දකපු *CCTV* කැමරා දත්තය, මගේ හඬ අහපු මයික්‍රෆෝන දත්තය හරි මගේ තරංග දැණුනු සෙන්සර් එකේ දත්ත පදනම් කරගෙන. ඒකට කියන්නෙ *Last Contact Point* නැත්නම් අවසාන සන්නිවේදන ලක්ෂ්‍යය කියලා.''

''මම මගේ පරිගණකයේ ව්‍යාජ අවසන් සන්නිවේදන ලක්ෂ්‍යයක් *LCP* ෆයිල් එකක් හැදුවා. ඒ ෆයිල් එක තත්පරෙන් තත්පරේට එයාගෙ වෙලාව වෙනස් කරගන්නවා. මම මැරුණට පස්සේ පද්ධතිය තේරුම් ගන්නවනේ මම මැරිලා කියලා. එතකොට මගේ ප්‍රොෆයිල් එක මැරුණු කෙනෙකුගේ එකක් විදියට නම් කරන්න පද්ධතිය *LCP* ෆයිල් එක හොයනවා. මගේ ඇත්තම *LCP* ෆයිල් එක මොකක් වුණත් පද්ධතිය ගන්නෙ මගේ සේවා පරිගණකයේ තියන ව්‍යාජ *LCP* ෆයිල් එක.''

''මෙහෙම කියමු. මම ජනේලයෙන් පැනල මැරුණම මම මැරෙන තත්පරයෙදි මාව දකින *CCTV* කැමරා දත්ත ෆයිල් එක තමයි නිවැරදි *LCP* ෆයිල් එක. ඒත් ඒ අතරෙ මම හදපු ව්‍යාජ *LCP* ෆයිල් එක කියනවා නෑ මම තමයි රාම් මැරෙන වෙලාවෙ අන්තිමට දැක්කෙ කියලා. එතකොට පද්ධතිය මගේ ව්‍යාජ *LCP* ෆයිල් එක අප්ලෝඩ් කරගන්නවා.''

''මේක හරියට අර ට්‍රෝජන් අශ්වයාගේ කතාව වගේ. පද්ධතිය *LCP* ෆයිල් එක කියල ඇතුලට ගන්නෙ මගේ ව්‍යාජ *LCP* ෆයිල් එක ඇතුලෙ *SEC* එක හංගලා තියනවා. පද්ධතිය මාව මැරුණු කෙනෙක් විදියට නම් කරන්න ඒ ව්‍යාජ *LCP* ෆයිල් එක විවෘත කරන කොට *SEC* එක රන් වෙන්න ගන්නවා. ඊට පස්සෙ අපි හොයාගත්ත *SEC* එක නිවැරදි නම් දෙකන් එකක් වේවි.''

''මේ ප්‍රොසෙස් එක වෙන්න විනාඩි දහයක් දොලහක් විතර යයි කියලා මම හිතනවා. ඒ ටික වෙලාව නොමැරී ඉන්න ඔයාලට ශක්තිය ධෛර්යය හා වාසනාව ලැබෙන්න කියලා මම ප්‍රාර්ථනා කරනවා. මෙයට ආදරණීය රාම්''

''මිනිහ නම් යකෙක්. සියදිවි නසාගන්න කොහොම හිත ධෛර්ය කරගත්ත ද දන්නෙ නැහැ.'' කෙවින් පැවසුවේ සිය මිතුරා පිළිබඳ හද පත්ලෙන් උපන් ශෝකය මුසු වූ ගෞරවයකිනි.

''එයා සමහරවිට මේක අපට කලින් කියන්න නැත්තෙ අපි එයාව නවත්තයි කියල වෙන්න ඇති.'' ජෙසිකා ද ඌණ පූර්ණය කළා ය. ඒ වන විට විනාඩි ගණනක් ගතව තිබුණි.

කෙවින් සුණු විසුණු වූ ජනේලය අසලට පැමිණ අවසන් ගමන් ගිය සිය මිතුරා දෙස නැවත වරක් ශෝකී දෑසින් නෙත් හෙළුවේ ය. කෘතිම බුද්ධිමය ජීවියාගේ කෝපයට හසු වූ බොහෝදෙනා ඔවුන්ගෙන් බේරීම සඳහා ජනේල වලින් බැසීමට ගොස් ජීවිත හානි කරගෙන ඇති අන්දම ඔහුට පෙනුණි. මිසයිල ප්‍රහාර වලට ලක්වීමෙන් නගරයේ තැන තැන දුම් වලාවන් දක්නට ලැබුණි.

එක් වරම සියුම් බීප් බීප් නාදයක් හට ගත්තේ ය. එය නිකුත් වනුයේ කොහෙන් දැයි සිතා ගැනීමට නොහැකි වූ තරමට විසිරී ගොස් තිබුණි. නැතිනම් සෑම අතකින්ම එම බීප් නාදය නිකුත් වීමට පටන් ගෙන තිබුණි.

ගොඩනැගිල්ලේ විදුලි ආලෝකය නිවී ගිය අතර වායු සමීකරණය ද නැවතුනි. කවුළුවෙන් පිටත බැලූ ජෙසිකාට දැක ගත හැකි වූයේ ගුවනේ සැරිසරමින් තිබූ නියමුවන් රහිත ඩ්‍රෝන යාත්‍රා එකින් එක කඩා වැටෙන ආකාරයයි.

රාම් බලාපොරොත්තු වූ පෙලහර සිදුවෙමින් පවතින බව දැනුණු ජෙසිකාට මෙන්ම කෙවින්ට ද ඇති වූයේ වදනින් කියා නිම කල නොහැකි තරම් සතුටකි.

කිසිම අයුරකින් නැවත පණගැන්විය නොහැකි ආකාරයට අකර්මන්‍ය වී ගිය පරිගණක පද්ධතිය දෙස බලමින් ඔවුහු සතුටු කඳුළු හෙලූහ. එකිනෙකා තදින් වැලඳගෙන ජයග්‍රහනයේ සතුට නිහතමානීව විඳගත් ඔවුන්ට සිය වීරයා වූ රාම් නොමැති අඩුව තදින් ම දැනුණි. ලෝකයක් බේරා ගනිමින් වීරයා මිය ගොස් තිබුණි.

# නැවතත් වර්තමානයට

සීයා තවත් බෙලිමල් උගුරක් පානය කොට කෝප්පය පසෙකින් තැබුවේ ය. අනතුරුව ඔහුගේ රැවුලේ තැවරී තිබූ බෙලිමල් වතුර වම් අතේ මහපට ඇඟිල්ලෙන් පිසදා හැරියේ ය. කතාවේ ඉතිරිය දැන ගැනීමට කුඩා දරුවා තවදුරටත් සීයාගේ මුහුණ දෙසම බලා සිටියේ ය.

''ඉතින් ඉතින් සීයේ, ඊට පස්සෙ මොකද වුණේ කියන්නකෝ'' ඔහු විමසුවේ ය.

''ඉතින් පුතේ, ඒ නපුරන්ගෙන් මේ ලෝකෙ බේරගත්තට පස්සෙ අපිට ගොඩක් ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිද්ධ වුණා.''

''අපි දන්න කියන ගොඩක් අය ජීවතුන් අතර හිටියෙ නෑ. ලෝකෙ ජීවත් වුණු මිනිස්සුන්ගෙන් පහෙන් හතරක් විතර ඒ කෘතීම බුද්ධිමය ජීවීන්ගෙ ආක්‍රමණයට ගොදුරු වෙලා මැරුණා. ආහාර පාන, ඉඳුම් හිටුම්, බේත් හේත් වගේ ගොඩක් ප්‍රශ්න අපට තිබුණා. අපට තිබුණු ලොකුම බය වුණේ ඒ නපුරු උදවිය ආපහු ඒවිද කියන එක. අපි කට්ටිය එකතු වෙලා ලෝකෙ තිබුණු සියලුම පරිගණක උපකරණ විනාශ කරල දැම්මා. ඒ වගේ විනාශයක් ආයෙමත් මේ ලෝකෙට ඇති නොවෙන්න.''

''ඉතුරු වෙලා තිබුණු සම්පත් වලින් අපි ප්‍රයෝජන ගත්තා වගේම පරිගණක භාවිතා නොකර හැම දේම කරන්න අපි හිත හදාගත්තා. මේ ලෝකෙ තිබුණු සියලුම පරිගණක විනාශ කරන දැම්මට පස්සෙ ඒ ගැන කතා කරන්නවත් අපේ අය කැමති වුණේ නෑ.''

''පරිගණක, තට්ටු ගෙවල්, යන්ත්‍ර සූත්‍ර, මේ හැම දේකින්ම අයින් වෙලා අපි ආයෙමත් අපේ මුතුන් මිත්තො ජීවත් වුණු කෘෂිකාර්මික දිවි පෙවෙතකට හුරු වුණා. හරියටම කිව්වොත් අපි අද ඉන්නෙ මිනිස්සු මීට අවුරුදු දෙසීයකට කලින් හිටපු ලෝකයක. අපි අද ගත කරන්නෙ මීට අවුරුදු දෙසීයකට කලින් අපේ මුතුන් මිත්තෝ ගත කරපු ජීවිතේ. අපි මේ සංස්කෘතියට හුරු වුණාම තමයි අපට තේරුණේ අපි පහසුකම් කියල හඳුන්ව ගත්ත ඊනියා විද්‍යාව හා තාක්‍ෂණය නැති වුණාට අපිට කොච්චර සතුටින් ඉන්න පුළුවන්ද කියලා.''

සීයා කුඩා දරුවාට පැහැදිලි කළේ ය.